
දෙසතිය
පුවත් සඟරාව
2024 ජුනි
33214B
SRI LANKA
33214B
ආර්ථික පරිවර්තනයේ
හැරවුම් ලක්ෂ්‍යය
පිටුව 12
නව නීති පද්ධතියක් සමග
නව දේශපාලන සංස්කෘතියක්



# අලුත් මිනිස් වාසය

එංගලන්තයේ වෝරික් විශ්වවිද්‍යාලයේ විද්‍යාඥයන් පිරිසක් යුරෝපීය අභ්‍යවකාශ ඒජන්සිය සහ නාසා ආයතනවල පර්යේෂකයන් සමග සිදු කළ පර්යේෂණයක ප්‍රතිඵලයක් ලෙස පෘථිවියට සමාන ග්‍රහලෝකයක් සොයාගෙන තිබේ. එය නම් කර ඇත්තේ Gliese 12 b යනුවෙනි. Gliese 12 b ග්‍රහලෝකයේ පැවැත්ම, එහි විශාලත්වය, උෂ්ණත්වය හා පෘථිවියේ සිට ඇති දුර තහවුරු කිරීමට නාසා ආයතනයේ සහ යුරෝපීය අභ්‍යවකාශ ඒජන්සියේ චන්ද්‍රිකා දත්ත යොදාගෙන තිබේ.

පර්යේෂණවලින් අනාවරණය වී ඇත්තේ 2022 වසරේදී එක්සත් රාජධානියේ පැවැති උණුසුමට සමාන තත්ත්වයක් ඇති බවත් මිනිස් වාසයට සුදුසු ග්‍රහලෝක කිහිපය අතරට Gliese 12 b අයත් වන බවත් ය. ග්‍රහලෝකයේ මතුපිට උෂ්ණත්වය සෙල්සියස් අංශක 42ක් බවට ඇස්තමේන්තු කර ඇතත් එහි වායුගෙ ්ලය කෙබඳු තත්ත්වයක පවතිනවාද යන්න අවිනිශ්චිත ය. විද්‍යාඥයන්ගේ මතය වන්නේ මේ ග්‍රහලෝකය පෘථිවියේ සිට ආලෝක වර්ෂ 40ක දුරින් පිහිටීම හේතුවෙන් එය සමීප ව නිරීක්ෂණයට බාධා වී ඇති බව ය. මීන රාශියේ පිහිටා ඇති Gliese 12 b සෑම දින 12.8ට වරක් සූර්යයා වටා කක්ෂගත වේ. පෘථිවියට සූර්යයාගෙන් ලැබෙන ශක්තිය මෙන් 1.6 ගුණයක ශක්තියක් Gliese 12 b ග්‍රහලෝකයට එහි තාරකාවෙන් ලැබෙන බව තහවුරු කර තිබේ. වොරික් විශ්වවිද්‍යාලයේ ආචාර්ය තෝමස් විල්සන්ගේ කරුණු දැක්වීමට අනුව වර්තමානයේදී ග්‍රහලෝකයේ දක්නට ලැබෙන ආලෝකය 1984 වර්ෂයේ නිකුත් වූවක් වන අතර එය පෘථිවිවාසීන් කරා පැමිණීමට වසර 40ක කාලයක් ගත ව තිබේ.

**රංගිකා අබේසේකර**

# දෙසතිය
පුවත් සඟරාව

වෙළුම 46, කලාපය 06,
2024 ජුනි

**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,**
163, කිරුළපන ඇවනිව්,
පොල්හේන්ගොඩ, කොළඹ 05.

**සංස්කාරක මණ්ඩලය**
දු. අ. 011 - 2513757 / 0112 - 513153
Email - desathiya@gmail.com
බෙදාහැරීමේ අංශය
දු. අ. 011 - 2514150

උපදේශක සංස්කාරක
**දිනිත් චින්තක කරුණාරත්න**
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්

අංශ ප්‍රධානී - දෙසතිය
**ඩබ්. එම්. ශාන්තප්‍රිය**

සංස්කාරක
**මාලා මල්කාන්ති පරණගමගේ**

රූ රටා සංස්කාරක
**සංජීව පෙත්තාවඩු**

විශේෂාංග ලේඛකයන්
**රංගිකා අබේසේකර**

ප්‍රවෘත්ති නිලධාරි
**නිල්මිණි ප්‍රනාන්දු**

ඡායාරූප
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඡායාරූප අංශය**

බෙදාහැරීම් සම්බන්ධීකරණය
**ඉරේෂා අබේනායක**

මුද්‍රණය
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**

ප්‍රකාශනය හා බෙදාහැරීම
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

**හිතවත් පාඨකයිනි,**

46 වසරක් ඔබ වෙත දැනුම ලබාදුන් 'දෙසතිය' පුවත් සඟරාව වෙත පාඨක ඔබගේ අදහස් කෙටියෙන් ලියා තැපැල් ලිපිනයට හෝ විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ යොමු කරන්න

**සංස්කාරක**

මෙහි පළ වන ඇතැම් ඡායාරූප අන්තර්ජාලයෙන් ලබාගත් ඒවා වන අතර ඒවායේ අයිතිය මුල් හිමිකරු සතු යි.

## කවරයේ කතාව



19
ආර්ථික පරිවර්තනයේ හැරවුම් ලක්ෂ්‍යය



15
රයිසිගේ අවසන් ගමන



35
ඒ සිංහබාහු, මේ සිංහබාහු හා සිංහබාහු



40
වනිතා විස්කම්



03
කාන්තාවන්ට අත නොතබනු




08
රටේ හදා වටේ යැවීම

2024 දෙසතිය මැයි කලාපයේ "අනුන් නොදැක තමන් දකිමු" මැයෙන් පළ වූ ලිපියේ ලේඛක නිශාන්ත පීරිස්ගේ නම සඳහන් නොවීම පිළිබඳ කනගාටුව පළ කරමු.

# දෙසතිය
පුවත් සඟරාව

**ඔබ ළඟට ම ගෙන්වා ගන්න. පහත කූපනය පුරවා අප වෙත එවන්න.**

දෙසතිය

සඟරා ලැබිය යුතු නම හා ලිපිනය (ඉංග්‍රීසි භාෂාවෙන්)

Name ..............................................

Address ..............................................

..............................................

..............................................

..............................................

..............................................

ID Number .............................. Tel / Mobile ..............................

Signature .............................. Date..............................

දෙසතිය සඟරා දායකත්වය

දෙසතිය සඟරා දායකත්වය වාර්ෂික / අර්ධ වාර්ෂික ලාබා ගැනීමට කැමැත්තෙමි. ඒ සඳහා රු. 3,000.00/ රු. 1,500.00 වටිනාකමකින් යුත් අංකය.............................. හා .............................. දින දරන චෙක්පත / මුදල් ඇණවුම එවමි.

චෙක්පත්/ මුදල් ඇණවුම් "ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්" නමට ලියා, තැපැල් කාර්යාලය, කම්කරු මහ ලේකම් කාර්යාලය, නාරාහේන්පිට ලෙස සඳහන් කර කූපනයද පුරවා මෙම ලිපිනයට එවන්න.

දෙසතිය, බෙදාහැරීම් කළමනාකරු, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, 163, පොල්හේන්ගොඩ, කොළඹ 05

# අසාධාරණය සාධාරණයට අසාධාරණය

වැටුප් වැඩිවීම ඇතුළු ඉල්ලීම් කිහිපයක් මුල්කර ගනිමින් විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩල වර්ජනයේ යෙදී මාසයක් ඉක්ම ගොසිනි. මේ වෘත්තීය ක්‍රියාමාර්ගය නිසා රුපියල් මිලියන 150ක පමණ සෘජු මූල්‍ය පාඩුවක් සහ මිනිස් කාලය අනුව මිලියන 1.8ක අපතේ යාමක් සිදු ව ඇති බව නොබෝදා ප්‍රවෘත්ති සාකච්ඡාවකට එක්වෙමින් උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන් මහතා අනාවරණය කළේ එම ඉල්ලීම් ඉටු කිරීමට ඉදිරි මාස හය සඳහා රුපියල් බිලියන 1.1ක් අවශ්‍ය බව ද සඳහන් කරමිනි. මෙයින් පෙනී යන්නේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ මතු ව ඇති මේ අර්බුදය සමස්තයක් ලෙස රටේ ආර්ථිකයට සෘජු ලෙසත් සමාජ සංවර්ධනයට දිගුකාලීනවත් එල්ල කරන බලපෑම සුළුපටු නොවන බවයි.

උසස් පෙළ කඩඉම ජයගෙන විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන ශිෂ්‍ය ප්‍රජාවගේ අපේක්ෂාව වන්නේ වසර 3-4කින් උපාධිය ලබා ඉන් පිට ව වෘත්තීය ලෝකයට පිවිසීම ය. ඒ, සිය ආර්ථිකය ශක්තිමත් කර ගනිමින් සාර්ථක සමාජ ජීවිතයකට ඇවැසි පදනම සකසා ගැනීමටයි. එහෙත් විශ්වවිද්‍යාලවල මෙවැනි වර්ජන සංස්කෘතියක් පවතින විට වන්නේ සිසුන්ගේ ඉගෙනුම් මානසිකත්වය බිඳ වැටීම පමණක් නොව තාරුණ්‍යයේ සිහින බිඳ වැටීම නිසා සමාජීය ගැටලු රාශියක් ද පැන නැගීමයි. සිසුන්ගේ දෙමව්පියන් ද මෙවැනි පසුබිමක තම දරුවන්ගේ අනාගතය ගැන සිත්තැවුලට පත් වීම වැළැක්විය නොහැකි කරුණකි.

තේරී පත් වන ඇතැම් සිසුහු විශ්වවිද්‍යාලයට ඇතුළත් වීම කල්ගතවත් ම පෞද්ගලික විශ්වවිද්‍යාල කරා යාම වැනි විකල්ප තෝරා ගනිති. එසේ කළ නොහැකි පිරිස් අධ්‍යාපනය අත්හැර දැමීමට, රැකියා අවස්ථා සොයා යාමට පෙළඹෙන අතර ඇතැම් සිසුන් අපේක්ෂාභංගත්වය මත සමාජයේ අතරමං වන අවස්ථා ද දක්නට ලැබේ. එලෙස උසස් අධ්‍යාපය අහිමි වීමෙන් සිසුන්ට වන අසාධාරණයට හා සමාජීය බලපෑමට වගකිව යුත්තේ කවුරුන් ද?

විටෙක අධ්‍යයන මෙන් ම අනධ්‍යයන වර්ජන ඇති වීම ඔස්සේ විශ්වවිද්‍යාලයීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය බිඳවැටීම කියාපාන්නේ අනාගත විශ්වවිද්‍යාල අධ්‍යාපනයට ප්‍රවේශ වන ශිෂ්‍ය ප්‍රජාවට යහපත් පණිවිඩයක් නොවේ. එවිට මෙරට විශ්වවිද්‍යාලවලට තම දරුවන් ඇතුළත් කිරීම පිළිබඳ දෙමව්පියන් දෙවරක් සිතා බලනවාට සැකයක් නැත. අධ්‍යාපනයට සුදුසු පරිසරයක් විශ්වවිද්‍යාලවල තිබිය යුතු ය. එසේ නොමැති විට දෙමව්පියන් තම දරුවන් පිටරට විශ්වවිද්‍යාලවලට ඇතුළත් කිරීමට දරන උත්සාහයට එරෙහි වීමට කිසිවකුට ඉඩක් නොලැබෙනු ඇත. එය වක්‍රාකාර ව බලපානු ඇත්තේ ද මෙරට ආර්ථිකයට ය.

සැබවින් ම ඕනෑ ම වෘත්තියක නියැළෙන්නකුට තම වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමට අයිතියක් ඇත. ඒ, තවත් පාර්ශ්වයකට හානියක් නොවන පරිදි ය. එහෙත් වත්මන් වර්ජන මතු වන්නේ එවැනි හානියක්, බලපෑමක් කළ හැකි පාර්ශ්වය ඉලක්ක කර ගනිමින් වීම ඛේදවාචකයකි. වර්ජකයන් සිතන්නේ තම වෘත්තීය අයිතීන් සාර්ථක ව දිනා ගත හැක්කේ එලෙස තවත් පාර්ශ්වයක් අපහසුතාවට පත් කිරීමෙන් මිස සාධාරණ ක්‍රමයකට නොවන බව ය. එය අතීතයේ, වර්තමානයේ සිදු වුව ද අනාගතයේ සිදු නොවිය යුත්තකි.

මේ නිසා කිවයුතු වන්නේ ඕනෑ ම වෘත්තීය කණ්ඩායමක් සිය වෘත්තීය අයිතිවාසිකම් දිනා ගැනීමට පෙළ ගැසිය යුත්තේ බලපෑම්කාරී පාර්ශ්වවලට ද අසාධාරණයක් නොවන අකාරයට බව ය.

මාලා මල්කාන්ති පරණමානගේ

- සංස්කාරක -



# කාන්තාවන්ට අත නොතබනු

මහේෂානි මීගහපොල

බස් රථ ඇතුළු පොදු ප්‍රවාහන සේවයේදී කාන්තාවන්ට සහ ළමයින්ට සිදුවන ලිංගික හිංසන පිළිබඳ නිරන්තරයෙන් වාර්තා වුවත් ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනෙන්නේ නැති තරම් ය. මෙවැනි ඕනෑ ම ආකාරයේ ක්‍රියා සමාජයේ නොසලකා හරින පසුබිමක මේ සම්බන්ධ පැමිණිලි වාර්තා නොවේ. එහෙත් දෛනික ව පොලිස් ස්ථානවලට ලැබෙන වාර්තා සැලකිල්ලට ගනිමින් මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන්ගේ උපදෙස් පරිදි ලිංගික හිංසන මැඩ පැවැත්වීමේ දීප ව්‍යාප්ත මෙහෙයුමක් පෙබරවාරි මස 07 දින සිට ඇරඹුණේ එය යාවත්කාලීන ගැටලුවක් වන තරමට සමාජයේ කතාබහක් ගොඩනැගෙමින් පවතින පසුබිමක ය.

මහජනතාව වැඩි වශයෙන් පොදු ප්‍රවාහන සේවා භාවිත කරන පෙරවරු 08.00-10.00 දක්වාත් පස්වරු 5.00-7.00 දක්වාත් කාලයේදී වැඩි ප්‍රමුඛතාවක් ලැබෙන මේ මෙහෙයුමේදී සිවිල් ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරීන් කණ්ඩායම බැගින් බස්රථවල ගමන් කරවීමට පියවර ගැනෙන අතර මහජනතාව වැඩි වශයෙන් ගැවසෙන වීදි, බස් නැවතුම්, දුම්රිය ස්ථාන වෙත විශේෂ අවධානය යොමු කර ඇත. පොලිස් මූලස්ථානය සඳහන් කරන්නේ මේ මෙහෙයුම සිදුකරන කාල සීමාවේදී නිල ඇඳුමින් සැරසුණු පොලිස් නිලධාරී කණ්ඩායම් ද විශේෂයෙන් ප්‍රධාන මාර්ග ආවරණය වන පරිදි සිවිල් ඇඳුමින් ගමන් ගන්නා නිලධාරීන්ට සහයක් අවශ්‍ය වූ විට නොපමා ව සහය ලබා දීමට හැකි වන පරිදි සූදානම් කර තැබෙන බව ය. හිංසන සම්බන්ධ මෙවැනි ගැටලු මතු වූ විට ඒ වෙනුවෙන් ම 109 ක්ෂණික දුරකතන අංකයක් ද ලබා දී තිබේ. එම දුරකතන ඇමතීම සිදු කරන්නේ කාන්තාවන් ම ය.

අතවරයක් ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව ඕනෑ ම ස්ථානයකදී සිදුවිය හැකි බව පවසන නියෝජ්‍ය පොලිස්පති (ළමා හා කාන්තා අපයෝජන/ විමර්ශන හා විමර්ශන දිසාව භාර) රේණුකා ජයසුන්දර සඳහන් කරන්නේ දණ්ඩනීති සංග්‍රහයෙහි 345 වගන්තිය යටතේ ක්‍රියාවකින්, වචනයකින් ලිංගිකත්වය අරඹයා කෙරෙන අඩත්තේට්ටමක් නිසා යම් අපහසුතාවක්, අප්‍රසන්නතාවක්, ලැජ්ජාවක්, බියක් ඇති වේ නම් 'ලිංගික අතවර' යන වරද සම්පූර්ණ වන බව ය. එය අවුරුදු 05 දක්වා සිර දඬුවම් නියම කළ හැකි වරදකි.

එකිනෙකාට ගෞරව කිරීම්, වටහා ගැනීම්, සමාව ඉල්ලීම් වැනි ධනාත්මක සිතුවිලිවලින් පොහොසත් සමාජ වටිනාකම් බොහෝ රටවල ප්‍රගුණ කරමින් තිබෙන පසුබිමක මෙවැනි සමාජ ගැටලු එම රටවල පැන නොනගී.

අදහස් දක්වන නියෝජ්‍ය පොලිස්පති (ළමා හා කාන්තා අපයෝජන/ විමර්ශන හා විමර්ශන දිසාව භාර) රේණුකා ජයසුන්දර; "ස්ත්‍රී දූෂණ යන වරද 'ලිංගික අතවර' යන වරදට වඩා වෙනස්. එය බරපතළ ලිංගික අපයෝජනයක්. 'ලිංගික අතවර' කාන්තාවකට ඕනෑ ම අවස්ථාවකදී සිදු වන්නට පුළුවන්. පොදු ප්‍රවාහනයේදී අනවශ්‍ය ලෙස අතපත ගෑම, වැරදි වචන භාවිතය බොහෝ විට දක්නට ලැබෙන තත්ත්වයක්. ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහනය සිදු වන්නේ මගී ආසන සංඛ්‍යාව අනුව නොවෙයි. ඒ නිසා මගීන් තෙරපෙන අවස්ථාවලදී මෙවැනි ක්‍රියා බොහෝ සෙයින් සිදු වන බව වාර්තා වනවා. මෙවැනි තත්ත්වයකදී බොහෝ විට අපහසුතාවට පත්වන්නේ කාන්තාවන් සහ ළමයි. එහෙත් ඔවුන් ඒ පිළිබඳ කතා කරන්න, විරුද්ධ ව නැගී සිටින්න, පැමිණිලි කරන්න ඉදිරිපත් වන අවස්ථා බොහොම අඩුයි. මේ ගැන කාන්තාවක් කතා කළත් ඇය තනිවන අවස්ථා දක්නට ලැබෙනවා."

මේ අනිසි ක්‍රියා නවත්වා ඔවුන් සුරක්ෂිත කිරීමේ අරමුණින් මේ වැඩපිළිවෙළ ආරම්භ කළත් පොදු ප්‍රවාහන සේවයේදී එය ආවරණ කිරීමේ හැකියාව අපහසු බව රේණුකා ජයසුන්දර අවධාරණය කරන කාරණයකි. එහෙත් තෝරා ගත් දිනවල, තෝරාගත් ස්ථානවලදී, තෝරාගත් මාර්ගවල මේ මෙහෙයුම ක්‍රියාවට නැංවීමෙන් මාසයක් ගතවීමෙන් වරදකරුවන් 32ක් අත්අඩංගුවට ගැනීමට පොලිසියට හැකියාව ලැබී ඇත.

මේ මෙහෙයුම සාර්ථක වන්නේ හිංසනයට ලක් වන්නා ඊට දක්වන දායකත්වය ද මත ය. නීතිය ක්‍රියාත්මක කිරීමේදී එය ඉතා වැදගත් ය. එසේ ම මගීන්ගෙන්, පොදු ප්‍රවාහන රියදුරන්ගෙන්, කොන්දොස්තරවරුන්ගෙන් ලැබෙන සහය ද විශේෂිත ය. සෑම සතියක ම අනිවාර්යෙන් දින 02ක් මේ සඳහා යොදවන ලෙස පොලිස්පතිවරයා උපදෙස් ලබා දී ඇත.

එකිනෙකාට ගෞරව කිරීම්, වටහා ගැනීම්, සමාව ඉල්ලීම් වැනි ධනාත්මක සිතුවිලිවලින් පොහොසත් සමාජ වටිනාකම් බොහෝ රටවල ප්‍රගුණ කරමින් තිබෙන පසුබිමක මෙවැනි සමාජ ගැටලු එම රටවල පැන නොනගී. මේ නිසා අතීතයේ තිබුණු සමාජ සංස්කෘතික වටිනාකම් නැවත පණ ගන්වා ශ්‍රී ලංකාවේ ද අපරාධවලින් තොර පරිසරයක් ඇති කිරීමට රජය ගන්නා මේ උත්සාහය සාධනීය පියවරක් ලෙස අගය කළ යුතු ය.

# රණවිරු උරුමයට කෘත ගුණ

නිරෝෂි දොඹගහගේ

ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී දිවි පිදූ, අතුරුදහන් වූ, රණක්ෂිතයට පත් වූ විශ්‍රාමික සහ දැනට සක්‍රිය සේවයේ යෙදී සිටින රණවිරුවන්ට පදිංචිය සඳහා රජයේ ඉඩම් ලබාදීමේ ප්‍රතිපත්තිය වඩාත් විධිමත් ව සිදු කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශයට නොබෝදා අනුමැතිය හිමි විය. ඒ අනුව ත්‍රිවිධ හමුදාවේ, ශ්‍රී ලංකා පොලිසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නියෝජනය කරන රණවිරුවන්ට ඉදිරියේදී සහන රැසක් සැලසෙන අතර එහිදී රණවිරුවන්ට සින්නක්කර ඉඩම් අයිතිය ලබා දීම සිදු වනු ඇත.

රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් රැක බලා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ක්‍රියාත්මක මෙය 2024 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් කෙරුණු පවුල් ලක්ෂ 20කට ඉඩම් හා ගොවිබිම්වල පූර්ණ පෞද්ගලික අයිතිය ලබාදීමේ "උරුමය" ජාතික වැඩසටහන අනුව ක්‍රියාවට නගන්නකි. රණවිරුවන් ලක්ෂයක පමණ පිරිසක් ද මීට අයත් වේ. ඒ අනුව දැනට ලබා දී ඇති අවසර පත්‍ර හා දීමනා පත්‍ර සම්බන්ධයෙන් පැන නැගී ඇති ආරවුල් විසඳමින්, ඒවා නිසි ආකාරයට මැනුම් කටයුතු සිදුකර 'උරුමය' නමින් ඔප්පු ලබා දීම මේ යටතේ සිදු කෙරේ. මේ වැඩසටහනෙහි මුඛ්‍ය පරමාර්ථය වන්නේ ජනතාවට තමන් සතු ඉඩම් සම්බන්ධයෙන් අභිමත පරිදි කටයුතු කිරීමේ හැකියාව හිමි කරදීම ය.

ශ්‍රී ලංකාවේ සමස්ත භූමි ප්‍රමාණය වන අක්කර ලක්ෂ 163 මූලික වශයෙන් රජයේ ඉඩම් සහ පෞද්ගලික ඉඩම් වශයෙන් ප්‍රධාන කොටස් දෙකකි. එයින් අක්කර ලක්ෂ 132ක් එනම් 82%ක් රජයේ ඉඩම් වන අතර ඒ අතරින් මහජනතාවගේ පරිභෝජනයට සුදුසු ඉඩම් පවතින්නේ අක්කර ලක්ෂ 47ක් (18%ක්) පමණි. අනෙකුත් භූමි ප්‍රදේශ මහජනතාවගේ පෞද්ගලික පරිභෝජනයට යොදා ගත නොහැකි ඇළ දොළ, ගංගා, මාර්ග, අභය භූමි, පූජා භූමි, වනාන්තර, රක්ෂිත, වෙරළ තීරය යනාදියෙන් සමන්විත ය. පරිභෝජනයට සුදුසු අක්කර ලක්ෂ 47ක භූමි ප්‍රමාණයෙන් අක්කර ලක්ෂ 40ක් පමණ පරිභෝජනය සඳහා යොදා ගැනෙන බවත් තවත් ඕනෑ ම කටයුත්තක් සඳහා යොදා ගැනීමට ඉතිරිවී තිබෙන්නේ තවත් අක්කර ලක්ෂ 7ක් පමණක් බවත් ඉඩම් කොමසාරිස් ජනරාල් බන්දුල ජයසිංහ ප්‍රකාශ කරයි.

රජය හා විදේශිකයන් සතු ව තිබූ විශාල පරිමාණයේ ඉඩම්, නැවත ගොවි ජනතාව වෙත පැවරීමේ අරමුණින් 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත හඳුන්වා දුන්නේ ය. එමගින් රජයේ ඉඩම් ගොවිතැන් සහ නේවාසික කටයුතු සඳහා ජනතාව වෙත නැවත ලබාදෙන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරිණි. ඉඩම් කොමසාරිස් ජනරාල් බන්දුල ජයසිංහ පවසන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි ප්‍රතිපාදන ප්‍රකාර ව අවසර පත්‍ර සහ දීමනාපත්‍ර ලෙස රජයේ ඉඩම් ජනතාවට ලබා දීමේ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන බව ය. අදහස් දක්වන ඔහු; " ඉඩම් සඳහා අවසර පත්‍ර ලබා දෙන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි 19(2) වගන්තිය යටතේ. ඒ, ප්‍රාදේශීය මට්ටමෙන් සුදුසු අය තෝරාගෙන නිත්‍යානුකූල ක්‍රමවේදයකට. වසරක් තුළ ඔවුන් ඉඩම සංවර්ධනය කළ යුතුයි. ඒ පිළිබඳ පරීක්ෂා කර බලා ඉන් අනතුරුවයි එම ඉඩම් සඳහා ඉඩම් සංවර්ධන ආඥා පනතෙහි 19(4) වගන්තිය යටතේ දීමනා පත්‍රයක් ඔවුන් වෙත ලබා දෙන්නේ.

> රණවිරුවන් හා ඔවුන්ගේ යැපෙන්නන් රැක බලා ගැනීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ක්‍රියාත්මක මෙය 2024 අයවැය යෝජනා යටතේ ඉදිරිපත් කෙරුණු පවුල් ලක්ෂ 20කට ඉඩම් හා ගොවිබිම්වල පූර්ණ පෞද්ගලික අයිතිය ලබාදීමේ "උරුමය" ජාතික වැඩසටහන අනුව ක්‍රියාවට නගන්නකි. රණවිරුවන් ලක්ෂයක පමණ පිරිසක් ද මීට අයත් වේ.

මෙලෙස විවිධ ආණ්ඩු යටතේ කලින් කලට ස්වර්ණ භූමි, රත්න භූමි, රන් භූමි, ඉසුරු භූමි, ජය භූමි වැනි විවිධ නම්වලින් ඉඩම් සඳහා දීමනා පත්‍ර ප්‍රදානය කෙරුණා." ඉඩම් සංවර්ධන ආඥා පනත හඳුන්වා දුන් 1935 වර්ෂය වන විට ඉඩම් සම්බන්ධ තීරණ ගැනීමේ බලය පවරා තිබුණේ දිසාපති වෙත ය.

ලබාදෙන දීමනාපත්‍ර සහ අවසර පත්‍ර සම්බන්ධයෙන් යම් යම් කොන්දේසි පනවා තිබේ. රණවිරුවන් වෙත ලබා දී ඇති දීමනාපත්‍ර සහ අවසර පත්‍ර සම්බන්ධයෙන් ද මෙවැනි කොන්දේසි බල පැවැත්වේ ඒ පිළිබඳ පැහැදිලි කරන ඉඩම් කොමසාරිස් ජනරාල් බන්දුල ජයසිංහ; " ඇතැම් විට අතුරු බෙදීම් කළ නොහැකි වීම, උකස් කර බැංකු ණය පහසුකම් ලබාගන්නේ නම් ප්‍රාදේශීය ලේකම්ගේ හෝ ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලබා ගත යුතු වීම, තවත් අයකුට බැහැර කළ නොහැකි වීම යනාදී විවිධ කොන්දේසි මේ ඉඩම් සම්බන්ධයෙන් පනවා තිබෙනවා. කෘෂිකාර්මික පදනම හෝ නේවාසික පදනම යටතේ බැහැර කර තිබෙන නිසා මේ ඉඩම් ආර්ථික සංවර්ධන කටයුත්තකට භාවිත කරන්නට නැහැ. රජය මගින් බැහැර කරන අවසර පත්‍ර හෝ දීමනා පත්‍ර සම්බන්ධයෙන් මෙලෙස කොන්දේසි පනවා තිබීම රටේ ආර්ථික සංකෝචනයකට හේතු වී තිබෙනවා."

1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත සහ 1947 අංක 8 දරන ඉඩම් ආඥා පනත යන පනත් දෙක ම මුල්කරගෙන රණවිරුවන් වෙත ඉඩම් බැහැර කිරීම සිදු කර තිබේ. ජනාධිපති කාර්යාලයේ කෘෂිකර්ම ඵලදායිතා සහ

ඉඩම් අංශයේ ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම් චන්ද්‍රා හේරත් පවසන්නේ මේ වැඩසටහන රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ රණවිරුවන්ට සිදු කරන උපරිම කෘතගුණ සැලකීමක් ලෙසයි. ඇය; "ක්‍රියාන්විත සේවයේ යෙදී සිටි රණවිරුවන් වෙනුවෙන් රජයේ ඉඩම් ලබා දීමේදී සහන සැලසීමේ අපේක්ෂාවෙන් කාලානුරූපී ව පැවති ප්‍රතිපත්ති සංශෝධනය සඳහා වරින් වර අමාත්‍ය මණ්ඩල නිර්දේශ ඉදිරිපත් වී තිබෙනවා. එහෙත් හඳුන්වා දී ඇති ක්‍රමවේද ඔස්සේ හිමිවන සහනය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වූ නිසයි දැනට පවත්නා ක්‍රමවේදයෙහි ගැටලු ලෙස හඳුනා ගත් කාරණා සංශෝධනයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනුණේ. මේ සම්බන්ධයෙන් කමිටුවක් පත්කර තිබෙන්නේ ජනාධිපති ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන්. ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තමේන්තුවේ හා සිවිල් ආරක්ෂක බලකාය නියෝජනය කරන ප්‍රතිලාභී රණවිරුවන් සියලු දෙනා පිළිබඳ, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ විධිමත් ආකෘතියකින් තොරතුරු රැස් කිරීමට උපදෙස් ලබා දී තිබෙනවා."

මේ වැඩසටහන යටතේ ඔප්පු ලබාදීම සිදු කෙරෙනුයේ දීමනාපත්‍ර හෝ අවසර පත්‍ර ලබා දී ඇති රණවිරුවන්ට ය. අලුතින් ඉඩම් නිදහස් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ මෙතෙක් ලබා දී ඇති බලපත්‍ර සඳහා 'උරුමය' ඔප්පු ලබාදීමෙන් අනතුරු ව නැවත සමීක්ෂණයක් සිදු කිරීමෙනි.

රණවිරුවන්ට ඉඩම් ලබා දීමේදී සැලසෙන සහන රාශියකි. ලබා දී ඇති ඉඩම් මෙතෙක් සංවර්ධනය කිරීමට අපොහොසත් වී ඇති රණවිරුවන් සඳහා රජයේ ඉඩම් ආඥා පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර ව රුපියල් 100ක නාමමාත්‍ර බදු මුදලක් යටතේ විශේෂ බද්දක් ලබාදීම, යෝජිත සංවර්ධන කටයුතු සිදු කිරීමට හැකිවනු පිණිස ඉඩම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව අනුමත මූල්‍ය ආයතනයකින් මූල්‍ය පහසුකම් ලබා ගැනීමට ඉඩ සැලසීම, භූමියේ නොදියුණු තක්සේරු වටිනාකමින් 10%ක් අය කරමින් ලබාදෙන කොන්දේසි සහිත දීමනා පත්‍රය වෙනුවට රජයේ ඉඩම් ආඥා පනතේ 2 වැනි වගන්තිය හා 20 වැනි රෙගුලාසිය යටතේ නිදහස් දීමනාපත්‍ර ලබාදීම ඊට අයත් ය. ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ මධ්‍යම පාන්තික ගැනුම් මිල කාණ්ඩය යටතේ සුදුසුකම් ලබා ඇති රණවිරුවන් අදාළ ඉඩම් නේවාසික පදනමකින් සංවර්ධනය කර ඇත්නම් ඔවුන්ට රජයේ ඉඩම් ආඥා පනතේ 2 වැනි වගන්තිය හා 20 වැනි රෙගුලාසිය ප්‍රකාර ව නිදහස් දීමනා පත්‍ර ලබාදීම, රජයේ ඉඩම් ආඥා පනත යටතේ විශේෂයෙන් ම බදුකර ලබාගැනීම හා නිදහස් දීමනාපත්‍ර ලබා ගැනීමට නිකුත් කරන ලද මැනුම් නියෝගවලට අදාළ පිඹුරුපත් හා රේඛා චිත්‍ර ලබා ගැනීමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මැනුම් ගාස්තුවලින් නිදහස් කිරීම යන සහන ද මේ යටතේ සලසා දී ඇත. ඒ අනුව බදුකරයක් සඳහා ඔප්පුවක් ලබා දීමට අවශ්‍ය පිඹුරුපත සකස් කිරීමේදී මැනුම් ගාස්තුව මෙහිදී දරන්නේ රජයයි. නාමික බද්දක් යටතේ මෙලෙස බලපත්‍ර ලබාදීම මීට පෙර ක්‍රියාත්මක වූයේ මියගිය රණවිරුවන්ගේ යැපෙන්නන් සඳහා පමණකි. නව ක්‍රමවේදය යටතේ සියලු රණවිරුවන්ට මේ වරප්‍රසාදය හිමිවීම විශේෂත්වයකි.

අදහස් දක්වන ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා; "අප විසින් නිකුත් කිරීමට නියමිත චක්‍රලේඛය අනුව සියලු ම ප්‍රාදේශීය ලේකම්වරුන් විසින් තමන්ගේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල රණවිරුවන් සඳහා බදු පදනමින්, වගා පදනමින් හා නේවාසික පදනමින් කෙතරම් ඉඩම් ලබාදී තිබෙනවා ද?, එම ඉඩම්වල කෙතරම් පිරිසක් පදිංචි වී සිටිනවා ද? වැනි තොරතුරු එකතු කළ යුතුයි. ඉන් අනතුරුවයි එක් එක් කාණ්ඩවලට අයත් රණවිරුවන්ට 'උරුමය' ඔප්පු ලබා දෙන්නේ. අදාළ දැනුවත් කිරීමෙන් පසුව රණවිරුවන්ට හැකියාව තිබෙනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ගොස් 'උරුමය' ඒකකයට තමාගේ ඉඩම් ගැටලු ඉදිරිපත් කිරීමට."

චක්‍රලේඛය නිකුත් කිරීමේ සිට අදළ මාර්ගෝපදේශකත්වය ලබා දෙමින් මේ සඳහා සහය ලබා දෙන්නේ රේඛීය අමාත්‍යාංශය ලෙස සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයයි. එහි අතිරේක ලේකම් (ඉඩම්) දර්ශන වික්‍රමාරච්චි පවසන්නේ රජයේ ඉඩම් ආඥා පනත ප්‍රකාර ව රණවිරුවන්ට ඉඩම් සඳහා ඔප්පු පිරිනැමීමට අදාළ ක්‍රියාවලිය කඩිනමින් ඉටු කිරීමට සැලසුම් කර තිබෙන බව ය.

මේ වැඩසටහන යටතේ කොන්දේසි විරහිත ව රජය ලබාදෙන පරම ඉඩම් අයිතිය තම පවුලේ ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා මෙන් ම රටේ ආර්ථිකය දියුණුව වෙනුවෙන් උපයෝජනය කිරීමේ වගකීම ප්‍රතිලාභීන් සතු ය.



# ව්‍යවසායකත්ව සංවර්ධනයට නව ප්‍රවේශයක්

**එස්. එම්. ගමගේ**

ගාලු දිසා ප්‍රවර්ධා

ලෝක බැංකුව විසින් සකසන ලද ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ දර්ශකය (Ease of doing business index) අනුව රටක ආර්ථිකය 1 සිට 190 දක්වා ශ්‍රේණිගත කරයි. මේ නිර්ණායකය ඉහළ අගයක් ගැනීමෙන් අදහස් වන්නේ නියාමන පරිසරය, ව්‍යාපාර ක්‍රියාකාරිත්වයට අහිතකර බවයි. මෙහි ශ්‍රී ලංකාව පසු වන්නේ 99 වැනි ස්ථානයේ ය. එයින් පැහැදිලි වන්නේ මෙරට ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර (MSMEs) සංවර්ධනය සඳහා ව්‍යාපාරික පරිසරයේ පැහැදිලි වෙනසක් ඇති කළ යුතු බවකි. ඒ සඳහා රටේ ප්‍රතිපත්තිමය වශයෙන් වෙනස්කම් ඇති කළ යුතු බවකි. මෙහිදී, ව්‍යාපාර සංවර්ධනයට සෘජු ව හා වක්‍ර ව සම්බන්ධ වන රාජ්‍ය, පෞද්ගලික හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධ ප්‍රවේශයක් මත ක්‍රියා කිරීමේ අවශ්‍යතාව ඉස්මතු වේ.

ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනයේදී මේ පාරිසරික වෙනස්කම් සිදුකිරීම පමණක් ප්‍රමාණවත් නොවේ. මෙහිදී ව්‍යාපාරිකයා සතු දැනුම, කුසලතා සහ ආකල්ප ඉතා වැදගත් ය. ආකල්ප සංවර්ධනය, ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය මෙන් ම කළමනාකරණ හැකියාව වැඩිදියුණු කිරීම කළ යුතු ය.

මේ කාරණා පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයකින් පසු ගාල්ල දිස්ත්‍රික්කයේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධනය සඳහා නවමු ප්‍රවේශයක් හඳුන්වාදීමට ගාල්ල දිස්ත්‍රික් ලේකම් පියවර ගෙන ඇත. එම නවමු ප්‍රවේශය වන්නේ 'ව්‍යවසායක සභා' සංකල්පයයි. ව්‍යවසායක සභාව යනු ව්‍යවසායකත්ව සංවර්ධන සේවා සපයන නිලධාරීන් එක ම මේසයකට පැමිණ ව්‍යවසායකයන් මුහුණදෙන ගැටලු විසඳීම සඳහා සකස් කරන ලද ඒකාබද්ධ ප්‍රවේශයකි. මේ සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා මුලින් ම ස්ථාපිත කරන ලද්දේ ගාල්ල දිස්ත්‍රික් ව්‍යවසායක සභාවයි.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් විසඳිය නොහැකි ව්‍යවසායක ගැටලු විසඳීමට මැදිහත් වන අතර ම දිස්ත්‍රික් ව්‍යවසායක සභාව විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ගතයුතු තීරණ ජාතික තලයට ඉදිරිපත් කිරීම ද සිදු කරයි. මෙහිදී පැවැත්වෙන්නේ ජනාධිපති ලේකම් කාර්යාලය හා එක් ව සෑම මසක ම zoom තාක්ෂණය ඔස්සේ හවුල්කාර ආයතන සහ ව්‍යවසායකයන් සමග ගැටලු විසඳීම අරමුණු කරගෙන පවත්වන විශේෂ ගැටලු විසඳීමේ සාකච්ඡාවයි.

ප්‍රාදේශීය ව්‍යවසායක සභා නියාමනය කරන්නේ ගාල්ල දිස්ත්‍රික් ව්‍යවසායක සභාවයි. ප්‍රාදේශීය ව්‍යවසායක සභාවේ සභාපති ලෙස ප්‍රාදේශීය ලේකම් ක්‍රියා කරන අතර එහි කැඳවුම්කරු වන්නේ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)යි. මෙහි සෙසු සාමාජිකයන් වන්නේ ප්‍රාදේශීය මට්ටමේ සිටින ව්‍යවසායකත්ව සංවර්ධන සේවා සපයන ආයතනවල නිලධාරීන් ය. ව්‍යවසායකයන්ගේ ගැටලු ප්‍රාදේශීය ව්‍යවසායක සභාවට රැගෙන ඒමේ ප්‍රවේශයක් ලෙස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රාදේශීය ව්‍යවසායක සංගම් ගොඩනගා ඇත. මේ සංගම්වල සිටින ව්‍යවසායකයන් ඔවුන්ගේ ව්‍යාපාර ක්ෂේත්‍රය අනුව කණ්ඩායම්ගත කර ඇති අතර එමගින් එම ව්‍යාපාරවලට බලපාන සුවිශේෂ ගැටලු හඳුනා ගනී. ව්‍යවසායක සංගමය නියෝජනය කරමින් එහි නිලධාරීහු ද ප්‍රාදේශීය ව්‍යවසායක සභාව නියෝජනය කරති. මාසික ව රැස්වන මේ සභාව හඳුනා ගන්නා ව්‍යවසායකයන්ගේ නොවිසඳුණු ගැටලුවලට විවිධ අමාත්‍යාංශ නියෝජනය වන නිලධාරීන් ඔවුන්ට ලබාදිය හැකි සේවා ඔස්සේ විසඳුම් ලබාදෙන අතර එසේ නොවන, ප්‍රාදේශීය මට්ටමින් විසඳිය නොහැකි ගැටලු හා ප්‍රතිපත්තිමය තීරණ ගතයුතු ගැටලු දිස්ත්‍රික් ව්‍යවසායක සභාව වෙත යොමු කරයි.

'තිරසර සංවර්ධනය සඳහා තිරසර ව්‍යවසායකත්ව' යන දැක්ම පෙරදැරි කර ගනිමින් ගොඩනගන ලද මාර්ග සිතියම

ව්‍යවසායක සභාව යනු ව්‍යවසායකත්ව සංවර්ධන සේවා සපයන නිලධාරීන් එක ම මේසයකට පැමිණ ව්‍යවසායකයන් මුහුණදෙන ගැටලු විසඳීම සඳහා සකස් කරන ලද ඒකාබද්ධ ප්‍රවේශයකි. මේ සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා මුලින් ම ස්ථාපිත කරන ලද්දේ ගාල්ල දිස්ත්‍රික් ව්‍යවසායක සභාවයි.

(Road Map) ඔස්සේ ගාල්ල දිස්ත්‍රික් ව්‍යවසායක සභාව පැමිණි මාවතේ ඇත්තේ ජයග්‍රහණ, අත්දැකීම් විශාල සංඛ්‍යාවකි. ව්‍යවසාය ලබා ගන්නා ලද ප්‍රතිලාභ රාශියකි.

අදහස් දක්වන හිටපු ගාල්ල දිස්ත්‍රික් ලේකම් ශාන්ත වීරසිංහ; "ගාල්ලේ ව්‍යවසායක සංස්කෘතියක් නිර්මාණය කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ නව ව්‍යවසායකයන් ගොඩ නංවාලීමත් ඔවුන් මෙරට ජාතික ආර්ථිකයේ කොටස්කරුවන් බවට පත් කිරිමත් අපේ වැයමයි. පසුගිය සමයේ රටේ ඇති වූ අර්බුදයට හොඳම විසඳුම නිෂ්පාදන ආර්ථික ක්‍රියාවලියක් නිර්මාණය කිරිම. ඒ වෙනුවෙන් අප දරන උත්සාහය දැන් මල්ඵල ගැන්වී අවසන්. දෛනික ව ව්‍යවසායකත්ව සභාව පිළිබඳ ව තිබෙන උනන්දුව වැඩි වී තිබෙනවා. 2023 මාර්තු මස සිට ක්‍රියාත්මක වූ මේ සංකල්පය දැන් ජාතික මට්ටම දක්වා ව්‍යාප්ත කිරීමට අවකාශය නිර්මාණය වී තිබෙනවා. ඒ වෙනුවෙන් ඉදිරිපත් කළ වැඩ සැලැස්ම අධීක්ෂණය කරන යාන්ත්‍රණයත් ද තිබෙනවා. කුඩා පරිමාණ ව්‍යවසායකයන්ට පුළුවන් සැලසුම යටතේ ඔවුන්ගේ ව්‍යවසායකත්වය සංවර්ධනය කරගන්න. රාජ්‍ය සේවයේ මීට දශකයකට පෙර පැවති සේවා ක්‍රමය නොවෙයි දැන් තිබෙන්නේ. මේ නිසා ඊට වඩා වෙනස් තැනකින් අපට හිතන්නට සිදු වනවා. මේ අර්බුදවලින් මිදීමට අප සාමුහික ව නව යාන්ත්‍රණයක් නිර්මාණය කර ගත යුතුයි. සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහයෝගය ඇති ව මේ වැඩසටහන් අප නිර්මාණය කළේ ඒ නිසයි."

ව්‍යවසායකයන්ගෙන් ලබා ගන්නා ලද දත්ත විශ්ලේෂණය කරමින් හඳුනා ගත් ගැටලු සඳහා විසඳුම් ලබා දීමට පුහුණු වැඩසටහන්, සායන, ප්‍රදර්ශන පවත්වා ඇති අතර රාජ්‍ය අනුග්‍රහය මත උපකරණ හා යන්ත්‍රසූත්‍ර ලබා දී ඇත. මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය දැනුම ලබාදීම මෙන් ම අලෙවිකරණ විශේෂඥයන් මාර්ගයෙන් අලෙවිකරණ දැනුම, කුසලතාව වැඩිදියුණු කිරීමටත් ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ දැනුම ලබාදීමටත් පියවර ගෙන තිබේ. ආකල්ප සංවර්ධනයෙන් ව්‍යවසායකත්ව කුසලතා ඔප්නැංවීමට අවශ්‍ය දැනුමත් අපනයන වෙළෙඳපොළ වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය මූලික දැනුමත් ලබා දී ඇත. නිෂ්පාදනවල ගුණත්වය ඉහළ නැංවීම සඳහා ජී. එම්. පී සහතික ලබාදීමෙන් හා තත්ත්ව සහතික ලබාදීමෙන් ව්‍යාපාර විධිමත් කිරීමට අවශ්‍ය පියවර ගෙන තිබේ.

වාර්ෂික ව ව්‍යවසායකයන් ඇගයීම් සඳහා 'ගාලු දිසා ප්‍රවර්ධා' සම්මාන උළෙලේදී හොඳම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා සහ නැගී එන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා තෝරා සම්මාන ලබාදීමෙන් එම ව්‍යවසායකයන් ජනතාවගේ සහ විවිධ ආයතනවල විශේෂ අවධානයට ලක් වීම සුවිශේෂ කරුණකි.

ව්‍යවසායකත්ව සංවර්ධනයේදී ඒ සඳහා සහභාගි වන නිලධාරීන්ගේ කැපවීම, උනන්දුව ඉතා වැදගත් ය. මේ සඳහා ඔවුන්ගේ ද දැනුම කුසලතා හා ආකල්ප වැඩිදියුණු කළ යුතු ය. ගාල්ල දිස්ත්‍රික් ව්‍යවසායක සභාව නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනයට විවිධ පියවර ගනිමින් එම අරමුණ ජය ගෙන ඇත. නිලධාරීන්ගේ මූල්‍ය සාක්ෂරතා දනුම හා ඩිජිටල් අලෙවිකරණ දැනුම ඉහළ නැංවීමෙන් එම දැනුම ව්‍යවසායකයන් වෙතට රැගෙන යාමට අවශ්‍ය පසුබිම සැකසීම එහි ප්‍රමුඛ ක්‍රියාමාර්ගයකි.

ව්‍යවසායක ඇගයීම් දින පොත පවත්වාගෙන යාමේ අරමුණ ව්‍යවසායකයන් පසුවිපරම් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීමයි. මෙහිදී තෝරාගත් ව්‍යාපාර 250ක් අපනයන මට්ටමට ගෙනයාම ඉලක්ක කරගෙන ඇත. ගාලුදිසා ප්‍රවර්ධා ('Galle Night Street Fair') ගාල්ල කොටුපවුර වෙත ප්‍රවේශ වන බාලදක්ෂ මාවතේ සෑම මසක ම රාත්‍රී සති අන්තයේ දින හතරක් පැවැත්වෙන ප්‍රදර්ශනයකි. දෙස් විදෙස් සංචාරකයන්ගේ හා සාමාන්‍ය ජනතාවගේ විශේෂ අවධානයට යොමුවී ඇති මෙය විවිධ සංස්කෘතික අංග සමූහයකින් සමන්විත වන අතර පාරිභෝගිකයන්ට අවශ්‍ය නිෂ්පාදන මිලදී ගැනීමට පමණක් නොව පවුලේ සැමට වෙහෙසකර ජීවන රටාවෙන් මිදී විනෝදයෙන් ගත කිරීමට අවශ්‍ය පසුබිම මෙහි සකස් කර ඇත. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට මේ ඔස්සේ අලෙවි අවස්ථා උදා වී ඇත.

ගොඩනගන ලද අරමුදලක් ඔස්සේ ලංකා බැංකුව හා එක් ව විශේෂ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පසුබිම ගොඩනගා ඇත. ව්‍යාපාරිකයන් ණය ලබා ගැනීමේදී මුහුණදෙන ගැටලු රාශියක් නිරාකරණයට එහිදී අවකාශය ලැබේ. ණය ලබාගන්නා ව්‍යාපාරිකයා ගෙවිය යුතු පොලී මුදලින් 50%ක් මේ අරමුදලින් දරන අතර ඉතිරි 50% ව්‍යවසායකයා දැරිය යුතු ය. එයින් ව්‍යවසායකයා මුහුණදෙන ඉහළ පොලී අනුපාත ගැටලුවට විසඳුමක් ලැබේ. ණය සඳහා නිර්දේශය ප්‍රාදේශීය ව්‍යවසායක සභාව ලබාදෙන බැවින් ඇපකර ගැටලුවේදී ඔවුන්ට සහනයක් ලැබීම ව්‍යවසායකයන්ගේ මූල්‍ය ගැටලුව සඳහා ලබාදී ඇති වඩා සාර්ථක පිළිතුරකි.





# රටේ හදා වටේ යැවීම




නුවන් කුමාර කටුගම්පල

රටට ව්‍යවසායකත්ව සංස්කෘතියක් (Entrepreneurial Culture) හඳුන්වා දීම, කර්මාන්ත සාක්ෂරතාව (Industrial Literacy) දියුණු කිරීම, කර්මාන්ත මානසිකත්වයක් (Industrial Mentality) ඇතිකිරීම, කර්මාන්ත හිතකර පරිසරයක් (Entrepreneurial Echo system/ Conductive Environment) නිර්මාණය කිරීම, ව්‍යවසායකත්වය සහ කර්මාන්ත ප්‍රවර්ධනය කර නිෂ්පාදනය වැඩිකිරීම සහ වැඩිවන නිෂ්පාදන සඳහා දේශීය-විදේශීය වෙළෙඳපොළ පුළුල් කිරීමෙන් ආර්ථික ස්ථාවරත්වයට දායක වීම කර්මාන්ත අමාත්‍යාංශයේ අපේක්ෂා සහ ඉලක්ක අතර ප්‍රධාන වේ.

කුඩා, මධ්‍ය සහ මහා පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍ර වැඩිදියුණු කළ සෑම රටක් ම දියුණු වී ඇති බැවින් ශ්‍රී ලංකාවේ සිතියමෙන් මැකී ගිය පැරණි කර්මාන්ත යළි පණගැන්වීම, නව කර්මාන්ත අලුතින් බිහි කිරීම සහ ඒ සඳහා කර්මාන්ත ව්‍යවසායකත්වය ඉහළ නැංවීම යන අරමුණු සාක්ෂාත් කර ගැනීමෙන් මෙරට ආර්ථික කොඳුනාරටිය ශක්තිමත් කළ හැකි බව කර්මාන්ත අමාත්‍යාංශ ලේකම් ශාන්ත වීරසිංහගේ අදහසයි. ඔහු පවසන පරිදි 2024 අයවැයෙන් ඉදිරිපත් කළ, 'අපනයන ආර්ථිකයක් ගොඩනැගීම' යන මූලික ප්‍රතිපත්තිමය සාධකය ජයගැනීමට නම් ප්‍රධාන වශයෙන් සිය අමාත්‍යාංශය යටතේ ඇති සියලු ම ආයතන, ව්‍යවසායකයන්, ආයෝජකයන්, කර්මාන්තකරුවන් සහ සමාජය එක් ජාතික අරමුණකට පෙළගැස්විය යුතු ය. ඒ සඳහා අමාත්‍යාංශය සකස් කළ උපායමාර්ගික සැලැස්ම තවදුරටත් සංවර්ධනය කරමින් ක්‍රියාත්මක කරයි.

### ඒකාබද්ධ ප්‍රවේශයක්

මේ සඳහා ඍජු ව සහ සක්‍රීය ව 'ජාතික කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තියක (National Industrial Development Policy)' ඒකාබද්ධ අරමුණට දායක කර

## INDUSTRY EXPO 2024

ජුනි 19-23 දක්වා කොළඹ, බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය (BMICH) කර්මාන්ත ක්ෂේත්‍රයත් දේශීය සමාජ ආර්ථික දේහයත් ඒකාබද්ධ ගමනකට අත්බැඳගැනීමේ මංගල්‍ය පැවැත්වීමට වෙන් කර ඇත. රටේ පවතින ආර්ථික බැස්ම නැග්මකට හැරවෙන සංධිස්ථානයක් බවට පත් කර ගත යුතු මේ අවස්ථාව Industry EXPO 2024 නම් වේ. අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් කරා රට මෙහෙයවීමට කර්මාන්ත අමාත්‍යාංශය, ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කරන මෙය දිගුකාලීන ආර්ථික සැලසුමක මූලාරම්භයයි.

දේශීය සහ ජාත්‍යන්තර කර්මාන්තකරුවන් සහ ආයෝජකයන් වෙනුවෙන් වෙන් වූ භූමිභාග සහිත මේ ප්‍රදර්ශනය ප්‍රදර්ශන කුටි 1300කින් සමන්විත ය.

ජුනි මස 18 දින මෙරට ව්‍යවසායකයන් දේශීය ව එකලස් කළ සහ නිෂ්පාදනය කළ වාහන සහිත ව ගාලුමුවදොර පිටියේ සිට ප්‍රදර්ශන භූමිය දක්වා පැමිණෙන 'ජාතික රථවාහන පෙරහැර (National Vehicle Parade)', පාසල් ව්‍යවසායකත්ව කව, IDB Digital One Stop Shop, Ceylon Plaza, Industry ණය යෝජනා ක්‍රමය, CEDA Startup and Scale up යන සුවිශේෂී අංග ද ප්‍රදර්ශනයට ඇතුළත් ය.

මේ ප්‍රදර්ශනයට සමගාමී ව ජුනි මස 20-21 දිනවල පැවැත්වෙන 'තිරසර හරිත කර්මාන්ත සංස්කෘතියක් ප්‍රවර්ධනය

ගත යුතු ආයතන දැනටමත් හඳුනාගෙන ඇති අතර එම ආයතන ඒකාබද්ධ ප්‍රවේශයකින් වැඩ කිරීම සඳහා කැමැත්ත ද පළ කර ඇත. ඊට ශ්‍රී ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය, විදාතා, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, තරුණ කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර අංශය, IDB, කර්මාන්ත පුහුණු වෘත්තීය අධ්‍යාපන ආයතන, වාණිජ බැංකු සහ වෙනත් මූල්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සහ අධ්‍යාපන අමාත්‍යාංශය වැනි මෙතෙක් කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ව වුවත් තනි තනි ව සිය ආයතනික න්‍යායපත්‍ර අනුව ක්‍රියා කළ ප්‍රමුඛ ආයතන රැසක් අයත් ය. මේ ඒකාබද්ධ නව වැඩපිළිවෙළ ක්‍රියාත්මක කර, රාජ්‍ය ආදායම ඉහළ නංවා ගැනීමෙන් ආර්ථික ගැටලු රැසකට පිළියම් යෙදීමට හැකි වේ.

## ස්ථාවර ආර්ථික සංවර්ධනයක්

ස්ථාවර ආර්ථික සංවර්ධනයක් ඇති සෑම රටක් ම එම තත්ත්වයට ළඟා වී ඇත්තේ ස්ථාවර නිෂ්පාදන ආර්ථිකයක් ක්‍රියාත්මක කරවීමෙනි. එය කළ හැකි වන්නේ මූල්‍යමය (Financial), ශ්‍රමික (Labor force) සහ යටිතල පහසුකම් (Infrastructure) යන අවශ්‍යතා සපයා ගැනීමට අදාළ නීති-රීති, අණ-පනත්, ව්‍යවස්ථා සහ රෙගුලාසි කර්මාන්තවලට හිතකර ලෙස සහ අනෙකුත් ක්ෂේත්‍රවලට අහිතකර නොවන ලෙස ඉතා දැඩි තත්ත්වයේ සිට දරාගත හැකි සරල සීමා දක්වා වෙනස් කිරීමට සහ යාවත්කාලීන කිරීමට නම්‍යශීලී වූ විට ය. එවිට ව්‍යාපාර ආරම්භ කිරීමටත් ඒවා පත්වාගෙන යාමට සහ ඇවර කිරීමටත් පහසුකම් සැපයෙන බැවින් ව්‍යවසායකයන් කර්මාන්ත ක්ෂේත්‍රයේ ආයෝජනය කිරීමට පෙළඹේ. රාජ්‍ය ආදායම ඉහළ නැංවෙන්නේ එලෙස ව්‍යවසායකත්වය, නිෂ්පාදනය සහ අලෙවිය වර්ධනය වූ විට ය. ජනතාවගේ සමාජ තත්ත්වය ඉහළ නැංවීමට සහ රටේ යහපත් පරිපාලන ව්‍යුහයක් ක්‍රියාත්මක කිරීමට එවිට හැකි වේ.

Scale-up and Start-up යන තේමා පාඨය ආදර්ශ කොටගෙන කර්මාන්ත අමාත්‍යාංශය මෙහෙයවන සමස්ත වැඩපිළිවෙළ ස්ථාවර ප්‍රතිපත්තිමය රාමුවක් මත ඒකීය දිශානතියකට ඉලක්කගත කිරීම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ අපේක්ෂාවයි.

කර්මාන්තවලට පහසු පරිසරය (Reforms) සකස් කිරීම සහ වත්කම් (Resources) වැඩිදියුණු කිරීමත් මේ සඳහා වැදගත් සාධක දෙකකි. ඒ අතරින් රජයට පහසු සහ මිලක් වැය නොවන කාර්යය වන්නේ 'පහසු පරිසරයක් සකස් කිරීම' ය. කර්මාන්ත සඳහා බලපත්‍ර (License) ලබා දීමේ ප්‍රමාදය, ප්‍රතිපත්තිවල අසමතුලිතතාව (Imbalance in Policies), අඩු ව්‍යවසායකත්ව ධාරිතාව (Low Entrepreneurial Capacity), දැඩි අභ්‍යන්තර නියාමන කොන්දේසි (Very Strict Domestic Regulatory Conditions), ඩිජිටල් තාක්ෂණික ක්‍රම භාවිතයේ බාධක (Barriers in Digital Technology Process), භූමිය අත්පත් කර ගැනීමේ සහ සංවර්ධනය කිරීමේ බාධක (Barriers in Land releasing and Development of Lands) යනාදී දුර්වලතා මඟහැරවීම ඉන් අදහස් කෙරේ. ඊට ප්‍රමුඛතාව දිය යුතු ය.

Scale-up and Start-up යන තේමා පාඨය ආදර්ශ කොටගෙන කර්මාන්ත අමාත්‍යාංශය මෙහෙයවන සමස්ත වැඩපිළිවෙළ ස්ථාවර ප්‍රතිපත්තිමය රාමුවක් මත ඒකීය දිශානතියකට ඉලක්කගත කිරීම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ අපේක්ෂාවයි. එහිදී රටේ කර්මාන්තවලට වෙන් කෙරෙන භූමි ප්‍රමාණය 0.04% සිට 1% දක්වා වර්ධනය කිරීම, රැකියා අපේක්ෂා කරන්නන්ට වඩා රැකියා සම්පාදනය කරනු ලබන ව්‍යවසායක ප්‍රතිශතය කර්මාන්ත ක්ෂේත්‍රයේ ශ්‍රම බලකායෙන් 2.8% සිට 10% දක්වා වර්ධනය කිරීම, ව්‍යාපාර කිරීමේ පහසුකම්වල ජාත්‍යන්තර දර්ශකය (Ease of doing Business Index) 50 දක්වාවත් ගෙන ඒම ද අපේක්ෂිතයි. වැඩවර්ජන සහ උද්ඝෝෂණ අවම කර ශ්‍රමිකයන්ගේ සේවා තෘප්තිය වැඩි කිරීමත් රටේ ඒකපුද්ගල අපනයන අගය 50%ට සහ දළ දේශීය නිෂ්පාදිතයට කර්මාන්ත අංශයේ දායකත්වය (GDP) 25%ට ගෙන ඒමත් පක්ෂ දේශපාලනයෙන් තොර රාජ්‍ය පරිපාලන න්‍යායපත්‍රයක් මත කර්මාන්ත අංශය ක්‍රියාත්මක කරවීමත් මගින් තිරසර සංවර්ධනය වෙත රට මෙහෙයවීම අනෙකුත් අපේක්ෂිත කාරණා ය. ඒ සඳහා මාධ්‍ය සහයෝගය අවශ්‍ය වන බව කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ සභාපති වෛද්‍ය සාරංග අලහප්පෙරුම අවධාරණයෙන් සඳහන් කළේ ය.

උදෙසා පළමු ජාත්‍යන්තර සමුළුව (Green Industry initiative for Sustainable Industry Development)' ඉලක්කගත වන්නේ 'තිරසර හරිත කර්මාන්ත උදෙසා වන සම්මාන උළෙල (Industry Green Awards)' පැවැත්වීමට ය.

Industry EXPO 2024 ප්‍රදර්ශනයේදී දේශීය කර්මාන්තකරුවන්ට සහ ව්‍යාවසායකයන්ට නව දැනුම ලබා ගැනීමටත් ව්‍යාපාරික සම්බන්ධතා ජාලය පුළුල් කර ගැනීමටත් නව ආයෝජකයන් සහ ගැනුම්කරුවන් හඳුනා ගැනීමටත් කර්මාන්ත ආරම්භ කිරීමට සහ පවත්වාගෙන යාමට අදාළ පහසුකම් හා සේවා සපයා ගැනීමටත් හැකි වේ. එමගින් තම නිෂ්පාදනවලට දේශීය ව සහ අන්තර්ජාතික මට්ටමින් වන වෙළෙඳපොළ පුළුල් වන බැවින් සිය නිෂ්පාදන සඳහා අලෙවිය වර්ධනය කරගෙන ආදායම් තත්ත්වය ඉහළ නංවා ගැනීමට මේ ප්‍රදර්ශනය තෝතැන්නක් කර ගැනීමේ හැකියාව පවතී. එමගින් දේශීය ආර්ථිකයට ලබා දිය හැකි දායකත්වය සුළුපටු නොවේ.

## කර්මාන්ත ඩිජිටල්කරණය

2022 වර්ෂයේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සිදු කළ සංගණනය අනුව අවුරුදු 05-69ත් අතර ජනගහනයෙන් ඩිජිටල් සාක්ෂරතාව ඇත්තේ 36%කට පමණ ය. නාගරික ප්‍රදේශවල මේ අගය 48.9%ක් ද ග්‍රාමීය ප්‍රදේශවල 34%ක් ද වතුකරයේ 11%ක් ද වශයෙන් බෙදී යයි. මේ තත්ත්වය මත කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට ඇති අභියෝගය වන්නේ ඩිජිටල්කරණය උපයෝගී කරගෙන කර්මාන්ත ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය සලස්වමින් අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් කරා ගමන් කිරීමට පුද්ගල සහභාගිත්වය ලබා ගන්නේ කෙසේද? යන්නයි.







කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සමග ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව සංසදය ගිවිසුමකට එළඹීම

මණ්ඩලයේ ව්‍යාපාර සංවර්ධන නිලධාරී ඉරේෂ් පියතිලක පැවසුවේ ඒ සඳහා ව්‍යවසායකයන්, කර්මාන්තකරුවන් සහ කර්මාන්තවලට සෘජු සම්බන්ධයක් ඇති අනෙකුත් ක්ෂේත්‍රවල නියුතු වූවන්ගේ අන්තර්ජාල සාක්ෂරතාව (Internet Literacy) සහ තාක්ෂණික දැනුම (Technical Knowladge) පැවතීම අත්‍යවශ්‍ය බවයි. මණ්ඩලය ඊට ඩිජිටල් මෙවලම් (Digital Tools) සහිත ප්‍රවේශ දෙකකින් ක්‍රියාත්මක වේ. පළමුවැන්න මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය ඩිජිටල්කරණයට යොමු කිරීම (Process Digitalizataion) ය. දෙවැන්න ඩිජිටල් ප්‍රවේශය ශක්තිමත් කිරීම (Increesing Digital Accessibility) ය. www.idp.gov.lk සිය වෙබ් අඩවිය ඔස්සේ සුළු, මධ්‍ය සහ මහා පරිමාණ ව්‍යවසායකයන් නූතනත්වය කරා කැඳවීමට අදාළ ඩිජිටල් මෙවලම් රැසක් හඳුන්වා දී ඒවා සමාජගත කරවීමට කර්මාන්ත සංවර්ධන මණ්ඩලය යුහුසුළුව ක්‍රියා කරයි.

කර්මාන්තකරුවන් පුහුණු කිරීමේ යෙදවුම් පද්ධතිය (IDB Sri Lanka Training System/App), පුද්ගලික ව්‍යවසායක වෙබ් පිටුවක් විවෘත කර දීම, රැකියා බැංකු දොරටුව (Job Banking Potral)), සිය ව්‍යාපාරයේ හෝ කර්මාන්තයේ පැනනැගෙන ගැටලු දිස්ත්‍රික් කාර්යාල සමග ZOOM තාක්ෂණය ඔස්සේ සාකච්ඡා කිරීමේ හෝ ස්වයං ව විසඳා ගැනීමේ ඉඩ පහසුකම (Business Clinique/Self Evaluation Registration Metrics), ඉඩම් සංචිතය (Digitalized Industrial Land Bank), ආයෝජක සංචිතය (Invester Pool), ප්‍රජා සංසදය (Community Forum), විද්‍යුත් වාණිජ වේදිකාව (E-Commerce Flatform), කර්මාන්ත කේන්ද්‍රය, අථත්‍ය ප්‍රතිබිම්බ ප්‍රදර්ශනය කර භාණ්ඩ විකුණුම් ක්‍රමය (Virtual Items) ඇතුළු ඩිජිටල් මෙවලම් රැසක් මේ වනවිට මණ්ඩලය හඳුන්වා දී තිබේ.

## ව්‍යවසායකත්ව සංවර්ධනය

කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ (ව්‍යවසායකත්ව සංවර්ධන) රේණුකා ජයලත් සඳහන් කළේ වසර 5ක් ඇතුළත ව්‍යවසායක ප්‍රතිශතය 10%ක් දක්වා ඉහළ නංවාගැනීමට දායක වීම සිය ඉලක්කය වන බව ය.

පාසල් ව්‍යවසායකත්ව කව (School Entroprineurship Circles) පිහිටුවීම ඊට අදාළ එක් ක්‍රියාමාර්ගයකි. මේ යටතේ දැනටමත් ගුරුවරුන් 1000ක් පුහුණුකර ඇති අතර පාසල් 350ක ව්‍යවසායකත්ව කව 500ක් ආරම්භ කර ඇත. මේවායේ සමාජික දරුවන් සිය නිෂ්පාදන අපනයනය කර ආදායම් ඉපදවීමට ද සමත් ව සිටී. මෙ මගින් ඉදිරි වසර තුනෙන් පසු විශ්වවිද්‍යාල ප්‍රවේශය අහිමිවන දරුවන්ගෙන් විශාල සංඛ්‍යාවක් රැකියා සොයා නොගොස් ව්‍යවසායකත්ව මානසිකත්වයකින් යුතු ව රැකියා සම්පාදනය කරන්නන් බවට පත් වන බව මණ්ඩලයේ විශ්වාසයයි.

සරසවි ව්‍යවසායකත්ව සමාජ (University Entroprineurship Clubs) පිහිටුවීම යටතේ රුහුණ විශ්වවිද්‍යාලය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය සමග මණ්ඩලය ගිවිසුම්ගත ව ඇත. එයින් අපේක්ෂා කරන්නේ ව්‍යවසායකත්වයට සම්බන්ධ විෂය ධාරාවලින් උපාධි සපුරන සිසුන් රැකියා අපේක්ෂකයන් නොවී රැකියා සම්පාදකයන් වශයෙන් සරසවියෙන් පිටවන තත්ත්වයට පත්කිරීම ය. මීට අමතර ව වෘත්තීය අධ්‍යාපන ආයතනවලට සහ දහම් පාසල්වලට ද මේ සංකල්පය හඳුන්වා දෙයි.

ව්‍යවසායක විශිෂ්ටතා සම්මාන (Entroprineurship Exelence Awards) උළෙල පැවැත්වීම අනෙක් ක්‍රියාමාර්ගයයි. මේ යටතේ මෙරට කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළ ව එදා

මෙදාතුර පැවැති දැවැන්තම සම්මාන ප්‍රදානෝත්සවය මෙවර පැවැත්විණි. එහිදී කර්මාන්ත ක්ෂේත්‍ර 121කට අදාළ විශිෂ්ටයන් තෝරා සම්මාන 300ක් ප්‍රදානය කෙරිණි. සන්නාම විශිෂ්ටතා සම්මාන (Brand Exelence Awards) මීළඟ ක්‍රියාමාර්ගයයි. මේ සඳහා දැනටමත් ක්ෂේත්‍ර 125කට අදාළ ව අයදුම්පත්‍ර 500කට වඩා ලැබී ඇති අතර එයින් ප්‍රාදේශීය, ජාතික සහ අන්තර්ජාතික යන මට්ටම් තුනෙන් තෝරා ගන්නා විශිෂ්ටතම සන්නාම 120ක් සඳහා සම්මාන පිරිනැමේ. මෙය ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පළමු වන සන්නාම විශිෂ්ටතා සම්මාන උළෙලයි. Peo TV නාලිකා අංක 130 ඔස්සේ විකාශය වන Industry TV රූපවාහිනී නාලිකාව ඇරඹීම තවත් ක්‍රියාමාර්ගයකි. කර්මාන්ත ක්ෂේත්‍රය සම්බන්ධ අයගේ දැනුම වර්ධනයට ඉවහල් වන පැතිකඩ මෙහි සාකච්ඡාවට බඳුන් කෙරේ.

## කර්මාන්ත සංවර්ධන අරමුදල

බැංකු ණය පහසුකම් ලබා ගැනීමේදී කර්මාන්තකරුවන් මුහුණදෙන ගැටලු සැලකිල්ලට ගෙන කර්මාන්ත සංවර්ධන පනතට අනුකූල ව ඇරඹූ අරමුදල (Industrial Development Fund) ද නවතම ක්‍රියාමාර්ගයකි. රුපියල් මිලියන 10කින් 2023 ඔක්තෝබර් මාසයේදී ඇරඹූ මේ අරමුදලෙන් දැනට කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් 73 දෙනකු වෙත 6%ක සහන පොලියට උපරිමය රුපියල් ලක්ෂ 5 දක්වා වන ලෙස ණය නිකුත් කර තිබේ. සරල ඇප කොන්දේසි මත නිකුත් කළ මේ ණය පියවීම සඳහා මාස 6ක සහන කාලයකුත් වසර 3ක ගෙවීම් කාලයකුත් ලබා දෙයි. මීට ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ (RDB) සහයෝගය ලබා ගැනේ.

## විදේශ වෙළෙඳපොළ ජය ගැනීම

අන්තර්ජාතික වෙළෙඳපොළ ඉලක්ක කරන (Export-oriented Manufacturing) නිෂ්පාදකයකු විසින් සපිරිය යුතු මූලික වැදගත් සාධක (Initial Success Factors) 3කි. ඒ, ගෝලීය තරගකාරී මිල ගණන් (Globaly Competitve Price), ගෝලීය තරගකාරී උසස් තත්ත්වය (Globaly Competitve Quality) සහ අඛණ්ඩ සැපයුම (Continously Supply) ය. මේවායින් එකක් හෝ අසම්පූර්ණ වූ විට එවැනි භාණ්ඩ අපනයනය කළ නොහැකි බව මණ්ඩලයේ අධ්‍යක්ෂ (ඉංජිනේරු) ඩබ්ලියු. ඒ. පී. කේ. නිශාන්ත ප්‍රකාශ කළේ ය.

මේ තත්ත්ව පවත්වා ගැනීමට දියුණු රටවල් අනුගමනය කළ උපායමාර්ග තිබේ. ඒ අතර වන නිෂ්පාදන වියදම අවම කර භාණ්ඩයේ ගුණාත්මක බව වැඩිකර ගැනීම, අමුද්‍රව්‍ය ආනයන බදු නිදහස් කිරීම හෝ අඩුකිරීම, ආනයන පාදක ආර්ථිකයෙන් (Import-oriented Economy) අපනයන පාදක ආර්ථිකයට (Export-oriented Economy) ගමන් කිරීම, කර්මාන්තවලට

බැංකු ණය පහසුකම් ලබා ගැනීමේදී කර්මාන්තකරුවන් මුහුණදෙන ගැටලු සැලකිල්ලට ගෙන කර්මාන්ත සංවර්ධන පනතට අනුකූල ව ඇරඹූ අරමුදල (Industrial Development Fund) ද නවතම ක්‍රියාමාර්ගයකි. රුපියල් මිලියන 10කින් 2023 ඔක්තෝබර් මාසයේදී ඇරඹූ මේ අරමුදලෙන් දැනට කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් 73 දෙනකු වෙත 6%ක සහන පොලියට උපරිමය රුපියල් ලක්ෂ 5 දක්වා වන ලෙස ණය නිකුත් කර තිබේ.

අවශ්‍ය යන්ත්‍ර-සූත්‍ර වැනි ප්‍රාග්ධන භාණ්ඩ ආනයන බදු නිදහස් කිරීම, කර්මාන්ත සඳහා ආයෝජකයන්ගේ මූලික අවශ්‍යතා (Basic Needs for Investers) රජයේ මැදිහත්වීමෙන් ඉටුකර දීම, ඔවුන් වෙනුවෙන් ආරක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම, සෑම දිස්ත්‍රික්කයක ම කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ඉංජිනේරු කාර්යාලයක් විවෘත කිරීම වැනි උපායමාර්ග මණ්ඩලය සැලසුම් කර ඇත. එවිට අපනයන ආදායම ඉහළ නංවාගෙන ගෙවුම් ශේෂ හිඟය (Balance of Payment) බින්දුව (0) දක්වා පහතට ගෙන ඒමට ශ්‍රී ලංකාවට පහසු වනු ඇත.

## බාධා ඉවත් කිරීම

කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ (ප්‍රාදේශීය සංවර්ධන) පාලිත දික්වැල්ල, රටේ නිෂ්පාදනය වැඩි කිරීම අරබයා නිෂ්පාදකයන්ට සහ ව්‍යවසායකයන්ට පවතින බාධා ඉවත් කළ යුතු බව පැවසුවේ ය. මේ වෙනුවෙන් කර්මාන්ත ලියාපදිංචිය සඳහා වන ආකෘති පත්‍ර නැවත සකස් කර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම, 2022 වර්ෂයේ 3000ක් වූ මණ්ඩලය යටතේ පුහුණුව ලැබූ කර්මාන්තකරුවන් සංඛ්‍යාව 2023 වර්ෂයේදී 40,000ක් දක්වා වර්ධනය කිරීම, කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන පරීක්ෂා කර සහතිකකරණය සඳහා රසායනාගාරයක් ඉදිකිරීම, විදෙස් රටවල් සමග සම්බන්ධතා පවත්වමින් කර්මාන්තකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම පිණිස 'Connect Sri Lanka' වැඩසටහන නිර්මාණය කිරීම, මෙරට කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන ජාත්‍යන්තර ප්‍රදර්ශනවලට ඉදිරිපත් කිරීම පිණිස සම්බන්ධතා ජාලය සකස් කිරීම, 'සිරිසර' ජාතික කඳවුරු ඇති කිරීම, 'Industry Ceylon' සඟරාව පළ කිරීම, අනෙකුත් සෑම වෘත්තිකයකුට මෙන් ම කර්මාන්තකරුවන්ට ද පිළිගත් වෘත්තීය හැඳුනුම්පතක්, ලියාපදිංචි සහතිකයක්, වාහන අවසර පත්‍රයක් (Vehicle Pass) නිකුත් කිරීම වැනි දේ ක්‍රියාත්මක කර ඇත.

'අරඹමු ජයගමු' වැඩසටහන ඔස්සේ ප්‍රචාරණ අවකාශය පුළුල් කරන අතර මාධ්‍යවේදීන්ට ද ව්‍යවසායකත්ව පුහුණුව ලබා දී ඔවුන් ජාතික ආර්ථිකයට සක්‍රිය ලෙස දායක වන පිරිසක් බවට පත් කිරීමට ද කර්මාන්ත මණ්ඩලය සැලසුම් කර ඇත.

(අපනයන කේන්ද්‍රීය නිෂ්පාදන ආර්ථිකයක් (Export-oriented Manufacturing Economy)' උදෙසා මාධ්‍ය සහභාගිත්වය අපේක්ෂාවෙන් කර්මාන්ත අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා කර්මාන්ත සංවර්ධන මණ්ඩලය සංවිධාන කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පැවති වැඩමුළුව ඇසුරිනි)

# හොරු ඇල්ලීම

කාංචනා සිරිවර්ධන

නව නීති පද්ධතියක් සමග නව දේශපාලන සංස්කෘතියක් රටේ ගොඩනඟන බව අවධාරණය කරමින් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා තෙල්දෙණිය නව අධිකරණ සංකීර්ණය විවෘත කිරීමේ අවස්ථාවට (මැයි 15) එක්වෙමින් කළ කතාව පාදක කර ගනිමින් ක්ෂේත්‍රයේ විද්වතුන් දැක් වූ අදහස් ඇසුරින් මේ ලිපිය සැකසේ.)

## නව නීති පද්ධතියක් සමග නව දේශපාලන සංස්කෘතියක්



**රනිල් වික්‍රමසිංහ**
ජනාධිපති
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ශත වර්ෂයකට පමණ පසුව නීති ක්ෂේත්‍රයේ නව ප්‍රතිසංස්කරණ රැසක් සිදු කරමින් නීති 75ක් පමණ සම්මත කර ගැනීමට පසුගිය දෙවසර ඇතුළත අප ක්‍රියා කළා. ඇතැම් පාර්ලිමේන්තු වසර 04ක්, 05ක් පැවතියත් කිසිදා මෙවැනි නීති සංඛ්‍යාවක් සම්මත කරගෙන නැහැ.

නීතියේ ප්‍රමාදය පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා. යුක්තිය පසිඳලීම යථාර්ථයක් වීමට නම් කලට වේලාවට නීතිය ඉටු විය යුතුයි. එය අප ඉදිරියේ තිබෙන අභියෝගයක්. නඩු ඇසීම කාර්යක්ෂම ව සිදු කළ හැකි නම් තවත් නඩු ඉදිරිපත් වෙනවා.

රටේ නීතියේ ආධිපත්‍යය යළි තහවුරු කළ යුතුයි. නීතිය අතට ගෙන දේපොළ විනාශ කර දැමීමට ක්‍රියා කරනවානම් එතැන නීතියක් නැහැ. රටක ස්ථාවරත්වය රඳා පවතින්නේ නීතිය ක්‍රියාත්මක වීම මතයි. රටක් ලෙස පිළිගැනීමක් ලැබෙන්නේ ද යුක්තිය පසිඳලීම සිදුවන විට පමණයි. එසේ නොමැතිනම් රටේ දියුණුවක් සිදු වන්නේ නැහැ. ආයෝජන ද අපේක්ෂා කළ නොහැකියි. එම නීති පද්ධතිය අද රටේ ඇති කර තිබෙනවා.

රජයේ මුදල් පාලනය සිදු වුණේ මුදල් රෙගුලාසි අනුවයි. මේ මුදල් රෙගුලාසි උල්ලංගනය කිරීමට හැකියාව තිබුණා. චක්‍රලේඛ සංශෝධනය කිරීමට ද හැකියාව තිබුණා. ඒ අනුව මෙතෙක් රටේ මුදල් පාලනයක් සිදු වුණේ නැහැ. අද රජයට අයත් දේපොළ පිළිබඳ කිසිවෙක් දන්නේ නැහැ. ඒ නිසා රාජ්‍ය මුදල්

> දේපළ අපරාධ පනතත් සකස් කෙරෙමින් තිබෙනවා. ඒ අනුව දකුණු ආසියාවේ අලුත් ම නීති දැන් තිබෙන්නේ ශ්‍රී ලංකාවේ. මෙමඟින් දේශපාලනයේ වෙනසක් සිදු කරනවා. මෙතෙක් කල් දූෂණය දේශපාලන සටන් පාඨයක් බවට පත් ව තිබුණා.

කළමනාකරණය වෙනුවෙන් නීති ඉදිරිපත් කර තිබෙනවා. මේ ක්‍රමය මුලින් ම ආරම්භ කළේ නවසිලන්තයයි. ඉන්පසුව එක්සත් රාජධානිය, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව එය ක්‍රියාත්මක කළා. එහි නවීනම නීතිය අප දැන් ඉදිරිපත් කර තිබෙනවා.

දූෂණය ශ්‍රී ලංකාවේ විශාල ප්‍රශ්නයක්. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ණය ලබාදුන් රටවල් මේ පිළිබඳ අප සමග සාකච්ඡා කළා. ඒ වෙනුවෙන් ඉදිරිපත් කළ වැඩසටහනට එකඟතාව ප්‍රකාශ කිරීමෙන් පසු එම නව නීති ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ සඳහා වන ප්‍රධාන නීති තිබෙන්නේ 04ක්. එහි පළමුවැන්න 21 වැනි සංශෝධනය. ඒ අනුව ඊට අදාළ කොමිසම ඇති කර තිබෙනවා. දූෂණ විරෝධී පනත 2023 වසරේ ගෙනැවිත් 2024දී එය සංශෝධනය කළා.

පරිපාලනයට මුදල් වැය කිරීමේදී සිදුවන දූෂණ නැවැත්වීමට පියවරගෙන තිබෙනවා. ඒ සඳහා නීතියට වඩා දියුණු ක්‍රමවේදයක් අවශ්‍යයි. එම ක්‍රමවේදය සකස් කිරීමට දැනුම නොතිබීම ප්‍රශ්නයක් බවට පත් ව තිබුණත් ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට කරන ලද යෝජනාව අනුව සංශෝධනවලට යටත් ව රාජ්‍ය පරිපාලන විමර්ශන වාර්තාව සකස් කර තිබෙනවා.

"බලයට පැමිණ මාස දෙකෙන් හොරු අල්ලනවා යැයි කිව්වත් එය සිදු වන්නේ නැහැ" යනුවෙන් පවසනවා. ඇතැමුන් හොරු ආරක්ෂා කරන බවට ආණ්ඩුවට චෝදනා නගනවා. ඒ අනුව හොරු ආරක්ෂා කිරීමට පැමිණි බව කියන මේ ආණ්ඩුව හොරු අල්ලන නීති ගෙනැවිත් තිබෙනවා. මේ නීති ක්‍රියාත්මක කිරීමට පළපුරුද්දක් තිබිය යුතුයි. පළපුරුද්ද ලබා දීමට අවශ්‍ය පුහුණුව ලබා දිය යුතුයි. එම වැඩපිළිවෙළ අධිකරණ අමාත්‍යාංශය ක්‍රියාත්මක කර තිබෙනවා. මේ වෙනුවෙන් අපට සහය වීමට ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව මෙන් ම ඇමරිකා එක්සත් ජනපදය එකඟ වී තිබෙනවා.

මේ ආණ්ඩුව යටතේ පසුගිය දෙවසර අප ප්‍රධාන කරුණු 03ක් ඉටු කර තිබෙනවා. යුක්තිය පසිඳලීම මෙන් ම නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කර තිබෙනවා. අනෙක් පසින් අපනයන ආර්ථිකයක් ඇති කිරීම වෙනුවෙන් නීති සම්මත කර ගැනීමට පියවර ගෙන තිබෙනවා. එසේ ම දූෂණ විරෝධී නීති සම්මත කර ගනිමින් සිටිනවා. මේ වෙනුවෙන් සියලුදෙනාගේ සහයෝගය අවශ්‍යයි.

# රටක නීතිය උත්තරීතරයි



**යූ. ආර්. ද. සිල්වා**
ජනාධිපති නීතිඥ

රටක නීතිය උත්තරීතරයි. කවුරුන් හෝ නීතිය කඩ කරනවානම් ඒ තැනැත්තා අධිකරණය ඉදිරියට ගෙනැවිත් දඬුවම් ලබා දුන් විට සමාජය තේරුම් ගන්නවා රටක නීතියක් පැවතීමෙන් සහ ක්‍රියාත්මක වීමෙන් සියල්ලන්ට ආරක්ෂාව සහ සහනය ලැබෙන බවත් සැවොම නීතිය ඉදිරියේ සමාන බවත්. රටක නීතියේ මූලික ම හරය එයයි.

මූලික අයිතිවාසිකම් භුක්ති විඳිය හැක්කේ අනෙකාට හානියක් නොවන පරිද්දෙන්. මූලික අයිතිවාසිකම් කඩවීමකදී මූලික අයිතිවාසිකම් නඩුවක් පවරා, අදාළ තැනැත්තාට සහන සලසා ගැනීමේ හැකියාවක් පවතිනවා. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 වැනි ව්‍යවස්ථාවේ සඳහන්. 15 වැනි ව්‍යවස්ථාවේ ඒ සඳහා ව්‍යතිරේඛයක් ද පවතිනවා.

නීතියේ ආධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීමේ හැකියාව තිබෙන මහජනතාවයි එම ආධිපත්‍ය බලය ව්‍යවස්ථාදායකයට පවරන්නේ. එවිට ව්‍යවස්ථාදායකය නීති සම්පාදනය කරනවා. එම නීති විධායකය සහ අධිකරණය ඔස්සේ ක්‍රියාත්මක වෙනවා. නීති කඩ කළ විට දඬුවම් දෙනවා. මේ ක්‍රමවේදය ප්‍රජාතන්ත්‍රවාදී රටකට අත්‍යවශ්‍ය කාරණයක්.

මෙරට නීති ක්ෂේත්‍රයේ නව ප්‍රතිසංස්කරණ රැසක් පසුගිය කාලයේ සිදු කළා. ඒ අතරින් දූෂණ විරෝධී පනත ප්‍රධානයි. මේ පනත අල්ලස, දූෂණය සම්බන්ධ සියලු ම කාරණාවලට අදාළයි. විශේෂයෙන් යම් යම් ව්‍යාපෘතිවලින් කොමිස් ලබාගැනීම් ආදී කාරණාවලට අදාළ පුද්ගලයන් දූෂණ විරෝධී පනතෙන් අධිකරණයට ගෙනඒමට හැකියාව ලැබෙනවා.

මීට පෙර යම්කිසි පෙත්සමක් ඉදිරිපත් කරන්නන්ගේ නම, ගම සමග ලිඛිත ව ලැබුණොත් පමණයි දූෂණ විරෝධී ක්‍රියාවකට විරුද්ධ ව අල්ලස් හා දූෂණ කොමිෂන් සභාව වැනි අදාළ ආයතනවලට ක්‍රියාත්මක විය හැක්කේ. එහෙත් වර්තමානයේ නිර්නාමික පෙත්සමක් හෝ යම්කිසි තොරතුරක් ලැබුණොත් ඒ දූෂණ ක්‍රියා පිළිබඳ වහා ම පරීක්ෂණ කිරීමට එම කොමිෂන් සභාවට අයිතිවාසිකම ලබා දී තිබෙනවා. මේ වෙනස මත විශාල පරීක්ෂණවල නිරත වන්නට හැකියාව තිබෙනවා. වත්කම් ප්‍රකාශනය ඉදිරිපත් කිරීම විශේෂයෙන් රාජ්‍ය සේවකයන්ට අනිවාර්ය අංගයක්. මැතිවරණවලට ඉදිරිපත් වන පුද්ගලයන් වත්කම් ඉදිරිපත් කරන්නේ නැත්නම් ඔවුන් විශාල වරදකට යොමු වන බව මෙහි පැහැදිලි ව කියැවෙනවා. යම්කිසි දූෂණයක් හෝ අල්ලසක් සම්බන්ධ ව දැනුම්දෙන පුද්ගලයා ආරක්ෂා කරගැනීම සඳහා වින්දිතයන් ආරක්ෂා කරගැනීමේ පනතේ මෙන් ම දූෂණ විරෝධී පනතේත් යම් යම් ප්‍රතිපාදන තිබෙනවා.

මෙරට නීති ක්ෂේත්‍රයේ නව ප්‍රතිසංස්කරණ රැසක් පසුගිය කාලයේ සිදු කළා. ඒ අතරින් දූෂණ විරෝධී පනත ප්‍රධානයි. මේ පනත අල්ලස, දූෂණය සම්බන්ධ සියලු ම කාරණාවලට අදාළයි. විශේෂයෙන් යම් යම් ව්‍යාපෘතිවලින් කොමිස් ලබාගැනීම් ආදී කාරණාවලට අදාළ පුද්ගලයන් දූෂණ විරෝධී පනතෙන් අධිකරණයට ගෙනඒමට හැකියාව ලැබෙනවා.

අල්ලස්, දූෂණ සම්බන්ධ ව විමර්ශණ කිරීම සඳහා තිදෙනකුගෙන් යුක්ත කොමිෂන් සභාවක් තිබෙනවා. මේ කොමිෂන් සභාවේ සියලු දෙනා ම අධිචෝදනා පත්‍ර අත්සන් කිරීම කළ යුතු ද? යන ප්‍රශ්නය පසුගිය කාලයේ ඇති වුණා. එය ඉවත් කර විශේෂ ප්‍රතිපාදනයක් ගෙනැවිත් තිබෙනවා, කොමිෂන් ජනරාල්වරයා අත්සන් කළහොත් ප්‍රමාණවත් වන බවට. මේ සියලු කර්තව්‍ය සඳහා නිසි පුහුණුවක් ඇති, කැපවීමෙන් සහ අවංක ව ක්‍රියා කරන නිලධාරීන් යොදා ගන්නවානම් ඉතා පහසුවෙන් අල්ලස, දූෂණය වැනි නීති විරෝධී ක්‍රියාවල යෙදෙන්නන්ට එරෙහි ව ක්‍රියා කරන්න පුළුවන්.

මැතිවරණවලට මුදල් වියදම් කිරීම පාලනය කිරීමටත් පනතක් තිබෙනවා. මේ නිසා මැතිවරණවලදී හිතුමනාපෙට වියදම් කරන්නට බැහැ. පනතේ ප්‍රතිපාදනවලට, සීමාවලට යටත් ව මැතිවරණවලට වියදම් කරන මුදල් ලැබුණු ආකාරය හෙළිදරව් කරන්න පුළුවන්නම් පමණයි එය නීතිමය වශයෙන් පිළිගන්නේ.

මීට පෙර යම්කිසි ආකාරයකින් මුදල් අයථා ලෙස උපයාගෙන ඒවා බැංකුගත කර, දේපළවලට පරිවර්තනය කර රිසි සේ පාවිච්චි කරන ස්වභාවයක් තිබුණා. එවැනි කාරණා සම්බන්ධ ව ක්‍රියාකිරීමේ නීතිමය බාධා මෙන් ම නිසි නීතිමය ප්‍රතිපාදන නොමැතිවීමේ ගැටලුවක් තිබුණා. එහෙත් එවැනි අය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට සහ එවැනි ක්‍රියා පාලනය කිරීමට නව පනතක් තව නොබෝ දිනකින් පැමිණෙනවා.

## හොරකම නවත්වන්නත් නීති



**ආචාර්ය, නීතිඥ ප්‍රතිභා මහනාමහේවා**
මණ්ඩපාධිපති
ශ්‍රීපාලි මණ්ඩපය
කොළඹ විශ්වවිද්‍යාලය

හොරු අල්ලන්නත් ඉදිරියේදී හොරකම නවත්වන්නත් රජය නීති රැසක් ගෙනැවිත් තිබෙනවා. සැබවින් ම හොරු අල්ලනවාට වඩා වැදගත් වන්නේ හොරකම සහ හොරු බිහිවීම වැළැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග උපරිමයෙන් ගැනීමයි. දූෂණ විරෝධී පනත එහිදී ඉතා වැදගත්. බොහෝ විට රටේ සිදුවන අක්‍රමිකතා, වංචා, බලය අයුතු ලෙස යෙදීම ආදී සියලු කරුණුවලදී අසාධාරණයට ලක් වන පිරිස් සිටිනවා. ඔවුන් යම්කිසි ආකාරයකට ආරක්ෂා කරන්නයි දූෂණ විරෝධී පනත ගෙනැවිත් තිබෙන්නේ. ඇතැම් අවස්ථාවලදී සිදුවන දූෂණ, වංචා සම්බන්ධයෙන් තොරතුරු ලබාදීමට රාජ්‍ය නිලධාරින් පවා දක්වන්නේ බියක්. ඒ නිසා තොරතුරු ලබාදෙන අය දූෂණ විරෝධී පනතෙන් ආරක්ෂා කර තිබෙනවා. මේ අය ආරක්ෂා කරන්න තවත් නීති රැසක් තිබෙනවා. 2015 සාක්ෂිකරුවන් හා වින්දිතයන් ආරක්ෂා කිරීමේ පනත ඉන් එක් නීතියක්. මේ පනතිනුත් උත්සාහ කරන්නේ දූෂණ, වංචා, අපරාධ සම්බන්ධයෙන් තොරතුරු ලබාදෙන පුද්ගලයන්ට රැකවරණය ලබාදීම.

මෙහිදී මුදල් විශුද්ධිකරණ පනත සම්බන්ධයෙනුත් යමක් සඳහන් කළ යුතුයි. වැරදි ආකාරයට ශ්‍රී ලංකාවේ මුදල් උපයා තිබෙනවානම් ඒවා අදාළ පුද්ගලයන් ඇතැම් අවස්ථාවල විදේශ රටවලට ගොස් ආයෝජනය හෝ පරිහරණය කරන්න පුළුවන්. මුදල් විශුද්ධිකරණ පනත යටතේ හැකියාව තිබෙනවා එලෙස නීති විරෝධී ව ගෙනගොස් තිබෙන ධනය යම් ආකාරයකට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට.

දේපළ අපරාධ පනතත් එවැනි නීතියක්. එය තව ම කෙටුම්පතක්. ඒ යටතේත් වැරදි ආකාරයට බලය යොදවා, නීති විරෝධී ව කොමිස් ලබාගෙන ඒවා නොයෙක් රටවල තැන්පත් කර තිබෙනවානම් නඩු පවරා නැවත ගෙනඒමට පුළුවන්. මේ දේපළ තැන්පත් කර තිබෙන්නේ වෙනත් රටක බැංකුවක හෝ වෙනත් ආයතනයක විය හැකියි. ශ්‍රී ලංකාවේ අධිකරණයයි ඒ සම්බන්ධ ව ක්‍රියා කරන්නේ. මෙහිදී වැදගත් ම කාරණය වන්නේ වෙන රටවල එම දේපළ තිබෙනවානම් ඒවා ගෙන්වා ගැනීමේ ක්‍රියාමාර්ගයක් ඇති කරගැනීමයි. ඒ සඳහා ජාත්‍යන්තර සංවිධානත් ක්‍රියාත්මක වෙනවා. 1858 නිව්යෝක් සම්මුතිය අනුව වෙන රටක දෙන නඩු තීන්දුවක්, බේරුම්කරණ ප්‍රදානයක් ශ්‍රී ලංකාවේ පිළිගන්නවා. එවිට වෙන රටක නඩු පවරා වුණත් ඒ දේපළ ගෙන්වා ගන්න පුළුවන්. විශේෂයෙන් ම

බොහෝ රටවල දූෂණ, වංචා සිදු වන විට අනුගමනය කරන්නේ වෙනස් පිළිවෙතක්. දූෂණය යනු කුමක්ද? එයින් සිදුවන ජාතික සම්පත් පිරිහීම හා රටට සිදුවන අගහිඟතා පිළිබඳ නිසි අධ්‍යයන පාඨමාලා එම රටවල තිබෙනවා. එම පාඨමාලාවලින් 4, 5 ශ්‍රේණිවල සිට ම දරුවන්ට ඒ පිළිබඳ උගන්වනවා.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කවුන්සිලය ආර්ථික අපරාධ සම්බන්ධයෙන් වෙන ම ක්‍රියා කරනවා. ඔවුන්ගේ සහයෝගයත් ලැබෙනවානම් මේ කාර්යයේදී ඉතා වැදගත්.

නීතිය ක්‍රියාත්මක වීමේදී සිදුවන ප්‍රමාදයත් බරපතළ ගැටලුවක්. එය වළක්වා ගැනීමට නම් මේ පනත් සඳහා වෙනම ම උසාවි පද්ධතියක් ඇති කරගත යුතුයි. පවතින උසාවි පද්ධතියේ මහේස්ත්‍රාත් අධිකරණයේ ලක්ෂ 8ක පමණ නඩු ප්‍රමාද තිබෙනවා. මහාධිකරණයේත් ලක්ෂ 2ක් පමණ තිබෙනවා. දිසා අධිකරණයෙත් එලෙසමයි. මේ උසාවි පද්ධතියේ පවතින ක්‍රමවේදයේ ම පනත් යටතේ තිබෙන නඩුත් විභාග කරන්නට ගියහොත් ඒ සඳහා විශාල කාලයක් ගත වෙනවා. එසේ නම් මේ නඩුවලට ප්‍රමුඛතාව දිය යුතුයි, නැත්නම් පනත් යටතේ තිබෙන නඩු විභාග කිරීමට වෙන ම උසාවි පද්ධතියක් ඇති කළ යුතුයි. සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ නඩුවක් විභාග වන්නේ ඉංග්‍රීසි නීතිය, සාක්ෂි ආඥා පනත වැනි නීති යටතේ. දවසක් නඩුව ඇසුවොත් තව දවස් ගණකට එය කල් යනවා. එසේනම් ත්‍රිපුද්ගල මහාධිකරණ විනිසුරු සභාවක මෙන් අඛණ්ඩ ව මේ නඩු ඇසිය යුතුයි. මේ නිසා කිසියම් විශේෂිත ක්‍රමවේදයක් යොදාගත යුතුයි.

චෝදනාව ඉදිරිපත් කළ පසු පොලිසිය එය විමර්ෂණය කළ යුතුයි. එනම් අධිකරණ ක්‍රියාවලියට එළඹීමට පෙරත් වගකීම් සහගත සංකීර්ණ කාර්යභාරයක් තිබෙනවා ඉටු කිරීමට. එහිදී පොලිස් විමර්ෂණ සඳහා විශේෂ පොලිස් කණ්ඩායම් පිහිටුවා ඒවාට ප්‍රමුඛතාව ලබා නොදුන්නොත් යුක්තිය පසිඳලීම තවත් ප්‍රමාද වෙනවා.

බොහෝ රටවල දූෂණ, වංචා සිදු වන විට අනුගමනය කරන්නේ වෙනස් පිළිවෙතක්. දූෂණය යනු කුමක්ද? එයින් සිදුවන ජාතික සම්පත් පිරිහීම හා රටට සිදුවන අගහිඟතා පිළිබඳ නිසි අධ්‍යයන පාඨමාලා එම රටවල තිබෙනවා. එම පාඨමාලාවලින් 4, 5 ශ්‍රේණිවල සිට ම දරුවන්ට ඒ පිළිබඳ උගන්වනවා. ශ්‍රී ලංකාවේ එවැනි පසුබිමක් නැහැ. නීතිය විෂයක් හැටියට අඩු ම තරමේ 5 ශ්‍රේණියේ සිට හෝ මෙරට විෂය නිර්දේශයට ඇතුළත් කළ යුතුයි.

දියුණු රටවල දූෂණ, වංචා අඩුයි. එම රටවල නීතිය ඉතා ප්‍රබලයි. නීතිය සර්ව සාධාරණයි. අපක්ෂපාතීයි. ඔවුන් දූෂණ, වංචා අවම කරගෙන තිබෙන්නේ දූෂණ, වංචා නඩු උසාවියට එන්න කලින් ඔවුන්ගේ අධ්‍යාපන ක්‍රමයෙන් හැකි උපරිමයෙන් ඒවා වළක්වා ගැනීමට පියවර ගන්නා නිසා.



# රයිසිගේ අවසන් ගමන

නිහාල් පීරිස්



ඉරානයේ ජනාධිපති ඉබ්‍රහිම් රයිසි හෙලිකොප්ටර අනතුරකින් මරණයට පත් වීම ජාත්‍යන්තරයේ විශාල අවධානයක් දිනාගත් සිදුවීමක් විය. මේ අනතුර සිදුවීමට සති කිහිපයකට පෙර ඉරාන ජනාධිපතිවරයා ශ්‍රී ලංකාවේ ද සංචාරයක නිරත වී තිබූ නිසා ඔහුගේ හදිසි අභාවය මෙරට වැසියන්ට ද තදින් ම දැනිණි.

ජනාධිපති රයිසි මේ අනතුරට මුහුණදුන්නේ ඊශ්‍රායල-හමාස් යුද්ධය පසුබිමේ ඉරානය වෙත ද විශාල අවධානයක් යොමු වෙමින් තිබූ පසුබිමක ය. ඉරානය සහ ඊශ්‍රායලය අතර ද ඒ ආසන්න කාලයේ දැඩි ආතතියක් ඇති ව තිබූ බව නොරහසකි. මේ තත්ත්වය හමුවේ ඉරාන ජනාධිපතිවරයාගේ මරණයට ඊශ්‍රායලය සම්බන්ධ ද යන සැකසංකා පවා මතු වූ ආකාරයක් දැකිය හැකි විය.

ඉබ්‍රහිම් රයිසිට මරු කැඳ වූ හෙලිකොප්ටර අනතුර සිදු වූයේ මැයි 19 දිනයි. එම සිද්ධිය වන විට ඔහු සිටියේ ඉරාන-අසර්බයිජාන දේශ සීමාව ආසන්නයේ ජල විදුලි ව්‍යාපෘතියක විවෘත කිරීමක් සඳහා සහභාගි වී ආපසු ඉරානය බලා පැමිණෙමින් ය. මේ විවෘත කිරීමේ අවස්ථාවට අසර්බයිජාන ජනාධිපති ඉල්හාම් අලියේව් ද සහභාගි වී සිටියේ ය. අනතුර සිදුවීමට සුළු වේලාවකට පෙර රයිසි අලියේව් සමග එම විවෘත කිරීම සිදු වූ ස්ථානයේ සිටින අයුරු දක්වෙන ඡායාරූප ආදිය ද මාධ්‍යවල පළ වී තිබිණි.

අනතුර සිදු වන අවස්ථාව වනවිට ජනාධිපතිවරයාගේ හෙලිකොප්ටරය ගමන් කරමින් සිටි ප්‍රදේශය ඝන මීදුමෙන් වැසී තිබූ බව ද ඉතා අයහපත් කාලගුණික තත්ත්වයක් එහි පැවැති බව ද සඳහන් විය. ඊට දිනකට පෙර ඉරාන කාලගුණ විද්‍යා ආයතනය මේ ප්‍රදේශයට අදාළ ව අනතුරු ඇඟවීමක් නිකුත් කර තිබූ බවක් ද මාධ්‍ය වාර්තාවල දක්විණි. අනතුරට හේතුව අයහපත් කාලගුණික තත්ත්වය විය හැකි බවට සැක කෙරිණි. ජනාධිපතිවරයාගේ හෙලිකොප්ටරය සමග ඉරානයේ ඇමැතිවරුන් කිහිපදෙනකු රැගත් තවත් හෙලිකොප්ටර දෙකක් ගමන් කර තිබූ අතර මේ හෙලිකොප්ටර කිසිදු උපද්‍රවයකින් තොර ව ගමනාන්තය වෙත ළඟා වී තිබිණි.

අනතුර සිදු ව තිබුණේ කඳුවලින් ගහන ප්‍රදේශයක ය. එහි භූමි පිහිටීම නිසා ද ඝන මීදුම සහ දැඩි ශීතල නිසා ද හෙලිකොප්ටරය සොයා ගැනීමේ මෙහෙයුම්වලට දැඩි බාධා එල්ල වූයේ ය. අනතුර සිදු වූයේ මැයි 19 දින දහවල් 1.30ට පමණ වුවත් පසු ද අලුයම වන තෙක් ම මෙහෙයුම්වලින් ප්‍රතිඵලයක්

අත්කර ගැනීමට නොහැකි විය. මේ අතර තුර්කිය ලබා දී තිබූ නවීන තාක්ෂණයෙන් යුතු ඩ්‍රෝන යානයකට කඩා වැටුණු හෙලිකොප්ටරය යයි සැක කළ හැකි කිසිවක් දර්ශනය වී තිබිණි. එම ස්ථානයේ පිහිටීම සම්බන්ධයෙන් තුර්කිය ඉරානයට දැනුම් දුන්නේ ය. මේ තොරතුරු ද උපයෝගී කර ගනිමින් පසුදා අලුයම 5.00 ට පමණ හෙලිකොප්ටරයේ සුන්බුන් සොයා ගන්නට ගළවා ගැනීමේ කණ්ඩායම්වලට හැකි විය. හෙලිකොප්ටරය ගිනිගෙන විනාශ වී ඇති ආකාරයත් එහි ගමන් කළ සියලුදෙනා මරණයට පත් ව ඇති ආකාරයත් මේ කණ්ඩායම්වලට දැක ගන්නට ලැබිණි. ජනාධිපති රයිසිට අමතර ව හෙලිකොප්ටරයේ ගමන් කරමින් සිටි ඉරාන විදේශ ඇමැතිවරයා ද තවත් 6 දෙනෙක් ද මේ අනතුරින් ජීවිතක්ෂයට පත් වූහ. ගළවා ගැනීමේ කණ්ඩායම මුලින් ම ජනාධිපතිවරයාගේ සිරුර හඳුනාගෙන තිබුණේ ඔහු පැලඳ සිටි මුදුවකින් බවක් ද කියැවිණි.

ජනාධිපතිවරයා අනතුරකට ලක් වූවා ද නැතහොත් ඔහු ඝාතනය කරනු ලැබුවා ද යන සැකයක් මතු ව තිබූ පසුබිමක මැයි 24 දින නිකුත් වූ මූලික විමර්ශන වාර්තාවක් කාගේත් අවධානය දිනා ගන්නට සමත් විය. මේ වාර්තාව නිකුත් කරනු ලැබුවේ ඉරාන හමුදාවේ විමර්ශන කණ්ඩායමක් විසිනි. අපරාධමය ක්‍රියාවක් පිළිබඳ සාක්ෂි කිසිවක් දැනට හමු වී නැතැයි වාර්තාව සඳහන් කර තිබිණි. හෙලිකොප්ටරය උස් ස්ථානයක ගැටීමෙන් පසු ගිනිගෙන ඇතැයි ද හෙලිකොප්ටරයේ සුන්බුන්වල වෙඩි වැදුණු ලකුණු ආදී කිසිවක් දක්නට නැතැයි ද මේ වාර්තාව තවදුරටත් සඳහන් කරයි. ජනාධිපතිවරයා ගමන් ගත් හෙලිකොප්ටරය නියමිත මාර්ග යේ ම ගමන් කර ඇති බව ද කිසිදු අවස්ථාවක එම මාර්ගයෙන් පිට පැන නොමැති බව ද විමර්ශකයක් පවසා තිබේ. හෙලිකොප්ටරයේ කාර්ය මණ්ඩලය සහ පාලක මැදිරිය අතර සිදු වූ සන්නිවේදනයේ ද සැක කටයුතු කිසිවක් නැති බව වාර්තාවේ සඳහන් ය.

එහෙත් ඇතැම් කාරණා ගැන තවදුරටත් විමර්ශන පැවැත්වීම සඳහා කාලය අවශ්‍ය ව ඇති බව ද ඉදිරියේදී තවත් විස්තර අනාවරණය කෙරෙනු ඇති බව ද විමර්ශකයන් සඳහන් කර තිබිණි.

අනතුර සිදු වී දින හතරකට පසු මැයි 23 දින ජනාධිපතිවරයාගේ උපන් ගම වන මෂාද්හිදී ඔහුගේ අවසන් කටයුතු සිදු කෙරිණි. අතිවිශාල ජනතාවක් ඊට සහභාගි වී සිටිනු ද දැකගත හැකි විය.

රයිසිගේ අභාවය නිසා ඉරාන දේශපාලනයේ යම් අස්ථාවර





වීමක් සිදු විය හැකි බව බොහෝ විශ්ලේෂකයන්ගේ අදහසයි. ඔහුගේ මරණය සිදු වූයේ ඊශ්‍රායල-හමාස් යුද්ධය හමුවේ ඉරානය සහ ඊශ්‍රායලය අතර ද ඉරානය සහ ඇමරිකාව අතර ද අලුත් ගැටලු සහ ආතති වර්ධනය වෙමින් පැවැති පසුබිමක ය. ඉරානය කාලයක සිට ම බටහිර විරෝධී, ඊශ්‍රායල විරෝධී පාර්ශ්වයක් බව රහසක් නොවේ. ඔවුන් ඊශ්‍රායලය සලකන්නේ බටහිර ඉත්තකු ලෙසිනි. මේ වනවිට ඉදිරියට යමින් ඇති ඊශ්‍රායල-හමාස් යුද්ධය පසුබිමේ මේ ආතතිය වඩාත් උත්සන්න වෙමින් තිබේ. මේ තත්ත්වය මත මෙය ඉරානයට ශක්තිමත් නායකත්වයක් අවශ්‍ය ව ඇති වේලාවකි.

එරට උත්තරීතර නායකයා වන අයතොල්ලා අලි-කමේනි ද ඉතා වියපත් ය. 85 වැනි වියෙහි පසුවන ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය ද එතරම් යහපත් නොවන බවට තොරතුරු වාර්තා වෙයි. ඔහු කලක් පුරස්ථි ග්‍රන්ථියේ පිළිකාවකින් ද පීඩා වින්දේ ය. අලි-කමේනිගෙන් පසු රයිසි ඉරානයේ උත්තරීතර නායකයා බවට පත් වනු ඇති බව බොහෝ දෙනාගේ විශ්වාසය විය.

ඉබ්‍රහිම් රයිසි ඉරානයේ ජනාධිපති පදවියට පත් වූයේ 2021 වසරේයි. ඔහු සැලකෙන්නේ දැඩි මතධාරී නායකයකු ලෙසිනි. එරට උප ජනාධිපතිවරයා වන මොහොමඩ් මොක්බර් මේ වනවිට වැඩ බලන ජනාධිපතිවරයායි.

ඉරාන ව්‍යවස්ථාවට අනුව දින 50ක් ඇතුළත ජනාධිපතිවරණයක් පවත්වා නව ජනාධිපතිවරයකු පත් කර ගත යුතු ය. මේ වනවිට පළ වී ඇති වාර්තාවලින් පැවසෙන්නේ ජූනි 28 දින ජනාධිපතිවරණය පැවැත්වෙනු ඇති බවයි.




# ‘ස්ටාර්ලින්ක්’ ජාලයට ශ්‍රී ලංකාවත්

**සුගත් පී.කුලතුංග ආරච්චි**


ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා ඉන්දුනීසියාවේ බාලිහිදී එලොන් මස්ක් මහතා හමුවූ මොහොත

අග්නිදිග ආසියාවේ තුන් වැනි රටත් ‘ස්ටාර්ලින්ක්’ (Starlink) නවතම චන්ද්‍රිකා අන්තර්ජාල සේවාවට මෑතකදී එක් විය. ඒ, 17,000ක් තරම් වූ ලොව විශාලතම දූපත් සමූහය අයත් ඉන්දුනීසියාවයි. මේ අවස්ථාවේදී ම ශ්‍රී ලංකාවේ ඈත දුර ගම්මානවල නව ලෝකයේ අවස්ථා නොලැබී හුදෙකලා වී සිටින දරුවන්ට දියුණු ලෝකය වෙත මංපෙත් විවර කර දෙන මේ අනාගත ලෝකයේ චන්ද්‍රිකා සේවය ලබා ගැනීමේ මංගල කතාබහත් සිදු විය. ඒ, ලෝකප්‍රකට ප්‍රකෝටිපති ව්‍යාපාරික එලොන් මස්ක් සහ ශ්‍රී ලංකා ජනාධිපති රනිල් වික්‍රමසිංහ අතර ය. තව නොබෝ දිනකින් ම මෙරට දරුවන්ට මේ නවතම අධිවේගී, අඛණ්ඩ සහ අවම මිල අන්තර්ජාලය ඔස්සේ ලෝකයේ නවතම දැනුම, රැකියා සහ ආර්ථික අවස්ථා සඳහා නව මංපෙත් විවර වනු නිසැක ය.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ නොබෝද ඉන්දුනීසියාවේ බාලිහි පැවැති 10 වැනි ලෝක ජල සංසදයේ ඉහළ පෙළේ රැස්වීම අතරදී එලොන් මස්ක් හමුවූ අතර පුනර්ජනනීය බලශක්තිය, කෘත්‍රිම බුද්ධිය (AI) සහ ලෝක දේශපාලනය ඇතුළු මාතෘකා රැසක් සාකච්ඡා කළේ ය. ඒ අතර ශ්‍රී ලාංකික දරුවන්ගේ අධ්‍යාපනය පහසු කිරීම සඳහා ඔහුගේ ‘ස්ටාර්ලින්ක්’ චන්ද්‍රිකා අන්තර්ජාල සේවාව දියත් කිරීම සඳහා මේ වසරේ ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ජනාධිපති රනිල් වික්‍රමසිංහ කළ ආරාධනය එලොන් මස්ක් පිළිගත්තේ ය. ‘ස්ටාර්ලින්ක්’ සේවාව ශ්‍රී ලංකාවේ දියත් කිරීම සඳහා එලෝන් මේ වනවිට ද අයදුම්පතක් එවා ඇති අතර එම ක්‍රියාවලිය කඩිනම් කිරීමට ජනාධිපතිවරයා එකඟ වී තිබේ.

මැයි 28 දින වන විට ‘ස්ටාර්ලින්ක්’ අන්තර්ජාලය ශ්‍රී ලංකාවේ පෙර-ඇණවුම සඳහා විවෘත ව වී තිබූ අතර මහජනතාවට සම්පූර්ණයෙන් ම ආපසු ගෙවන ඇමරිකානු ඩොලර් 9ක තැන්පතුවක් ගෙවා ‘ස්ටාර්ලින්ක්’ වෙන් කරවා ගැනීමේ අවස්ථාව සලසා හමාර ය. එක් එක් ආවරණ ප්‍රදේශයේ ප්‍රථමයෙන් පැමිණෙන්නන්ට ප්‍රථමයෙන් සේවය යන පදනම මත ඇණවුම් ඉටු කිරීමට ඔවුන් සැරසේ.

‘ස්ටාර්ලින්ක්’ යනු වීඩියෝ, ඇමතුම්, මාර්ගගත ක්‍රීඩා සහ අඛණ්ඩ දත්ත ප්‍රවාහ ඇතුළු තවත් බොහෝ දේ සඳහා ඉහළ ම සහයක් ලබා දිය හැකි බ්‍රෝඩ්බෑන්ඩ් අන්තර්ජාල සබඳතා ලබාදීමට පහත් පෘථිවි කක්ෂයක් භාවිත කරන ලොව ප්‍රථම සහ විශාලතම අන්තර්ජාල සේවා චන්ද්‍රිකා සමූහයයි. එනම් ‘ස්ටාර්ලින්ක්’ යනු ලොව ඉතා ම දුෂ්කර දුරස්ථ ස්ථානවලට පවා ඉතාමත් අඩු ම මිලට, වේගවත් ම අන්තර්ජාල සේවා අඛණ්ඩ ව සැපයීමට තැනූ චන්ද්‍රිකා ජාලයයි. අභ්‍යවකාශ යානා සහ කක්ෂයේ මෙහෙයුම් යන අංශ දෙකෙහි ම ගැඹුරු අත්දැකීම් සහිත මේ ආයතනය සතු දියුණු චන්ද්‍රිකා සහ පරිශීලක දෘඩාංග උපයෝගී කරගනිමින් ‘ස්ටාර්ලින්ක්’ ලොව පරිශීලකයන්ට අධිවේගී, අප්‍රමාද සහ අඛණ්ඩ අන්තර්ජාල සබඳතා ලබා දීමට සමත් ව සිටියි.

මේ දියුණු තාක්ෂණය සහිත ‘ස්ටාර්ලින්ක් මංගල සේවාව ඉන්දුනීසියාවේ දූපත් 02ක සෞඛ්‍ය මධ්‍යස්ථාන 03කදී එලෝන් මස්ක්ගේ ප්‍රධානත්වයෙන් නොබෝද ඇරඹිණි. ඒ, මලුකුහි දුරස්ථ දූපතක් වන අරූ සහ බාලි දූපතේ ය. මේ අනුව දුර බැහැර ප්‍රදේශවල හුදෙකලාව සිටි මිලියන 270කට අධික ඉන්දුනීසියානුවන්ට සෙසු ලෝකය හා එක්වීමට ‘ස්ටාර්ලින්ක්’ නවීන ඩිජිටල් පාලමක් තනා දී හමාර ය.

මෙලෙසින් මැලේසියාව 2023 වසරේ ’ස්ටාර්ලින්ක්’ සේවා ලබා ගැනීමට එක් විය. පිලිපීනය පදනම් කරගත් සමාගමක් 2022දී ගිවිසුමක් අත්සන් කළේ ය. යුක්රේනයේ ද ‘ස්ටාර්ලින්ක්’ බහුල ව



ස්ටාර්ලින්ක් චන්ද්‍රිකා



එලොන් මස්ක්





භාවිත වන ප්‍රමුඛ සේවාවයි. 'ස්ටාර්ලින්ක්' එරට හමුදාව, රෝහල්, ව්‍යාපාර සහ ලෝක ආධාර සංවිධාන පවා ප්‍රයොජයට ගනියි. ඊළඟට ආසියාවේ 'ස්ටාර්ලින්ක්' ජාලයට එක්වන රට ලෙස ශ්‍රී ලංකාව යෝජනා වී ඇත.

ඇමරිකානු සමාගමක් වන 'ස්ටාර්ලින්ක්' මේ වන විට රටවල් 75කට අධික සංඛ්‍යාවකට අන්තර්ජාල සේවා සාර්ථක ව සපයන අතර නාසා ආයතනයටත් සේවා සපයන එය දැනට ඇති ප්‍රබල අභ්‍යවකාශ සේවා සමාගමක් වන SpaceXහි පූර්ණ අනුබද්ධිත ආයතනයකි.

ලෝක ගෝලය ම ආවරණය වන පරිදි චන්ද්‍රිකා 42,000කින් සුසැදි මහා ජාලයක් තැනීම මේ සමාගමේ අරමුණයි. මූලික වටයට අයත් චන්ද්‍රිකා 5,874ක් 2024 අප්‍රේල් වන විට කක්ෂගත ව තිබුණි. ඉන් 5,800ක් ම යහතින් ක්‍රියාත්මක බව තහවුරු ව තිබේ. 'ස්ටාර්ලින්ක්' චන්ද්‍රිකාවක ආයුකාලය ආසන්න වශයෙන් වසර 05කි 'ස්ටාර්ලින්ක්'හි ඉලක්කය ලොව ප්‍රවාහනය දුෂ්කර, අන්තර්ජාල පහසුකම් ලබා දීම පවා අපහසු, එහෙයින් සංවර්ධනයෙන් හුදෙකලා වූ ලෝකයේ බිලියන 4ක පමණ ජනතාව වෙත බ්‍රෝඩ්බෑන්ඩ් පහසුකම ඔස්සේ ඩිජිටල් පාලම් තනාදීමයි.

බොහෝ චන්ද්‍රිකා ආශ්‍රිත අන්තර්ජාල සේවා ලබා දෙන්නේ ග්‍රහලෝකය වටා කිලෝමීටර් 35,786ක උසකින් කක්ෂගත ව ඇති තනි භූස්ථායී චන්ද්‍රිකාවකිනි. එහි ප්‍රතිඵලයක් වශයෙන් පරිශීලකයා සහ චන්ද්‍රිකාව අතර දත්ත හුවමාරුව කෙටිකාලීන කවුළුවකට සීමා වෙයි. චන්ද්‍රිකාව පොළොව වටා ගොස් එන්නට යන විශාල කාලය අතර දත්ත ලැබීමේ ප්‍රමාදයක් සිදු වේ. තනි චන්ද්‍රිකා සබඳතාවකදී මේ කාලය ඉතා ඉහළ වන අතර අඛණ්ඩ දත්ත ප්‍රවාහයක් අවශ්‍ය ක්‍රියාකාරකම් සඳහා ලැබෙන සහය අවම වේ. එහෙත් 'ස්ටාර්ලින්ක්' යනු පෘථිවියට වඩා කි.මී. 550ක් පමණ මෑතදුරකින් පෘථිවිය වටා කක්ෂගත වන සහ ලොව ම ආවරණය කරන චන්ද්‍රිකා දහස් ගණනකින් සමන්විත මණ්ඩලයකි. මේ නිසා Starlink චන්ද්‍රිකා ඔස්සේ අඛණ්ඩ සබඳතාවක් ඕනෑ ම තැනකට ලබා දීම පහසු ය.

මේ සමාගම පවසන ආකාරයට ඈත දුෂ්කර ස්ථානවල අතරමංවූවන්ට, යුද බියෙන් අවතැන්වූවන්ට, හදිසි ආපදා සහ ස්වාභාවික විපත් ආදියෙන් හුදෙකලාව අතුරුදන් ව යන්නන්ට ඉතා ඉක්මනින් ම ලෝකය හා එක් ව ආධාර ලබා ගැනීමට මෙය මහඟු සේවාවකි. දැනුම සැණින් ම ලොව ඕනෑ ම කෙළවරකට ක්ෂණික ව ලබා දීම සඳහා විශිෂ්ට ඩිජිටල් අවකාශයකි.

දැනට 'ස්ටාර්ලින්ක්' උපරිම බාගත කිරීමේ වේගය 114 Mbps පමණ වේ. එය ඊළඟ පරම්පරාවට අයත් 5G තාක්ෂණයට 20 Gbps දක්වා වේගයක් ලබා දෙයි. මේ නව වේගවත් සම්බන්ධතාවට දොර විවෘත කරදෙන එක ම යතුර 'ස්ටාර්ලින්ක්' ඔස්සේ ලබා ගත යුතු Wi-Fi රවුටරය සහ ඇන්ටෙනාව පමණකි. තනි චන්ද්‍රිකාවක කදම්භයකින් ආවරණය වන කලාපය සැතපුම් 15 (කිලෝමීටර් 24.13) කි.

තෝරා ගන්නා තනි සබඳතා සැකසුම සහ 'ස්ටාර්ලින්ක්' වින්‍යාසය අනුව උපාංග 128-254 අතර සංඛ්‍යාවක් එක් වරකට සම්බන්ධ කළ හැකි ය. එහෙයින් අන්තර්ජාල උපාංග කිහිපයක් ම තම නිවසේ ඇති පුද්ගලයන් සඳහා 'ස්ටාර්ලින්ක්' යනු විශිෂ්ට තේරීමකි. දිගුකාලීන, කෙටිකාලීන කොන්ත්‍රාත්තු රහිත විකල්පයක් සොයන්නේ නම් සහ ඕනෑ ම වේලාවක අන්තර්ජාල සේවාව අවලංගු කිරීමට අවශ්‍ය නම්, 'ස්ටාර්ලින්ක්' යනු හොඳම තේරීමයි. දැනට 'ස්ටාර්ලින්ක්' සම්මත නේවාසික සේවාවකට මසකට ඩොලර් 120ක් පමණ වැය වේ.

එය දැනට ඇති Hughesnet සහ Viasat වැනි තරගකාරි සමාගම්වලට සාපෙක්ෂ ව විස්මිත වේගයකින් අසීමිත දත්ත පහසුකම (unlimited data) ලබා දෙයි. ඊටත් වඩා වේගවත් අන්තර්ජාල සේවාවක් අවශ්‍ය හෝ ව්‍යාපාර හිමි පුද්ගලයන් සඳහා Starlink Priority යනු ඔවුන් සකසා ඇති සැලැස්මයි.

ශ්‍රී ලංකාවට මේ සේවාව ලැබුණහොත් එය රටේ මහඟු සංවර්ධනයකට මඟ විවර කිරීමක් වනු නියත ය. අවම මිල, වේගවත් සබඳතාව සහ කඩිනම් සේවාව නිසා එය අනාගත ලෝකයේ නැතුව ම බැරි ජාල සේවා පොදු ආයතනය බවට දැනටමත් පත් ව හමාර ය.




# ආර්ථික පරිවර්තනයේ හැරවුම් ලක්ෂ්‍යය

චන්දන මාරසිංහ

ශ්‍රී ලංකා ආර්ථිකය වඩාත් ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම සඳහා විවිධ කාලවකවානුවල පැවති ආණ්ඩු නොයෙකුත් ක්‍රියාමාර්ග ගෙන තිබේ. ඒ අතර ආර්ථිකය සම්බන්ධ නීතිමය විධිවිධාන ගෙන ඒම ද සුවිශේෂ ය. ඒ අනුව වඩාත් තීරණාත්මක පනත් කෙටුම්පත් දෙකක් නොබෝදා (මැයි 22) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි. එලෙස ඉදිරිපත් වූයේ යළි ආර්ථික බිඳ වැටීමක් සිදු නොවීමට අදාළ ව 'ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පත' (**Economic Trasfomation Bill**) සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ප්‍රශස්ත මට්ටමක පවත්වාගෙන යාම වෙනුවෙන් 'රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත' (**Public Financial Managment Bill**)යි. මෙවර දෙසතිය කවරයේ කතාවේ කතාබහ සිදු වන්නේ 'ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පත' ඉදිරිපත් කිරීම කෙතරම්දුරට සාධනීය වන්නේ ද? යන්න විමසා බැලීම යි.

## වත්මන් ආර්ථිකයේ පිළිබිඹුව

නිදහසින් පසු වාර්තා වූ දරුණුතම ආර්ථික පසුබෑම පසු කරමින් 2023 වසර වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පැමිණීමක් පෙන්නුම් කර තිබේ. තීරණාත්මක ප්‍රතිපත්ති ගැළපුම් සහ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ද ඊට ඉවහල් විය. ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වාදෙන ආකාරයට ආර්ථික අර්බුදයෙහි මූලය වූ දිගු කාලයක සිට පවතින සමස්ත රාජ්‍ය අයවැය හිඟය සහ විදේශීය ජංගම ගිණුමේ හිඟය නිවැරදි වීමේ ලක්ෂණ පෙන්වා දී තිබේ.

මෙරට ආර්ථිකය 2023 වසරේදී 2.3%ක අඩු සංකෝචනයක් ලෙස සටහන් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ධනාත්මක වර්ධනයක් ද වාර්තා වී තිබේ. උද්ධමනය පහත වැටීම හා විදේශීය අංශයේ අවහිරතා ලිහිල් වීම ද සාර්ව ආර්ථික ස්ථාවරත්වයට හේතු විය. 2023 වසරේදී දළ දේශීය නිෂ්පාදිතය 14.8%කින් වර්ධනය වී ඇත.

ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව පෙන්වාදෙන ආකාරයට 2022 වසරේදී මිලියන 8.547ක් වූ ආර්ථික වශයෙන් සක්‍රිය නැතහොත් ශ්‍රම බලකාය 2023 වසරේදී මිලියන 8.408ක් දක්වා පහත වැටී ඇත. සේවා වියුක්ත ජනගහනය හා ශ්‍රම බලකාය පහත වැටීම හේතුවෙන් සේවා වියුක්ති අනුපාතය 2022 වසර හා සැසඳීමේදී 2023 වසරේ 4.7%ක අගයක් ලෙස වෙනස් වී ඇත. සේවා නියුක්ති ජනගහනය 2022 වසරේදී මිලියන 8.148කි. 2023 වසරේදී එය මිලියන 8.010ක් ලෙස පහත වැටී ඇත. විදේශ රැකියා සඳහා පිටත් ව යාමත් 2022 වසරට සාපේක්ෂ ව 2023 වසරේදී 4.5%කින් අඩු වී තිබේ. එම වසරේදී විදෙස්ගත වූ පිරිමින්ගේ ප්‍රතිශතය 55.3%ක් වන අතර කාන්තාවන්ගේ එම ප්‍රතිශතය 44.7%ක් විය. 2023 වසර අවසන් වන විට විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඇමරිකානු ඩොලර් මිලියන 5969.6ක් ලෙස සටහන් විය. 2023 වසරේ අවසන් කාර්තුවේදී වැඩි ම විදෙස් ප්‍රේෂණ ප්‍රමාණයක් ලැබී තිබෙන්නේ කුවේට්, කටාර් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙනි. 2023 වසරේ ශ්‍රමිකයන් 297,656ක් විදේශ රැකියා සඳහා පිටත් ව ගොස් ඇති බව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පෙන්වා දී තිබේ.

මෙරට විදේශ අංශය ද පසුගිය කාලයේ ශක්තිමත් ලෙස වර්ධනය විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ආරම්භ කිරීම හා එය සාර්ථක ලෙස පවත්වාගෙන යාම ද ඊට ඉවහල් වී ඇත. විදේශීය ජංගම ගිණුම ද පසුගිය වසරේදී අතිරික්තයක් වාර්තා කර ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව සඳහන් කරයි. වෙළෙඳ හිඟය සැලකිය යුතු ලෙස අඩුවීම,

සේවා අපනයනය සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සැලකිය යුතු ලෙස ලැබීම ද ඊට හේතු ලෙස පෙන්වා දිය හැකි ය. 2023 වසරේදී අපනයන ආදායම වාර්තා වූයේ ඇමරිකානු ඩොලර් බිලියන 11.9ක් ලෙස ය. එය 2022 වසරට සාපේක්ෂ ව 9.1%ක අඩුවීමකි. ඊට හේතු වූයේ ශ්‍රී ලංකාවේ අපනයන මිලදී ගන්නා රටවල ජීවන වියදම ඉහළ යාම හා ආර්ථික අවපාත ඇතිවීමයි. භූ දේශපාලන ගැටලු ද ඊට ඉවහල් විය.



මෙරට ආර්ථිකය 2023 වසරේදී 2.3%ක අඩු සංකෝචනයක් ලෙස සටහන් විය. දළ දේශීය නිෂ්පාදිතයේ ධනාත්මක වර්ධනයක් ද වාර්තා වී තිබේ. උද්ධමනය පහත වැටීම හා විදේශීය අංශයේ අවහිරතා ලිහිල් වීම ද සාර්ව ආර්ථික ස්ථාවරත්වයට හේතු විය. 2023 වසරේදී දළ දේශීය නිෂ්පාදිතය 14.8%කින් වර්ධනය වී ඇත.

## ආර්ථික පරිවර්තන පනතෙන් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන ඉලක්ක

- දළ දේශීය නිෂ්පාදිතයට රාජ්‍ය ණය දක්වන අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන්පසුව 95%කට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.
- දළ දේශීය නිෂ්පාදිතයට මධ්‍යම රජයේ වාර්ෂික දළ මුදල් සැපයීමේ අවශ්‍යතා අනුපාතය 2032 වර්ෂය වන විට සහ ඉන් පසුව 13%කට වඩා අඩුවෙන් පවත්වා ගැනීම.
- දළ දේශීය නිෂ්පාදිතයට මධ්‍යම රජයේ වාර්ෂික ණය සේවාකරණ අනුපාතය 2027 වර්ෂය වන විට සහ ඉන්පසුව 4.5%කට වඩා අඩු මට්ටමක පවත්වා ගැනීම.
- 2025 වර්ෂයේ සිට විරැකියාව ශ්‍රම බලකායෙන් 5%කට වඩා අඩු මට්ටමකට ළඟා කර ගැනීම.
- ණය ප්‍රතිව්‍යුහගත කිරීම.
- තරගකාරීත්වය වැඩි කිරීම සඳහා ජාතික ආර්ථිකය විවිධාංගීකරණය කිරීම සහ දැඩි ව්‍යුහාත්මක වෙනස්කම් සිදුකිරීම.
- 2050 වර්ෂය වන විට ශුද්ධ (Net Zero) ශුන්‍යයක් ළඟා කර ගැනීම.
- ගෝලීය ආර්ථිකය සමග ඒකාබද්ධ වීම වර්ධනය කිරීම.
- ස්ථාවර සාර්ව ආර්ථික තුලනයක් සහ තිරසර ණය සාක්ෂාත් කර ගැනීම.
- ගොවියන්ගේ ඵලදායිතාව, ගොවියන්ගේ ආදායම සහ කෘෂිකාර්මික අපනයන ඉහළ නැංවීම සඳහා කෘෂිකර්මය නවීකරණය කිරීම.
- පූර්ණ ආර්ථික වර්ධනය සහ සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම.




- ශ්‍රී ලංකාව ඉහළ තරගකාරීත්වයක් සහිත, අපනයනය වෙත යොමු වූ ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම.
- දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2027 වර්ෂය වන විට වාර්ෂික ව 5%ක් දක්වා ළඟා කර ගැනීම සහ ඉන්පසුව වාර්ෂික ව 5%කට වඩා ඉහළ මට්ටමකට ගෙන ඒම.
- කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය 2030 වර්ෂය වන විට 40%කට නොඅඩු මට්ටමක් වෙත ගෙන ඒම සහ 2040 වර්ෂය වන විට 50%කට නොඅඩු මට්ටමක් වෙත ගෙන ඒම.
- ගෙවීම් ශේෂයෙහි ජංගම ගිණුමේ හිඟය වාර්ෂික ව දළ දේශීය නිෂ්පාදිතයෙන් 1%ක් නොඉක්මවිය යුතු වීම.
- දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස භාණ්ඩ හා සේවා අපනයනය කිරීම 2025 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 25%කට නොඅඩු මට්ටමකට ළඟාවීම, 2030 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 40%කට නොඅඩු මට්ටමකට ළඟා වීම සහ 2040 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 60%ක මට්ටමකට ගෙන ඒම.
- දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ශුද්ධ සෘජු විදේශ ආයෝජන 2030 වර්ෂය වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් 5%කට නොඅඩු මට්ටමකට ළඟා වීම සහ 2030 වර්ෂය වන විට ශුද්ධ සෘජු විදේශ ආයෝජනවලින් අවම වශයෙන් 40%ක්වත් භාණ්ඩ අපනයනය හෝ සේවා අපනයනය මගින් වන මට්ටමකට ගෙන ඒම.
- 2032 වර්ෂය දක්වා රජයේ ප්‍රාථමික ශේෂය දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.3%ක මට්ටමකට සහ 2032 වර්ෂයේ සිට ඉදිරියට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 2%ක මට්ටමකට ගෙන ඒම
- 2027 වර්ෂයෙන් ඉදිරියට රජයේ ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් අවම වශයෙන් 15%ක මට්ටමකට ගෙන ඒම.
- 2027 වර්ෂය වන විට බහුමාන ජනගහන දරිද්‍රතා අනුපාතය 15%කට වඩා අඩු විය යුතු අතර 2035 වර්ෂය වන විට එය 10%කට වඩා අඩුවිය යුතු වීම.

රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම පහළ යාම සඳහා ප්‍රධාන ලෙස බලපා තිබුණේ එම කාරණයයි. 2023 වසරේදී ආනයන වියදම්වල ද කැපී පෙනෙන පහළ යාමක් දක්නට ලැබිණ. අත්‍යවශ්‍ය නොවන ආනයන සීමා කිරීම සහ ජනතාවගේ වියදම් කිරීමේ හැකියාව සීමා වීම ද ඊට හේතු වී තිබේ. ඒ අනුව 2023 වසරේදී ආනයන වියදම ඇමරිකානු ඩොලර් බිලියන 16.81ක් දක්වා අඩු විය. එය ප්‍රතිශතයක් ලෙස 8.1%කින් අඩුවීමකි.

දැඩි ආර්ථික පසුබෑමෙන් අනතුරු ව 2024 වන විට මෙරට ආර්ථිකය 2.2%ක වර්ධනයක් අත්කර ගන්නා බව ලෝක බැංකුව පුරෝකථනය කර තිබේ. එහෙත් රට තවමත් ඉහළ දරිද්‍රතා මට්ටමක පවතින අතර ආදායම් අසමානතාව දක්නට ලැබේ. 2023 වසරේ ශ්‍රී ලාංකිකයන්ගෙන් 25.9%ක් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත් වන බවට ඇස්තමේන්තු කර තිබේ. නාගරික ප්‍රදේශවල කාන්තා ශ්‍රම බලකායේ පහත වැටීමක් ද තිබේ. ආහාර, සෞඛ්‍ය හා අධ්‍යාපන වියදම් ඉහළ යාම ද මෙරට ජනතාව ණය ගැනීමට යොමුවීමට ප්‍රබල හේතුවක් බව ලෝක බැංකුව අවධාරණය කර සිටී. දකුණු ආසියාව ලොව ආර්ථික වර්ධනය වේගයෙන් ම සිදු වන කලාපයක් වන අතර 2024 වසරේදී එය 6.0ක් වනු ඇතැයි පුරෝකථනය කර තිබේ

ආර්ථික අපහසුතා හේතුවෙන් අවදානමට ලක්වන පුද්ගලයන්ගෙන් 82%ක් ජීවත් වන්නේ ග්‍රාමීය ප්‍රදේශවල ය. වතුකර ප්‍රජාව ද එවැනි පීඩාවලට ලක් වී ඇති බව ආසියා සංවර්ධන බැංකුව පෙන්වා දී ඇත. මාතෘ සහ ළමා මන්දපෝෂණය මානව ප්‍රාග්ධන සංවර්ධනයට ප්‍රබල තර්ජනයකි. ආර්ථිකය ප්‍රකෘතිමත් කිරීමේදී මූලික අවධානය යොමු කළ යුතු වන්නේ සමාජ ආරක්ෂණ පද්ධතිය සඳහා ආයතනික හා ව්‍යුහාත්මක රාමුවක් සැකසීමට ය. 'අස්වැසුම' වැනි වැඩසටහන්වලින් ඊට අවශ්‍ය පහසුකම් සැලසිය හැකි ය. මූල්‍ය සාක්ෂරතාව සහ අධ්‍යාපනික මට්ටම වැඩිදියුණු කිරීමෙන් යහපත් ආර්ථික ක්‍රියාවලියක් අත්පත් කර ගැනීමට පහසුකම් සැලසේ. ස්ත්‍රී පුරුෂ අසමානතාව ආමන්ත්‍රණය කිරීම ප්‍රමුඛතාවකි.

## ආර්ථිකයේ නව හැරවුම

ආර්ථිකයේ දෘශ්‍යමාන වන මේ කාරණා සලකා බලමින් වත්මන් ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන 'ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පත' ආර්ථිකයේ නව හැරවුමක් ලෙස ඇතැම් විද්වත්හු පෙන්වා දෙති. බිඳ වැටුණු ආර්ථිකය ස්ථාවර කර යහපත් මට්ටමින් පවත්වාගෙන යාම එහි අරමුණකි.

'ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පත' ඉදිරිපත් කිරීමෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද? යන්න 2024-05-14 දින මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නියමය පරිදි පළ කරන ලද ගැසට් පත්‍රයේ සඳහන් වේ. එයට අනුව "ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය සඳහා විධිවිධාන සැලසීම සඳහා සහ ශ්‍රී ලංකා ආර්ථික කොමිෂන් සභාව, ශ්‍රී ලංකා ආයෝජන කලාප, ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය, ජාතික ඵලදායිතා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සහ ජාත්‍යන්තර වෙළෙඳ ආයතනය පිහිටුවීම සඳහා ද; ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත ඉවත් කිරීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ අනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි".

මෙය ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කරන්නේ

> භාණ්ඩ හා සේවා අපනයනය 2040 වසර වන විට වර්ධනය කිරීම ද ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ මූලික සැලසුම්වලට ඇතුළත් ය. ඒ අනුව 2040 වසර වන විට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 60%ක මට්ටමට ළඟා විය යුතු ය. අභ්‍යන්තරය කෙරෙහි යොමු වූ ආර්ථිකයක සිට බාහිරට යොමු වූ ආර්ථිකයක් දක්වා ශ්‍රී ලංකාව පරිවර්තනය කිරීම එහි අරමුණ ය.

විශේෂයෙන් රාජ්‍ය ණය, ජාතික ආර්ථිකය විවිධාංගීකරණය, කෘෂිකර්මය නවීකරණය, දරිද්‍රතාව, විරැකියාව, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය, භාණ්ඩ හා සේවා අපනයනය, විදේශ ආයෝජන, අපනයනය වැනි ක්ෂේත්‍රවලට විශේෂිත ඉලක්ක ඔස්සේ ය.

දළ දේශීය නිෂ්පාදනයේ වර්ධනය 2027 වර්ෂය වන විට වාර්ෂික ව 5%ක් දක්වා ළඟා වීම ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පතෙහි ඉලක්කයක් ලෙස දක්වා තිබේ. 2048 වසර වන විට උසස් ආර්ථික තත්ත්වයක් ළඟා කර ගැනීම සඳහා 2030 වසරට පසුව මූලික වර්ධනය 5%කට වඩා ඉහළ මට්ටමක් දක්වා වේගවත් කිරීම මෙහි අවශ්‍යතාවකි.

භාණ්ඩ හා සේවා අපනයනය 2040 වසර වන විට වර්ධනය කිරීම ද ආර්ථික පරිවර්තන පනත් කෙටුම්පතේ මූලික සැලසුම්වලට ඇතුළත් ය. ඒ අනුව 2040 වසර වන විට එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 60%ක මට්ටමට ළඟා විය යුතු ය. අභ්‍යන්තරය කෙරෙහි යොමු වූ ආර්ථිකයක සිට බාහිරට යොමු වූ ආර්ථිකයක් දක්වා ශ්‍රී ලංකාව



පරිවර්තනය කිරීම එහි අරමුණ ය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළෙඳ හවුල්කරු ලෙස අඛණ්ඩ ව ක්‍රියා කළේ ඉන්දියාවයි. ඉන් පසු චීනය හා ඇමරිකාව අනෙකුත් ප්‍රධාන හවුල්කරුවන් විය. 2023 වසරේදී මේ රටවල් ත්‍රිත්වය ශ්‍රී ලංකාවේ සමස්ත වෙළෙඳ ගනුදෙනු ප්‍රමාණයට 37% කින් පමණ දායක විය. මීට අමතර ව බ්‍රිතාන්‍යය, ඉතාලිය හා ජර්මනිය වැනි රටවල් සමග ද ශ්‍රී ලංකාව ගනුදෙනු කර තිබේ. නිදහස් වෙළෙඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා කිරීම ද ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පතේ ඉලක්කයකි. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළෙඳ ගිවිසුම, ඉන්දියාව සමග ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම මෙන් ම පාකිස්තාන ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම ද ඊට අයත් ය. ගෝලීය ආර්ථිකය සමග ඒකාබද්ධ ව කටයුතු කිරීමට ද ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පතෙන් අවධානය යොමු කර තිබේ.

2022 වසරේ මිලියන 8.5ක ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනයෙන් කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය 32.1%ක් පමණ විය. එය ආර්ථික අර්බුදයට පෙර 2018 වසරේදී 33.6%ක මට්ටමක පැවතිණි. ආසියා සංවර්ධන බැංකුව පෙන්වාදෙන ආකාරයට ඊට ප්‍රධාන ලෙස හේතු වී තිබෙන්නේ ආරක්ෂිත හා දැරිය හැකි ළමා ආරක්ෂණ පහසුකම් නොමැතිවීම, නම්‍යශීලී වැඩ කරන වේලාව සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම, කාන්තාවන්ට පවරා ඇති භාරදූර ගෘහස්ථ වගකීම් සහ කාන්තාවන් වෙනුවෙන් පොදු ප්‍රවාහන පහසුකම් දුර්වල වීම ආදියයි. මේ ගැටලුවලට විසඳුම් ලබාදීමෙන් කාන්තා ශ්‍රම දායකත්වය ඉහළ නංවා ගැනීමට හැකියාව පවතී. ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත ක්‍රියාත්මක වීමේදී ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු ය. 2025 වසරේ සිට විරැකියාව ශ්‍රම බලකායෙන් 5%කට වඩා අඩු මට්ටමකට ළඟා වීම ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පතේ අපේක්ෂිත කරුණකි. කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය 2030 වසර වන විට 40%කට නොඅඩු මට්ටමක් වෙත ළඟා වීමට සැලසුම් කර ඇත. ශ්‍රම ඵලදායිතාව සහ ආර්ථිකයේ සැලකිය



යුතු වර්ධනයක් ළඟා කර ගැනීමට ඉන් හැකියාව පවතී.

අවිධිමත් රැකියා විධිමත් කිරීම හා කම්කරුවන් සූරා කෑමෙන් ආරක්ෂා කිරීමට කම්කරු නීති ප්‍රතිසංස්කරණය ද මූලික අවශ්‍යතාවකි. එහිදී මහජන සේවා සඳහා වන ප්‍රවේශය වැඩි කිරීමට ද රජයේ අවධානය යොමු කළ හැකි ය. ගුරු පුහුණුව, නවීකරණය කළ විෂය මාලා සහ ඩිජිටල්කරණය ද ඒ සඳහා යොදා ගැනීමේ හැකියාව පවතී.

කෘෂිකර්මාන්තයේ ශ්‍රම බලකායේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම, ගොවියන් සම්බන්ධ ගැටලු නිරාකරණය, ඉඩම් ඵලදායිතාව වර්ධනයට ආයෝජනය කිරීම සහ කෘෂිකාර්මික අපනයනවලට වැඩි අගයක් එකතු කිරීම සහ විවිධාංගීකරණය ප්‍රවර්ධනය ඔස්සේ කෘෂිකර්මාන්තය නවීකරණය කළ හැකි ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පෙන්වාදෙන ආකාරයට මෙරට ආර්ථික තත්ත්වය ක්‍රමයෙන් දියුණු වෙමින් පවතී. ආර්ථික ප්‍රතිසංස්කරණය පිළිබඳ දෙවැනි සමාලෝචනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ නිලධාරීන් කණ්ඩායමක් ශ්‍රී ලංකා බලධාරීන් සමග එකඟතාවකට පැමිණ තිබේ. ශ්‍රී ලංකා ආර්ථිකය මේ වන විට ප්‍රකෘතිමත් වීමේ මාවතකට අවතීර්ණ වී ඇති බව Xinhua ප්‍රවෘත්ති සේවය වාර්තාවක් නිකුත් කරමින් පෙන්වා දී ඇත. කෙසේ වෙතත් ආර්ථිකයේ බලපෑම අවම කිරීම සඳහා තිරසර වැඩපිළිවෙළක් අවශ්‍ය බවත් එම වාර්තාවේ සඳහන් ය.

වයස අවුරුදු 15ට වැඩි පුද්ගලයන්ගෙන් ශ්‍රී ලංකාවේ ඕනෑ ම ගිණුමක් හිමි පුද්ගල ප්‍රතිශතය 89%කි. එය දකුණු ආසියාවේ 60%ක් වන අතර පහළ මැදි ආදායම් ලබන රටවල 62%ක් ලෙස දැක්වෙන බව මූල්‍ය සාක්ෂරතා මාර්ගෝපදේශ වාර්තාව සඳහන් කර ඇත. එසේම 65.8%ක් වූ දකුණු ආසියාතික ගිණුම් හිමි කාන්තාවන්ගේ සාමාන්‍යය සමග සසඳන විට මෙරට ගිණුම් හිමි කාන්තාවන්ගේ ප්‍රතිශතය 89.3%කි. මෙරට කාන්තාවන්ගෙන් අඩකට ආසන්න සංඛ්‍යාවක් වසරක් ඇතුළත ඩිජිටල් ගනුදෙනු සිදුකර ඇති බවත් ශ්‍රී ලංකා මහ බැංකුව සිදු කළ සමීක්ෂණයකින් හෙළිවී තිබේ. කෙසේ වෙතත් ජාත්‍යන්තර මට්ටමින් සසඳන විට ශ්‍රී ලාංකිකයන්ගේ මූල්‍ය දැනුම ධනාත්මක මූල්‍ය හැසිරීම් බවට පරිවර්තනය කිරීමේ ගැටලුවක් පවතින බව ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දී ඇත.

ආර්ථිකයේ වර්ධනය ඇතුළු මේ කාරණා සමගින් ව්‍යවසායකයන්ට මෙන් ම පොදු සමාජයට ද මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ අවබෝධය තිබීම වැදගත් වේ. එහිදී සිදුවන්නේ ඉතා අපහසුවෙන් හෝ උපයන මුදල නිසි පරිදි පරිහරණය කිරීම සම්බන්ධයෙන් දැනුම හා කුසලතා අත්පත් කර ගැනීම ය. ඒ අනුව මුදල් ඉපයීම, වියදම් කිරීම, ඉතිරි කිරීම, ණය ගැනීම හා මුදල් ආයෝජනය නිවැරදි ක්‍රමවේදයකට අනුව සිදුවිය යුතු ය. ඊට පහසුකම් සලසා ගත හැක්කේ ප්‍රධාන ආදායම් මාර්ගය මෙන් ම අතිරේක ආදායම් මාර්ග ඇතිකර ගැනීමෙනි. අනවශ්‍ය වියදම් කපා හැරීමත් මූලික අවශ්‍යතාවකි. ආර්ථික අර්බුදයක් පැවතියත් නොපැවතියත් පුද්ගල හෝ නිවාස මට්ටමින් ආදායම් නිසි කළමනාකරණයකින් පවත්වාගෙන යෑම සෑම පුද්ගලයකු ම අවධානය යොමු කළ යුතු කරුණකි.

# ආර්ථික දිශානතිය නිවැරදි ව මෙහෙයවීමයි අරමුණ



**ශෙහාන් සේමසිංහ**
මුදල් රාජ්‍ය අමාත්‍ය

‘ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පත’ (Economic Transformation Bill) ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යෝජනා කරනු ලැබූවක් නොවෙයි. එය ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ සංකල්පයක් අනුව ඉදිරිපත් කෙරෙන පනත් කෙටුම්පතක්.

යළි ආර්ථික අර්බුදයක් ඇති නොවන පරිදි රටේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ඉතාමත් ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගත යුතු ව තිබෙනවා. ඊට අදාළ වගවීම සම්බන්ධයෙන් අවධානය යොමු කර රාජ්‍ය මූල්‍ය මනා ලෙස කළමනාකරණය සඳහා “රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත” ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මෙය ජාතන්තර මූල්‍ය අරමුදල සමග ඒකාබද්ධ වැඩසටහනෙන් අපට පෙන්වා දුන් කරුණක්. මේ වන විට ක්‍රියාත්මක කර ඇති නව ආර්ථික ගමන් මඟ වෙනස් නොකර ආර්ථිකය පිළිබඳ විශ්වාසය තවදුරටත් තහවුරු වන ආකාරයට ක්‍රියා කිරීමයි මෙහිදී අපේක්ෂා කරන්නේ.

ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පත අප රටේ ආර්ථික වර්ධනය කෙරෙහි ඉතා වැදගත්. 2023 වසරේ දෙවැනි සහ තුන්වැනි කාර්තුවල ආර්ථික සංකෝචනයක් සිදුවුණා. එහෙත් හතරවැනි කාර්තුවේ 4.5%ක ආර්ථික වර්ධන වේගයක් අත්කර ගත්තා. ඒ සමග මෙරට පහළ ම මට්ටම දක්වා ආර්ථික වාසිය ගලාගෙන යාම ආරම්භ වුණා.

මෙරට ආර්ථික තරගකාරීත්වය ප්‍රවර්ධනය කිරීම මෙන් ම ආර්ථිකයට ගෝලීය වශයෙන් පැමිණිය හැකි අභියෝග සඳහා මුහුණ දියහැකි තත්ත්වයට පරිවර්තනය කිරීම, ගෝලීය සහයෝගිතාව මනාව පවත්වාගෙන යාම සහ වර්ධනය කිරීම අවශ්‍යයි. විශේෂයෙන් ජාත්‍යන්තර වෙළෙඳාම, වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීම, දේශගුණික විපර්යාස සම්බන්ධයෙන් වෙනස්කම්වලට භාජනය විය යුතු නීති පද්ධතිය වැනි වෙනස් විය යුතු තැන්වලදී වෙනස් වීම වැනි කාරණා ද මේ පනත් කෙටුම්පතින් ආවරණය වනවා.

ශ්‍රී ලංකාවේ නව ආර්ථික කොමිෂන් සභාවක් පිහිටුවීම, තරගකාරීත්වය තුළ ආයෝජන ආකර්ෂණය කරගන්නා ආකාරය පිළිබඳ අවධානය යොමු කිරීම, ආයෝජකයන්ට වඩා හිතකර පරිසරයක් නිර්මාණය කිරීම, ජාත්‍යන්තර වෙළෙඳාම පුළුල් කිරීම, ජාතික ඵලදායිතා කොමිෂන් සභාව පිහිටුවීම, අපනයනය සම්බන්ධයෙන් වූ අදාළ ආයතන පිහිටුවීම මේ පනත් කෙටුම්පතින් සිදුවනවා.

ආර්ථික පරිවර්තනය සම්බන්ධයෙන් අප ගත් තීන්දු පාර්ලිමේන්තුව අනුමත කළා. 2022 වර්ෂයේ රාජ්‍ය ණය අනුපාතය 128%ක් ලෙස පැවතුණා. එය 2032 වසර වන විට 95%කට වඩා අඩු මට්ටමකට පවත්වාගෙන යාම අවශ්‍යයි. දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂ ව 2022 වසර වන විට 34.6%ක් ව පැවති රාජ්‍ය මූල්‍ය අවශ්‍යතාව 2032 වසර වන විට 13%ට වඩා අඩු මට්ටමකට පවත්වාගෙන යාම අවශ්‍ය වනවා. එමෙන් ම ණය සේවාකරණය ද ඉතාමත් වැදගත්. අප උත්සාහ කරන්නේ ණය ගෙවාගත හැකි ණය තිරසරභාවයෙන් යුතු රටක් බවට ශ්‍රී ලංකාව පත් කර ගැනීමටයි. 2022 වර්ෂයේ 9.4%ක් ව පැවති ණය ගෙවීම් අනුපාතය 2027 වසර වන විට 4.5%කට වඩා අඩු කර ගැනීම අවශ්‍ය වනවා. රට වෙනුවෙන් සපුරාගත යුතු මෙවැනි නිශ්චිත ඉලක්ක සහ රටේ ආර්ථිකයට එල්ල විය හැකි යම් අභියෝග පිළිබඳ ගන්නා ක්‍රියාමාර්ග පාර්ලිමේන්තුවට නැවත වාර්තා කිරීමට අවශ්‍ය පනත් කෙටුම්පතක් ලෙස මෙය හඳුන්වා දිය හැකියි.

මේ පනත් කෙටුම්පතින් අවසාන වශයෙන් බලාපොරොත්තු වන්නේ තිරසර ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යාම, ණය ගෙවීම තිරසර මට්ටමක පවත්වාගෙන යාම, කෘෂිකර්මාන්තය නවීකරණය, ආනයනය සහ අපනයනය කළමනාකරණය කිරීම, ගෙවුම් ශේෂය කළමනාකරණය කිරීමෙන් රටේ ආර්ථික දිශානතිය නිවැරදි ව මෙහෙය වීම.

යළි ආර්ථික අර්බුදයක් ඇති නොවන පරිදි රටේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ඉතාමත් ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගත යුතු ව තිබෙනවා. ඊට අදාළ වගවීම සම්බන්ධයෙන් අවධානය යොමු කර රාජ්‍ය මූල්‍ය මනා ලෙස කළමනාකරණය සඳහා “රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත් කෙටුම්පත” ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මෙය ජාතන්තර මූල්‍ය අරමුදල සමග ඒකාබද්ධ වැඩසටහනෙන් අපට පෙන්වා දුන් කරුණක්. මේ වන විට ක්‍රියාත්මක කර ඇති නව ආර්ථික ගමන් මඟ වෙනස් නොකර ආර්ථිකය පිළිබඳ විශ්වාසය තවදුරටත් තහවුරු වන ආකාරයට ක්‍රියා කිරීමයි මෙහිදී අපේක්ෂා කරන්නේ.

# පුළුල් ව පැතිරුණු වගකීම් යාන්ත්‍රණයක් තිබිය යුතුයි

ශ්‍රී ලංකාවේ පවතින බොහෝ පනත් රටෙහි ආර්ථික සංවර්ධනය අරමුණු කරගත් පනත්. මේවා කෘෂිකර්මාන්තය පදනම් කරගත් ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිවල සිට මහා පරිමාණ ආයෝජන ආකර්ෂණය කර ගැනීමට අදාළ ශ්‍රී ලංකා ආයෝජන පනත හා ක්‍රමෝපාය සංවර්ධන පනත ආදී පනත් දක්වා පුළුල් පරාසයක විහිදෙනවා. මේ බොහෝ පනත්වලින් අපේක්ෂා කරන ලද නිසි ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි වීමට ප්‍රධාන හේතුවක් වුණේ පනත් ක්‍රියාත්මක කිරීම දුර්වල වීම සහ එම පනත්වලට අදාළ විධිවිධාන නිසි කළමනාකරණයකින් තොර ව කාර්යක්ෂම ව ක්‍රියාත්මක නොකිරීම. එමෙන් ම ඇතැම් පනත්වලින් දැඩි පාලනයක් හා නීති රෙගුලාසි පැනවීම හේතුවෙන් ආර්ථික කටයුතු නිදහසේ හැසිරවීමට පැවති අවස්ථා බොහෝදුරට සීමා වුණා. ඇතැම් පනත්වලින් පෞද්ගලික අංශයේ මැදිහත්වීම අධෛර්යමත් කිරීම හේතුවෙන් ආර්ථිකයේ ප්‍රධාන අංශවල නවෝත්පාදන සහ තාක්ෂණික දියුණුව අඩාල වුණා. ආර්ථිකයට සම්බන්ධ ඇතැම් පනත්වලින් ආනයනික විකල්ප අධෛර්යමත් කර ගෘහස්ථ කර්මාන්ත දිරිමත් කිරීමෙන් සිදු වුණේ ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීමට දිරි ගැන්වීම. ඒ අනුව ප්‍රමාණවත් අපනයන ප්‍රවර්ධනයකින් තොර ව දේශීය නිෂ්පාදන මත අධික ලෙස රඳා පැවතීම වෙළෙඳපොළ අසමතුලිතතාවට හේතු වුණා.

රජයේ ආදායම් සහ වියදම් ඵලදායි ලෙස කළමනාකරණය අරමුණු කරගත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් සිදු වුණේ අධික වියදම් සහ ප්‍රමාණවත් ආදායම් එකතු නොවීම මත හටගත් දිගුකාලීන අයවැය හිඟය රාජ්‍ය මූල්‍ය අංශයේ විනය පිරිහීම දක්වා පැතිරීම. එය ශ්‍රී ලංකාව දැඩි ආර්ථික පරිහානියකට ඇද දැමීමට පවා හේතු වුණා. ආයෝජන ප්‍රතිපත්ති සහ දිරිගැන්වීම්වල නිතර සිදුවන වෙනස්වීම් ආයෝජකයන් සඳහා අවිනිශ්චිතතාවක් ඇති කළා. එමෙන් ම



ආචාර්ය
**කපිල සේනානායක**
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

ආර්ථිකයට සම්බන්ධ ඇතැම් පනත්වලින් ආනයනික විකල්ප අධෛර්යමත් කර ගෘහස්ථ කර්මාන්ත දිරිමත් කිරීමෙන් සිදු වුණේ ගුණාත්මක භාණ්ඩ නිෂ්පාදනය කිරීමට දිරි ගැන්වීම. ඒ අනුව ප්‍රමාණවත් අපනයන ප්‍රවර්ධනයකින් තොර ව දේශීය නිෂ්පාදන මත අධික ලෙස රඳා පැවතීම වෙළෙඳපොළ අසමතුලිතතාවට හේතු වුණා.

මූල්‍යායතන ඵලදායි ලෙස අධීක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් පරිදි නියාමන රාමුවක් නොමැතිවීම හේතුවෙන් බැංකු අංශයේ ස්ථාවරත්වයට බලපාන ඉහළ අක්‍රීය ණය ප්‍රමාණයක් ඒකරාශී වී තිබෙනවා. එබැවින් තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම, තරගකාරීත්වය වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සම්බන්ධ නීති සහ ප්‍රතිපත්තිවල පුළුල් ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ අවශ්‍යතාව මේ අඩුපාඩු පෙන්වා දෙනවා.

මෙවැනි පසුබිමක ආර්ථික පරිවර්තන පනත (කෙටුම්පත) සකස් කිරීමේ ප්‍රධාන අරමුණු කිහිපයක් තිබෙනවා. සියලු ම පුරවැසියන්ට යහපත් ජීවන තත්ත්වයක් ලබාදීම, රටපුරා විහිදුණු ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කිරීම සහ අනාගතයේදී ආර්ථික අර්බුදයක් ඇතිවීම වළක්වා ගැනීම අරමුණු කර ගනිමින් ආර්ථික පරිවර්තන පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ස්ථාපනය කිරීමට අවැසි පදනමයි මේ කෙටුම්පතෙහි දක්වා ඇත්තේ. මේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාව ඉහළ තරගකාරීත්වයෙන් යුත්ත අපනයන නැඹුරු සහ ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කෙරෙනු ඇති.

තාක්ෂණික වැඩිදියුණු වීම්, වෙනස් වන ජන විකාශ සහ නැගී එන පාරිසරික අභියෝග සියල්ල කැටිකොට වර්තමාන ගෝලීය ආර්ථික වටපිටාව විකාශනය වන නිසා විදේශීය මෙන් ම දේශීය පොදු ආර්ථික අභියෝගවලට පිළිතුරු සෙවීමේදී ජාතික ආර්ථිකයෙහි අන්තර් සම්බන්ධතාව සහ ජාත්‍යන්තර සහයෝගීතාවෙහි මැදිහත්වීම බොහෝ සෙයින් වැදගත්. එබැවින් මේ ආර්ථික පරිවර්තන පනත ක්‍රියාත්මක කිරීමෙන් ආර්ථිකයේ පරිවර්තනීය වෙනසක් සිදු කිරීමට බලාපොරොත්තු වනවා.

තිරසර සංවර්ධනය අභිවර්ධනය, සශ්‍රීකත්වය වැඩි කිරීම, ඵලදායිතාව නැංවීම, සමාජ ප්‍රගතිය ප්‍රවර්ධනය කිරීම සහ සියලු පුරවැසියන්ට සමාන අවස්ථා සහතික කිරීම සඳහා සුදුසු පරිසරයක් ගොඩනැගීම එහි ප්‍රමුඛ කාරණාවක්. ඉලක්කගත මැදිහත්වීම්, යටිතල පහසුකම්වල ආයෝජනය සහ අත්‍යවශ්‍ය පොදු සේවා සැපයීම ඇතුළු ආර්ථික පරිවර්තනය සඳහා ශක්‍යතාව සහිත පරිසරයක් නිර්මාණය කිරීමත් අපේක්ෂිත පරිවර්තනීය වෙනසක්.




ආර්ථික වර්ධනය මෙහෙයවීමේදී, රැකියා අවස්ථා නිර්මාණය කිරීමේදී සහ නවෝත්පාදන සහ තාක්ෂණික දියුණුව වැඩිදියුණු කිරීමේදී ආයෝජනවල තීරණාත්මක කාර්යභාරය ඉහළ නැංවීම මෙන් ම දේශීය හා විදේශීය ආයෝජකයන්ට සාධාරණ සහ සමාන ලෙස සැලකීම ප්‍රවර්ධනය කරන විනිවිදභාවයෙන් යුතු සම්පූර්ණ සහ නීති මත පදනම් වූ ක්‍රමවේදයක් සැකසීම ආර්ථික පරිවර්තන පනත ක්‍රියාත්මක කිරීමෙන් සිදු වනු ඇති. ආර්ථික වර්ධනය, තරගකාරීත්වය ප්‍රවර්ධනය සහ ආර්ථිකය ලෝක වෙළෙඳපොළට ඒකාබද්ධ කිරීමට පහසුකම් සැලසීම සඳහා උත්ප්‍රේරකයක් ලෙස ජාත්‍යන්තර වෙළෙඳාම ප්‍රවර්ධනය කිරීමත් මෙහි අපේක්ෂිත වෙනසක්.

ආයෝජනය, පුළුල් වෙළෙඳ අවස්ථා මෙන් ම වෙළෙඳ ගිවිසුම් පිළිබඳ ගිවිස ගැනීම් සඳහා හිතකර පරිසරයක් සපයන සහ ආර්ථික වර්ධනය පුබුදු කිරීම පිණිස ආනයන අපනයන ක්‍රියාකාරකම්වලට පහසුකම් සලසනු ලබන නීති පැනවීමත් ආර්ථික පරිවර්තන පනත ක්‍රියාත්මක කිරීමෙන් සිදු වනු ඇති. ගෝලීය අභියෝගවලට මුහුණදීම සඳහා සහ අන්‍යෝන්‍ය ප්‍රතිලාභය සඳහා අවස්ථා ලබාදීම පිණිස වූ ජාත්‍යන්තර සහයෝගතාව සහ සහයෝගය ඉහළ නැංවීම එහිදී අපේක්ෂිත පරිවර්තනීය වෙනසක්.

ආර්ථික පරිවර්තන පනත ක්‍රියාත්මක කිරීමේදී මතුවිය හැකි ගැටලු හා අභියෝග ගණනාවක් තිබෙනවා. ඒවා පනතේ සඵලතාවට බාධාවක් විය හැකි අතර අපේක්ෂිත ආර්ථික ප්‍රතිඵල ප්‍රමාද කරනු ඇති. දේශපාලන ප්‍රතිරෝධය එවැනි මතු විය හැකි ප්‍රබල අභියෝගයක්.

ආයතනික දුර්වලතා ද මෙවැනි පනත් ක්‍රියාත්මක කිරීමේදී පවතින ගැටලුවක්. මේ නිසා ආයතනික අකාර්යක්ෂමතා සහ අවශ්‍ය ධාරිතාවන්ගෙන් සමන්විත නොවීම හේතුවෙන් මේ පනත ක්‍රියාත්මක කිරීම නිසි පරිදි සිදු නොවන්නට පුළුවන්. පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තාක්ෂණික විශේෂඥතාව සහ අදාළ රාජ්‍ය ආයතනවලට සම්පත් ප්‍රමාණවත් පරිදි නොතිබිය හැකි වීමත් අභියෝගයක්.

ආර්ථිකයෙහි පවතින අස්ථාවරත්වය ඊට බලපාන ප්‍රමුඛ ගැටලුවක්. ඉතිහාසයේ දරුණුතම ආර්ථික අර්බුදයකින් පසු ශ්‍රී ලංකාව එම ආර්ථික අර්බුදයෙන් අත්මිදෙමින් පවතින අවස්ථාවකයි මේ පනත ක්‍රියාත්මක වීමට නියමිත ව තිබෙන්නේ. විශේෂයෙන් ඉහළ හා තිරසර නොවන ණය පනතේ සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා රජයට මුදල් යෙදවීමට ඇති හැකියාව සීමා කරනු ඇති.

දිගුකාලීන සමාජ හා සංස්කෘතික සම්මතයන් මේ පනතෙන් යෝජිත විශේෂයෙන් ශ්‍රම වෙළෙඳපොළ සහ ඉඩම් ප්‍රතිසංස්කරණ සම්බන්ධ වෙනස්කම්වලට බාධා එල්ල කරන්නට පුළුවන්. පවතින නීති සහ රෙගුලාසි පුළුල් නීතිමය ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන නව ප්‍රතිපත්ති සමග නොගැළපෙන අවස්ථා ද පැවතිය හැකියි.

ප්‍රමාණවත් පරිදි දත්ත නොමැතිකම හේතුවෙන් පනත ක්‍රියාත්මක කිරීමට අදාළ කටයුතු අධීක්ෂණයට සහ පනතෙහි සැබෑ බලපෑම ඇගැයීමට නොහැකි වනු ඇති. පුළුල් ව පැතිරුණු වගකීම් යාන්ත්‍රණයක් පැවතුණහොත් පමණයි මෙවැනි සංකීර්ණ ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ පැතිරුණු පනතක් සාර්ථක ව ක්‍රියාත්මක කිරීමේ හැකියාව ලැබෙනු ඇත්තේ.

මේ අභියෝගවලට මුහුණදීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයන් විසින් සියලු ම පාර්ශ්වකරුවන් සම්බන්ධ කරගන්නා ප්‍රමාණවත් සම්පත් සහ හැකියා සහතික කරන ශක්තිමත් අධීක්ෂණ, ඇගයීම් රාමු ගොඩනඟන පරිපූර්ණ සහ සියල්ල ඇතුළත් ප්‍රවේශයක් අනුගමනය කිරීම ඉතා වැදගත්. ආර්ථික පනත සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පැහැදිලි සන්නිවේදනය මෙන් ම දේශපාලන කැමැත්ත සහ ප්‍රතිසංස්කරණය සඳහා තිරසර කැපවීම අත්‍යවශ්‍ය කරුණක්.



# බරපතළ ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍යයි



මහාචාර්ය
**නිහාල් හෙන්නායක**
ව්‍යාපාර ආර්ථික විද්‍යා අංශය
කළමනාකරණ හා මූල්‍ය පීඨය
කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවමත් පවතින්නේ ගැටලුකාරී මට්ටමක. මේ නිසා ආර්ථික අර්බුදයකින් ගොඩ ඒම සඳහා යම් යම් ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍ය වෙනවා. 2001 වසරේ මෙරට ආර්ථිකය සෘණ වූ අවස්ථාවේ එවකට අගමැතිවරයා යම් යම් යෝජනා සම්මත කළා. රාජ්‍ය ණය ප්‍රමාණය ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 60%ක මට්ටමකට ගෙන ඒමේ යෝජනාව ද ඊට උදාහරණයක්. එහෙත් ඊට පසු පාලන බලයට පැමිණි එක් එක් රජය මේ පනත් සංශෝධනය කළා. රාජ්‍ය ණය ප්‍රමාණය ජාතික නිෂ්පාදිතය ඉක්මවා ගොස් තිබෙනවා. 2001 වසරේදී 60%ක් ලෙස තිබිය යුතු යැයි පැවසූ එම අනුපාතය 105%ක් පමණ දක්වා වැඩිවීමෙන් අර්බුදයට හේතුව හඳුනා ගන්නට පුළුවන්. ලෝක ආර්ථිකය වෙනස් වන විට පැරණි ආර්ථික රටාව සමග ඉදිරියට යන්නට බැහැ. වෙනස්වීම් සඳහා තදබල ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍යයි.

මෙවැනි පසුබිමක ආර්ථික පරිවර්තනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ප්‍රකාශ කළේ වියදමට ගැළපෙන ලෙස ආදායම සකස් කර ගැනීම අවශ්‍ය බව. එහිදී අපනයන වැඩි කර ගැනීම මූලික අවශ්‍යතාවක්. රාජ්‍ය ණය ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගතහොත් 100%ට වඩා අඩු විය යුතුයි. නීති පද්ධතිය ස්ථාපිත කර යටිතල පහසුකම් දියුණු කළ යුතුයි. අපනයන ආදායම ඩොලර් බිලියන 12ක් වන විට ආනයන වියදම ඩොලර් බිලියන 24ක් පමණ වෙනවා. ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන්නේ මේ හේතුවෙන්. ප්‍රතිසංස්කරණවලින් බලාපොරොත්තු වන්නේ පහසු හා නීත්‍යානුකූල බලයක් සහිත ව පනත සම්මත කරගැනීම. මේ පනතින් අලුත් ආයතන ගණනාවක් හඳුන්වා දෙනවා. මෙයින් ලැබෙන්නේ ආර්ථික අර්බුදය කළමනාකරණය කර ගන්නා වැඩපිළිවෙළකට නීත්‍යානුකූල බවක්. මෙහිදී ආයතනවලට නිදහසක් ලබා දී තිබෙනවා. ඇතැම් ආයතනවලට බලයක් තිබෙනවා යම් යම් තීරණ ගැනීමට. උදාහරණ ලෙස සේවකයන් බඳවා ගන්නා ආයතන සේ ම ශාඛා පිහිටුවීම ද ඊට අයත්.

වර්තමානයේ පවතින්නේ ඩිජිටල් වූ ආර්ථිකයක්. ලෝකයේ තිබෙනවා පහසුවෙන් ව්‍යාපාර කිරීමේ දර්ශකයක්. ශ්‍රී ලංකාව සිටින්නේ එහි රටවල් 190ක් අතරින් 99 වැනි ස්ථානයේ. මෙය තවදුරටත් ඉදිරියට යා යුතුයි. වියට්නාමය රැඳී සිටින්නේ 70 වැනි ස්ථානයේ. ඒ අනුව ඔවුන් අපට වඩා ඉදිරියට ගොස් තිබෙනවා. 1990 වසරේ වියට්නාමය ඉපයූ අපනයන ආදායම ඩොලර් බිලියන 2.3ක් පමණ. එම වසරේ ශ්‍රී ලංකාව ඩොලර් බිලියන 2.4ක් උපයා තිබෙනවා. බංග්ලාදේශය උපයා තිබෙන්නේ ඩොලර් බිලියන 1.8යි. වර්තමානය වන විට වියට්නාමය අපනයන ආදායම ඩොලර් බිලියන 384ක් දක්වා ඉහළ නංවා තිබෙනවා.

> රාජ්‍ය ණය ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගතහොත් 100%ට වඩා අඩු විය යුතුයි. නීති පද්ධතිය ස්ථාපිත කර යටිතල පහසුකම් දියුණු කළ යුතුයි. අපනයන ආදායම ඩොලර් බිලියන 12ක් වන විට ආනයන වියදම ඩොලර් බිලියන 24ක් පමණ වෙනවා. ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍ය වන්නේ මේ හේතුවෙන්.

ඉලක්ක හඳුනා ගැනීමත් මෙහි අරමුණක්. 2027 වසරේ සිට ජාතික නිෂ්පාදිතයේ වර්ධනය 5%ක් හෝ ඊට වැඩි කර ගැනීමත් සැලසුම්වලට ඇතුළත්. එය ඉදිරියට යාමක්. රටේ සේවා වියුක්තිය ශ්‍රම බලකායෙන් 5%ක මට්ටමට වඩා අඩුවෙන් පවත්වා ගත යුතුයි. එසේ ම කාන්තා ශ්‍රම සහභාගිත්වය 40%ට වඩා අඩු නොවිය යුතුයි. වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් තිබීම මූලික අවශ්‍යතාවක්. විදේශ සෘජු ආයෝජන ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 5%ක් හෝ ඊට වැඩි විය යුතුයි.

එය ප්‍රතිශතයක් ලෙස ඉතා විශාලයි. ශ්‍රී ලංකාවේ එය ඩොලර් බිලියන 13-15ත් අතර ප්‍රමාණයක්. බංග්ලාදේශය ඩොලර් බිලියන 60ක් දක්වා අපනයන ආදායම වැඩි කරගෙන තිබෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ තත්ත්වය වටහා ගන්නට පුළුවන්. වෙනස් වන ලෝකය සමග ගමන් කරන්නට ආර්ථික ප්‍රතිසංස්කරණ තිබිය යුතුයි.

ආර්ථික පරිවර්තන පනත යටතේ අලුතින් ම ආයතන 05ක් හඳුන්වා දෙනවා. ඉන් පළමුවැන්න ලෙස විදෙස් ආයෝජකයන් සඳහා හඳුන්වා දෙන්නේ ආර්ථික කොමිසම. ආයෝජකයකු ශ්‍රී ලංකාවට පැමිණි විට ක්ෂණික ව පහසුකම් සැලසීමයි එහි අරමුණ. එනම්, ආයෝජනය සඳහා එක ම ස්ථානයකින් පහසුකම් සැලසීම මෙහිදී සිදු වෙනවා. ආර්ථික කොමිසමෙන් යෝජනා කරන සැපයුම් දාමයේ අරමුණ වන්නේ ලෝකයේ සැපයුම් දාමයට ශ්‍රී ලංකාවත් එක්වීම. ශ්‍රී ලංකා ආයෝජන කලාප පිහිටුවීම යෝජනා කර තිබෙන්නේ ආයෝජන වර්ධනය කිරීමේ අරමුණින්. එලෙස ආයෝජකයන්ට අවශ්‍ය කලාපයක් සකසා දීමෙන් ආයෝජන වර්ධනයට කාර්යක්ෂම වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ඉන් හැකියාව ලැබෙනවා. හඳුන්වා දීමට යන ජාත්‍යන්තර වෙළෙඳාම සඳහා වූ කාර්යාලය පුළුල් වශයෙන් අධ්‍යයනය කළ යුතුයි. නිෂ්පාදනවලට ඉල්ලුම ඇති වන අයුරින් ක්‍රියා කිරීම එහි මූලික අවශ්‍යතාවක් වන අතර ලෝකයේ ආයතන සමග සාකච්ඡා කර ඒ සම්බන්ධ තීරණ කඩිනමින් ගත යුතුයි.

ඉලක්ක හඳුනා ගැනීමත් මෙහි අරමුණක්. 2027 වසරේ සිට ජාතික නිෂ්පාදිතයේ වර්ධනය 5%ක් හෝ ඊට වැඩි කර ගැනීමත් සැලසුම්වලට ඇතුළත්. එය ඉදිරියට යාමක්. රටේ සේවා වියුක්තිය ශ්‍රම බලකායෙන් 5%ක මට්ටමට වඩා අඩුවෙන් පවත්වා ගත යුතුයි. එසේ ම කාන්තා ශ්‍රම සහභාගිත්වය 40%ට වඩා අඩු නොවිය යුතුයි. වෙළෙඳ ගිණුමේ අතිරික්තයක් තිබීම මූලික අවශ්‍යතාවක්. විදේශ සෘජු ආයෝජන ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 5%ක් හෝ ඊට වැඩි විය යුතුයි. අපනයන අභිමුඛ කර්මාන්තවලට වැඩි වශයෙන් යොමු වීම වැදගත්. ආර්ථික කොමිසම මේ යෝජනා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙනවා.

යහපත් බදු ප්‍රතිපත්තියක් තිබිය යුතු අතර ම වෙළෙඳපොළ විශාල විය යුතුයි. භාණ්ඩ නිෂ්පාදනය කළ යුත්තේ දැනට ශ්‍රී ලංකාවේ සිටින ජනගහනය ඉලක්ක කරගෙන පමණක් නොවෙයි. එහිදී විදෙස් වෙළෙඳපොළ ඉලක්ක කළ හැකියි. වෙළෙඳ ගිවිසුම් ඇතිකර ගැනීම ද මූලික අවශ්‍යතාවක්. ආර්ථික කොමිසමේ නිලධාරින් මෙහිදී ක්‍රියා කළ යුතු වන්නේ වෙළෙඳාම් පිළිබඳ තානාපතිවරුන් ලෙස.

ජාතික ඵලදායිතා කොමිෂන් සභාවත් මෙහි යෝජිත ආයතනයක්. ඕනෑ ම අංශයක ඵලදායි බව වර්ධනය කිරීම මෙහි මූලික අරමුණක්. තිරසර ලෙස ක්‍රියා කිරීමේ අවබෝධය ඇති කිරීමේ හැකියාව එම ආයතනයෙන් ලැබිය හැකියි. ලාභ ලබන ආයතනවල ඵලදායිතාව වර්ධනයටත් මෙහිදී පියවර ගත යුතුයි. ඒ සඳහා කඩිනමින් තීරණ ගැනීමට හැකි විය යුතුයි. යෝජිත ශ්‍රී ලංකා ආර්ථික විද්‍යාව හා ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳ ආයතනය පිහිටුවීමෙන් පර්යේෂණ සිදු කිරීම සහ ඊට උපදෙස් දීම සිදු වන නිසා සමස්තයක් ලෙස මේ අලුත් අදහස් සහිත ප්‍රතිපත්ති සමඟ ඉදිරි ගමනක් යාමට හැකි වනු ඇති. මේ සඳහා බරපතළ ආර්ථික ප්‍රතිසංස්කරණ කළ යුතුයි.

තරගකාරී වෙළෙඳ පරිසරයක් සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට උගත්, දක්ෂතාව සහ කුසලතා (Educated, Talented and Skill) පිරි ශ්‍රම බලකායක් සිටිය යුතුයි. එනම් කුසලතා සහිත අධ්‍යාපනයක්, ශ්‍රම බලකායක් රටකට තිබිය යුතුයි. කෘත්‍රිම බුද්ධිය සහිත තාක්ෂණය ගැන අවබෝධය සිසුන්ට තිබිය යුතුයි. එවිට තරගකාරී වෙළෙඳ පරිසරයකට පිවිසීම අපහසු නැහැ.



# අපනයන අංශය ප්‍රවර්ධනය වැදගත්




මහාචාර්ය
**ප්‍රියංග දුනුසිංහ**
ආර්ථික විද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය


ආර්ථික වර්ධනය ලෙස සැලකෙන්නේ ඒක පුද්ගල ආදායම ඉහළ යාම මෙන් ම මානව ප්‍රාග්ධනය, සමාජ හා දේශපාලන, අධ්‍යාපන, සෞඛ්‍ය අංශවල සහ පුද්ගල තත්ත්වය ඉහළ යාම ආදියයි. විරැකියාව අවම වීම ද මීට අයත්. තායිලන්තය, මැලේසියාව, වියට්නාමය, දකුණු කොරියාව, සිංගප්පූරුව වැනි රටවල අඛණ්ඩ ව ඒක පුද්ගල ආදායම ඉහළ යාම සිදුවුණා. සංවර්ධනයේදී බලාපොරොත්තු වන්නේ පහළ ආදායම් ලබන බහුතරයක් මැදි ආදායම් ලබන තත්ත්වයට පත්වීම. එදිනෙදා ජීවත්වීම පිළිබඳ පුද්ගලයන්ට වද වීමට අවශ්‍ය නැති තත්ත්වයක් නිර්මාණය විය යුතුයි. බාධාවකින් තොර ව මූලික අවශ්‍යතා ඉටුකර ගැනීමටත් හැකි විය යුතුයි. පුද්ගලයාට ආත්ම අභිමානයෙන් යුතු ව ජීවත්වීමේ පරිසරයක් සකස් වීමත් ආර්ථික වර්ධනයේදී සිදු වෙනවා. පුද්ගලයකුට තේරීමේ නිදහස එනම් කැමති තැනක ජීවත්වීම, කැමති රැකියාවක නිරත වීම මෙහි විය යුතුයි.

1977 වසරෙන් පසු ශ්‍රී ලංකාව අපනයන අංශය පදනම් කරගත් ආර්ථික සංවර්ධන ආකෘතියක් ක්‍රියාත්මක කළා. එහෙත් ඇතැම් ජයග්‍රහණ අත්කර ගැනීමට හැකි වුණා. මෙහිදී ඒක පුද්ගල ආදායම ඩොලර් 300 මට්ටමේ සිට 4000 දක්වා වැඩි කර ගැනීමට සහ අධ්‍යාපන, සෞඛ්‍ය හා අනෙකුත් ක්ෂේත්‍රවල යම් යම් ජයග්‍රහණ අත්කර ගැනීමට හැකි වුවත් අනෙකුත් රටවලට සාපේක්ෂ ව එම තත්ත්වය පවතින්නේ මන්දගාමී ව.

දකුණු කොරියාව වැනි රටවල් විශාල වශයෙන් ඉදිරියට ගොස් තිබෙනවා. ඒ අනුව අපේ සංවර්ධනය ගැන සෑහීමකට පත් වන්නට බැහැ. දෙවැනි කරුණ වන්නේ මේ වර්ධනයේත් ඇතිකරගත් දුර්වලතා පැවතීම. අඛණ්ඩ ව අයවැය හිඟය පවත්වාගෙන යාම, ගෙවුම්ශේෂ හිඟය පවත්වාගෙන යාම, අඛණ්ඩ ව රාජ්‍ය පාලනයට අදාළ ව යහපාලනය ඇති කිරීමට අසමත් වීම එවැනි දුර්වලතා. එහි ප්‍රතිඵල ලෙස වංචාව, දූෂණය ඉහළ ගොස් තිබෙනවා. ආර්ථික කටයුතු අකාර්යක්ෂම වුණා. ණය බර ඉහළ ගියා. රටක් වශයෙන් 70-80 දශකවල ගත කළ ජන ජීවිතය සමග සැසඳීමේදී යම් ධනාත්මක තත්ත්වයක් පැවතියත් ගමන පවතින්නේ



මන්දගාමී ලෙස. ආර්ථිකයේ දැවැන්ත ආකාරයේ ව්‍යුහාත්මක ගැටලු තිබෙනවා. පවතින ආර්ථික අර්බුදයකට මැදිවීමටත් මෙය හේතු වුණා.

ආර්ථික පරිවර්තන පනත සමග ආර්ථික කළමනාකරන පනත, දේශීය ආදායම් බදු පනත ආදී සියල්ල ගැන අවධානය යොමු කළ යුතුයි. ආර්ථික කළමනාකරණ පනතෙන් අයවැය හිඟය අඩුකර රාජ්‍ය ණය පහළ මට්ටමක පවත්වාගෙන යාමට අවධානය යොමු කර තිබෙනවා. මූල්‍ය විනය ඇති කිරීමත් එහි අරමුණක්. මූල්‍ය ප්‍රතිපත්තිවලට බලපෑම් අවම කිරීමට මහ බැංකුව ස්වාධීන කිරීමේ පනතත් හඳුන්වා දී තිබෙනවා. දූෂණ විරෝධී පනතෙන් උත්සාහ කරන්නේ වංචා සහ දූෂණ මගහැරවීම.

ආර්ථික පරිවර්තනය පිළිබඳ පනත් කෙටුම්පතෙන් උත්සාහ කරන මූලික කරුණු කිහිපයක් තිබෙනවා. ඒ අතර ප්‍රධාන ම කරුණ වන්නේ තරගකාරී අපනයන අභිමුඛ ඩිජිටල් ආර්ථිකයක් ගොඩනැංවීම. සියලු දෙනාට ප්‍රතිලාභ ලැබෙන ආර්ථිකයක් ගොඩනැගීමටත් සැලසුම් කර තිබෙනවා. ආර්ථිකය විවිධාංගිකරණය, ව්‍යුහාත්මක ගැටලු විසඳීම හා තරගකාරීත්වය වර්ධනය, පැරිස් සම්මුතියට අදාළ තිරසර ආර්ථිකයක් සඳහා ආර්ථික වර්ධනය පරිවර්තනය කිරීම, ගෝලීය ආර්ථිකය සමග එක්වීම හා සාර්ව ආර්ථික ස්ථායිතාව මෙන් ම තිරසර ණය මට්ටමක් පවත්වාගෙන යාම අනෙකුත් කාරණා. කෘෂිකර්මාන්තය නවීකරණය හා සියලු දෙනාට සහභාගි විය හැකි ආර්ථික වර්ධනයක් හා සමාජ ප්‍රගතියක් අත්කර ගැනීමත් මෙහි අරමුණක්. ආර්ථික පරිවර්තන ඇති කිරීම සඳහා මේ පනතේ මූලික ඉලක්ක පිහිටුවා තිබෙනවා. රජයේ විදේශ අරමුදල්වලට අදාළ ණය ගෙවීමේදී එම ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 4.5%කට වඩා අඩු මට්ටමක පවත්වාගෙන යාම එක් ඉලක්කයක්. ඊට අමතර ව රජයේ ඉලක්කගත කරුණු තුනක් තිබෙනවා. 2040 වසර වන විට භාණ්ඩ හා සේවා අපනයනය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 60%ක මට්ටමට ළඟා විය යුතු වෙනවා. වර්තමානයේ එය පවතින්නේ 21.5%ක මට්ටමක. දකුණු කොරියාවේ එය සියයට 50%ක්. 1960 වසරේ දකුණු කොරියාවේ එය පැවතුණේ 2%ක් ලෙස. එවකට ලංකාවේ එය පැවතුණේ 30%ක් ලෙස. එහෙත් 2022 වසර වන විට 21.5%ක් වී දකුණු කොරියාව වර්ධනයක් අත්කර ගත්තේ 48.5% දක්වා අපනයන දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස වැඩි කර ගනිමින්.

පනතේ සඳහන් තවත් වැදගත් කරුණක් වන්නේ අර්ථිකයට කාන්තා ශ්‍රම දායකත්වය කෙරෙහි අවධානය යොමු




කිරීම. ලොව අනෙකුත් රටවල 67%ක් පමණ වන එය ශ්‍රී ලංකාවේ 32%ක්. මේ පනතින් එය 2030 වසර 40%ක මට්ටමට හා 2040 වසර වන විට 50% දක්වා රැගෙන ඒමට සැලසුම් කර තිබෙනවා. දැනට භාවිත නොවන නිෂ්පාදන සම්පතක් ලෙස කාන්තා ශ්‍රම දායකත්වය සැලකිය හැකියි.

විදේශ ආයෝජන ප්‍රවර්ධනයත් පනතේ අවධානය යොමු කර තිබෙන ප්‍රධාන කරුණක්. එයට අනුව සමස්ත අපනයනවලින් 40%ක් විදේශ ආයෝජන මත පදනම් වූ අපනයන විය යුතුයි. මෙය ඉතා වැදගත්. 2010-2022 අතර කාලයේ ශ්‍රී ලංකාවට සාමාන්‍යයෙන් වාර්ෂික ව ලැබී ඇත්තේ විදේශ ආයෝජන මිලියන 900ක්. ඉන්දියාවේ එය බිලියන 40ක්. බංග්ලාදේශය බිලියන 03ක්, වියට්නාමය බිලියන 17ක් ලෙස විදේශ ආයෝජනවලින් උපයා තිබෙනවා. විදේශ ආයෝජන ගෙන්වා ගැනීමෙන් අප සිටින්නේ ඉතා පහළ මට්ටමක. මේ නිසා අපනයන අංශය ප්‍රවර්ධනය අත්‍යවශ්‍ය වෙනවා. මෙහිදී දේශීය කර්මාන්තකරුවන් නගා සිටුවිය යුතු අතර විදේශ ආයෝජන තිබිය යුතුයි. මේ පනතේ සඳහන් පරිදි විදේශ වෙළෙඳපොළට විවෘත වීම, ආයෝජන කලාප ඇති කිරීම, ඵලදායිතාව වැඩි කිරීම ආදිය වැදගත් වන්නේ මේ ඉලක්ක සපුරා ගැනීමට. විදේශ ආයෝජන ලැබෙන්නේ යහපත් ව්‍යාපාරික පරිසරයක් පැවතුණහොත් පමණයි. රුවන්ඩාව, බංග්ලාදේශය වැනි රටවල් ඊට අවශ්‍ය ආයතනික වටපිටාව සකස් කර තිබෙනවා. මේ පනතෙන් ඉලක්කවලට ගමන් කළ හැකි ආයතන හා නීති පද්ධතියි වෙනස් කර තිබෙනවා.

ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා ආයතනවලට අදාළ ව පර්යේෂණ පැවැත්වීමත් වැදගත්. ඒ සඳහා අධ්‍යයන කළ යුතු වෙනවා. වර්තමානයේ ලෝකයට අවශ්‍ය පර්යේෂණ කිරීමත් ඊට අවශ්‍ය ක්‍රියාමාර්ග තිබීමත් එහිදී ඉතා වැදගත්. ඒ සඳහා පනත් කෙටුම්පතේ කරුණු ඉදිරිපත් කර තිබෙනවා. ආයතන ස්වාධීන වීමේදී වග කියන හා ස්වාධීන ආයතන බිහිවිය යුතුයි. ඒ සඳහා ඉලක්ක ළඟා කර ගන්නා ආකාරය ගැන ද පැහැදිලි ව සඳහන් කිරීම වැදගත්. එසේ ම ඊට ජාතික සංවර්ධන සැලැස්මක් හඳුන්වා දීම මූලික අවශ්‍යතාවක්.

# ඵලදායී භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක්



**රංගිකා අබේසේකර**

1972 ස්වීඩනයේ ස්ටොක්හෝම් නුවර පැවැති මානව පරිසරය සුරැකීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ සමාරම්භක දිනය සනිටුහන් කිරීම සඳහා සෑම වසරක ම ජුනි මස 05 දින 'ජගත් පරිසර දිනය' ලෙස ප්‍රකාශයට පත් විය. එතැන් සිට දශක පහකට වැඩි කාලයක් පරිසරය ආරක්ෂා කර සංරක්ෂණය කිරීම පිළිබඳ ලෝකවාසී ජනතාව දැනුවත් කිරීම සඳහාත් දෛනික ව පැන නගින ගෝලීය පාරිසරික ගැටලු පිළිබඳ ලෝක නායකයන් හා ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ අවධානය යොමු කිරීමේ අරමුණිනුත් සෑම වසරක ම විශේෂිත තේමා යටතේ ජගත් පරිසර දිනය සමරයි.

ප්‍රථම ජගත් පරිසර දිනය සමරා ඇත්තේ 'එක ම මිහිතලයක් පමණයි' යන්න තේමා කරගනිමින් 1973 වසරේදී ය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ භූගෝල විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය තිලක් හේවාවසම් පවසන්නේ සාගර දූෂණය, අධික ජනගහනය, පරිසර දූෂණය වැඩිවීම, ගෝලීය උණුසුම වැඩිවීම වැනි විවිධ පාරිසරික ගැටලු හමුවේ තිරසර සංවර්ධනයකට යාමේදී ප්‍රජාව දැනුවත් කිරීමේ වේදිකාවක් ලෙස මේ දිනය යොදා ගත් බව ය.

කාන්තාරකරණයට එරෙහි ව සටන් කිරීමේ එක්සත් ජාතීන්ගේ සම්මුතියට (United Nation Convention to Combat Desertification-UNCCD) වසර 50ක් පිරීම නිමිත්තෙන් මෙවර ලෝක පරිසර දිනයේ තේමාව සැකසී තිබේ. ඒ අනුව

> කාන්තාරකරණය සහ නියඟය වර්තමානයේ ප්‍රබල පාරිසරික ගැටලුවකි. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය 2021 වර්ෂය සඳහා නිකුත් කළ ගෝලීය දේශගුණ තත්ත්වය පිළිබඳ වාර්තාවේ පසුගිය වසර හත ලොව වාර්තාගත උණුසුම් ම කාලය ලෙස සඳහන් කර ඇත. එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය පිටුදැකීමේ සම්මුතිය පෙන්වා දෙන පරිදි වර්තමානයේ පෘථිවි භූමි ප්‍රමාණයෙන් 40%ක් පමණ හායනයට ලක් ව තිබේ.

එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන 2024 වසරේ ජගත් පරිසර දින තේමාව ලෙස 'ඉඩම් ප්‍රතිසංස්කරණය, කාන්තාරකරණය සහ නියඟයට ඔරොත්තු දීම' (Land Restoration, Desertification and Drought Resilience) යන්න ඉදිරිපත් කර ඇත. ඊට සමගාමී ව 'ඵලදායී භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක්' යන්න ජාතික තේමාව කරගනිමින් ශ්‍රී ලංකාවේ ජගත් පරිසර දිනය සැමරීමට පරිසර අමාත්‍යාංශය සූදානම් වේ.

අදහස් දක්වන මහාචාර්ය තිලක් හේවාවසම්; "භූමි හායනය සඳහා මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික හේතු බලපානවා. විශේෂයෙන් පසේ ගුණාත්මක බව අඩුවීම, පසේ ජලවහනය හීනවීම, වන විනාශය, පාංශු ඛාදනය, කෘමිනාශක හා පොහොර භාවිතය වැනි කාරණා බලපෑමෙන් භූමි හායනය සිදු විය හැකියි. ගස් වැවීම, පාංශු සංරක්ෂණ ක්‍රම යොදා ගැනීම, ස්වාභාවික ක්‍රියාවලි ආරක්ෂා කර ගැනීම, ජෛව විවිධත්වය වර්ධනය හා දේශගුණික විපර්යාස අවම කර ගැනීම ආදියෙන් භූමිය ප්‍රතිෂ්ඨාපනය කළ හැකියි. මෙවර තේමාවේ සඳහන් කාන්තාරකරණය සිදුවන්නේ ශුෂ්ක කලාපවල. විශේෂයෙන් සහරා කාන්තාරයට මායිම් වන උතුරු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, නැගෙනහිර ආසියාව, ඉරානය, ජෝර්දානය, සවුදි අරාබිය, දකුණු තුර්කිය, සිරියාව හා නයිජීරියාව යන රටවල කාන්තාරකරණය ප්‍රබල ව දක්නට ලැබෙනවා."

කාන්තාරකරණය සහ නියඟය වර්තමානයේ ප්‍රබල පාරිසරික ගැටලුවකි. ලෝක කාලගුණ විද්‍යා සංවිධානය 2021 වර්ෂය සඳහා නිකුත් කළ ගෝලීය දේශගුණ තත්ත්වය පිළිබඳ වාර්තාවේ පසුගිය වසර හත ලොව



## පාරිසරික සතිය

මැයි 30 - තිරසර ඉඩම් කළමනාකරණ දිනය
මැයි 31 - වායු දූෂණය හා එහි අහිතකර බලපෑම් අවම කිරීමේ දිනය
ජුනි 01 - ජලය හා ජල මූලාශ්‍ර සංරක්ෂණ දිනය
ජුනි 02 - ජෛව විවිධත්ව සංරක්ෂණ දිනය
ජුනි 03 - පරිසර පවිත්‍ර කිරීමේ දිනය
ජුනි 04 - ප්ලාස්ටික් අපද්‍රව්‍ය කළමනාකරණ දිනය
ජුනි 05 - රුක් රෝපණය හා ජගත් පරිසර දින සැමරුම

වාර්තාගත උණුසුම් ම කාලය ලෙස සඳහන් කර ඇත. එක්සත් ජාතීන්ගේ කාන්තාරකරණය පිටුදැකීමේ සම්මුතිය පෙන්වා දෙන පරිදි වර්තමානයේ පෘථිවි භූමි ප්‍රමාණයෙන් 40%ක් පමණ හායනයට ලක් ව තිබේ. එය ලෝක ජනගහනයෙන් අඩකට සෘජු ව ම බලපෑම් කර ඇති කරන බවත් මෙහි මූල්‍යමය බලපෑම ගෝලීය දළ දේශීය නිෂ්පාදිතයෙන් අඩක් පමණ (ඇමරිකානු ඩොලර් ට්‍රිලියන 44ක්) වන බවත් එහි සඳහන් ය. නියඟය පවත්නා කාල සීමා සැලකීමේදී 2000 වර්ෂයේ සිට මේ දක්වා එය 29%ක වර්ධනයක් පෙන්නුම් කෙරේ. මේ තත්ත්වය 2050 වසර වන විට ලෝක ජනගහනයෙන් 3/4කට බලපෑම් ඇති කළ හැකි බව ද එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන පුරෝකථනය කර ඇත.

සමකයට ආසන්න ව පිහිටා තිබීම හේතුවෙන් නිවර්තන කලාපීය රටක් වන ශ්‍රී ලංකාවට උෂ්ණත්වය වැඩි වුවත් මෝසම් වර්ෂාව ලැබේ. අපේක්ෂිත වර්ෂාපතනයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබීම හේතුවෙන් නියඟ තත්ත්ව ඇති වේ. විශේෂයෙන් 1992, 2001, 2004, 2016 හා 2017 වසරවලදී නියඟයට මුහුණදීමට ශ්‍රී ලංකාවට සිදු විය. මෙවැනි පාරිසරික තත්ත්ව හේතුවෙන් ජල විදුලි නිෂ්පාදනය, කෘෂිකර්මාන්තය වැනි ක්ෂේත්‍ර ගණනාවකට දැඩි බලපෑම් එල්ල වීමෙන් එය සෘජු ව හා වක්‍ර ව රටේ ආර්ථිකය අඩාල කිරීමට හේතු වන බවත් මහාචාර්ය තිලක් හේවාවසම් සඳහන් කරයි.

ශ්‍රී ලංකාවේ ද භූමිය සීඝ්‍ර පිරිහීමකට හා හායනයට තුඩුදෙන ප්‍රධානතම ගැටලු ලෙස හඳුනාගෙන ඇත්තේ වන විනාශය, අවිධිමත් කෘෂිකර්මය, ධාරිතාව ඉක්මවා සිදු කෙරෙන කැණීම් හා අවිධිමත් කසල බැහැර කිරීමෙන් සිදුවන පරිසර දූෂණය ආදියයි. මීට විසඳුම් ලෙස බලපෑමට ලක්වූ භූමි ප්‍රතිසංස්කරණයෙන් යථා තත්ත්වයට පත් කිරීම හා දැනට හානියට පත් නොවී පවතින පරිසර පද්ධති සංරක්ෂණය වැදගත් වේ. ඒ අනුව, දේශගුණික විපර්යාසවලට අනුහුරු වීම, ජීවීන් විශේෂ වඳවී යාමේ තර්ජනයට පිළියම් යෙදීම, ආහාර සුරක්ෂිතතාව ඉහළ නැංවීම, පිරිසිදු පානීය ජලය ලබා ගැනීම සහ ජීවනෝපාය පරිසර හිතකාමී ලෙස වැඩිදියුණු කිරීම අරමුණුකොට ගෙන ශ්‍රී ලංකාව මෙවර ජගත් පරිසර දිනය 'ඵලදායී භූමි පරිහරණයෙන් සුවදායී දෙරණක්' යන තේමාව පෙරදැරි කරගෙන සැමරීමට සූදානම් බව පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් අංජලී කුමාරගම ප්‍රකාශ කරයි.

අදහස් දක්වන ඇය; "පාරිසරික ගැටලු ගෝලීය වශයෙන් පොදුයි. දේශගුණ විපර්යාස පිළිබඳ ලෝකයේ ම අවධානය යොමු වී අවසන්. ගෝලීය ව පරිසරය සුරක්ෂිත කිරීමේ ක්‍රියාවලියට අප වගකීමෙන් බැඳී සිටිනවා. එහිදී අමාත්‍යාංශයක් ලෙස වගකීම තනි ව දැරීමට නොහැකියි. ඒ සඳහා අනෙක් ආයතනවල සහයෝගය සහ ප්‍රජාවගේ සහයෝගය අවශ්‍යයි. ජගත් පරිසර දින සැමරුමෙන් අප බලාපොරොත්තු වන්නේ ගෝලීය වගකීම ඉටු කිරීම සඳහා ජනතාව දැනුවත් කිරීම. මෙවර එහි නිල උත්සවය පැවැත්වෙන්නේ සිංහරාජයේ තුඩව ප්‍රදේශයේදී." මෙවර ජගත් පරිසර දින සැමරුම මෙහි පවත්වන්නට තෝරාගෙන ඇත්තේ ලෝක සංචාරක අවධානය යොමු වී ඇති කලාපයක් ලෙස සිංහරාජ වැසි වනාන්තරය හඳුනාගෙන තිබීම නිසා ය.

ජගත් පරිසර දිනය වෙනුවෙන් පරිසර අමාත්‍යාංශය 'පාරිසරික සතියක්' නම් කර තිබේ. ඒ, 2024 මැයි 30 දින සිට ජුනි 05 දින දක්වා ය. පරිසරයට සෘජු ව හා වක්‍ර ව සම්බන්ධ වන සියලු ම ආයතන ඊට එක් වෙයි. අතිරේක ලේකම්වරිය පෙන්වා දෙන්නේ රාජ්‍ය ආයතන, පාසල්, පෞද්ගලික අංශය, වැවිලි සමාගම් හා වතු ක්ෂේත්‍රය, රාජ්‍ය නොවන සංවිධාන, සිවිල් සංවිධානවල මූලිකත්වයෙන් හා ප්‍රජාවගේ සහභාගිත්වයෙන් එම සතියේදී අදාළ තේමා අනුව පරිසර සංරක්ෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව ය.

මේ සියල්ලෙන් අපේක්ෂා කරන්නේ නිරතුරු ගෝලීය ව්‍යසනයට හේතු නොවන, පරිසරයට සංවේදී වන ප්‍රජාවක් බිහි කර ගැනීමට රටක් වශයෙන් පෙළ ගැසීම ය. එය අනාගත ආයෝජනයක් වනු ඇත.



# සරසවිය බැලූ ඒ.ඩී.

නුවන් කුමාර කටුගම්පල

('දෙසතිය' පුවත් සඟරාවේ ආරම්භක යුගයේ සිට මෑතක් වනතුරු ම එහි විශේෂාංග ලේඛකයකු ලෙස ද ක්‍රියා කළ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී 'සරසවිය' හිටපු කර්තෘ ඒ.ඩී රන්ජිත් කුමාර නොබෝද (මැයි 10) සිය දිවි සැරියෙන් සමු ගත්තේ ය. මේ සටහන ඔහු වෙනුවෙනි.)

දූ දරුවන් පස්දෙනකුගෙන් සැදුම් ලත් පවුලක දෙවැනි දරුවා වූ ඒ.ඩී රන්ජිත් කුමාර ඉපදුණේ ලාංකේය කථානාද සිනමාව ආරම්භ වූ 1947 වසරේ වීම සුවිශේෂත්වයකි. ඔහු, තම ප්‍රතිභාව, දැනුම, ජීවන දර්ශනය, භෞතික උරුම සම්භාරය සිය සුජාත දරුවාට මෙන් ම අධ්‍යයන ලැදි ඕනෑ ම අයකුට නිස්සරණාධ්‍යාශයෙන් ලබා දුන් සිනමා මාධ්‍ය ක්ෂේත්‍රයේ ගුරුවරයකු බඳු ය. උසස් කලා රසඥතාව සහ සජ්ජන බහුශ්‍රැතයන් ඇසුර යන අමෘත ඵලද්වය ම ඔහු භුක්ති විඳ සිය දරුවන්ට ද ඒ භාග්‍යය ලබා දුන්නේ ය.

සෑම කලා මාධ්‍යයක ම සම්භාව්‍ය කෘති රසාස්වාදයෙන් තියුණු රසඥතාවක් සහ පරිචයක් ලද ඔහු අන්‍යයන්ට ද ඒ සඳහා අනුබල දුන්නේ ය. සෑමවිට ම බහුශ්‍රැතයන්, කලා විබුධයන් සේවනය කළේ ය. නිරතුරු ව සුබසින්, අනුභූතිවලින්, තර්ක-විතර්කවලින්, සංවාද-විසංවාදවලින්, සම්භාෂණවලින් ඔහු ප්‍රශස්ත ලෙස සුපෝෂණය විය. ඒ ඥාන ගවේශී ජීවිතය භෞතික වස්තුවලට වඩා ගුණ නුවණෙහි අගය වටහා ගැනීමට යෙදවී ය.

ඔහුගේ නිවසේ මහා පුස්තකාලයක් ඇත. ඔහු පොතක් පතක් නොකියවන සෑම අවස්ථාවක ම ඉපැරැණි, සුමධුර හින්දි චිත්‍රපට ගීතයකට සවන් දෙන අතරතුර කිසියම් ලේඛකයකුගේ පොතක පිටකවරයක් සිතුවම් කළේ ය. නැතිනම් චිත්‍රපටයක නාමාවලියක් අතින් ලීවේ ය. පරිගණක තාක්ෂණයෙහි ආධාරයෙන් පොත් කංචුක හා චිත්‍රපට නාමාවලි නිර්මාණය අද්‍යතනයෙහි අතිශය පහසු වී ඇත. එහෙත් එකල ඒවා ඇඳුණේ ඊට උචිත කාඩ්පතක හෝ වීදුරු තහඩුවක ය. ඔහු, පියසිරි ගුණරත්නගේ 'මොකද වුණේ' (1969) චිත්‍රපටයේ සිට චිත්‍රපට 200ක පමණ නාමාවලි නිර්මාණය කළේත් කරුණාරත්න සපුතන්ත්‍රිගේ 'පව් පඳුරු' (1965) ග්‍රන්ථයෙන් පටන්ගෙන පොත් 300ක පමණ පොත් කම්බ අලංකරණය කළේත් කිසිදු තාක්ෂණික ආධාරකයකින් නොව සිය දෑතින්ම ය. මාර්ටින් වික්‍රමසිංහ, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, ගුණදාස අමරසේකර, කේ. ජයතිලක යනාදී මෙරට ශ්‍රේෂ්ඨ ලේඛකයන්ට පොත් පිටකවර නිර්මාණය කරවා ගැනීමේදී මහගම සේකරට හැරුණු කොට එවක වැඩි ම ඉල්ලුම තිබුණේ ඒ.ඩී.ට ය.


ප්‍රවීන සිනමා මාධ්‍යවේදී ඒ.ඩී. රන්ජිත් කුමාර

ඔහු කීර්තිමත් ආදි ආනන්දීයෙකි. වසර 60ක කාලයක් ආනන්දයේ නිකුත් වන ග්‍රන්ථ හා සමරු කලාප බොහොමයක භාවිත කෙරුණු 'ආනන්දය' අකුරු පෙළ නිර්මාණය කිරීම, ශ්‍රී ලංකාවේ පාසල් සිසුන් තැනූ පළමු කෙටි චිත්‍රපටය වූ 'වෙර' (1965) හා පළමු පාසල් වෘත්තාන්ත චිත්‍රපටය වූ 'නිම්වළල්ල' (1970) නිෂ්පාදනය සඳහා නිර්මාණශීලී සහයෝගය ලබා දී මෙරට පාසල් සිනමා නිර්මාණ ක්ෂේත්‍රයේ බිඳ දැමිය නොහැකි වාර්තාවක් තබන්නට ද ඔහු ප්‍රවීණ චිත්‍රපට අධ්‍යක්ෂ රංජිත් ලාල්ට අත දුන්නේ ය. ආනන්දයේ පන්ති සගයකු වූ ප්‍රවීණ ගේය පද රචක ප්‍රේමකීර්ති ද අල්විස් 1969 දී ඒ.ඩී. ගුවන්විදුලියට හඳුන්වා දුන්නේ ය. ගුවන්විදුලි ළමා පිටියේදී 'දියසායම් තවරා' මැයෙන් ඔහු ලියූ එක ම ගීතය ගායනා කළ ප්‍රවීණ ගායිකා දමයන්ති ජයසූරිය සමග ඔහු විවාහ විය. පසුකලෙක ඔහු කියා තිබුණේ ඇය සමග හාද වීමේ අරමුණින් ම ඔහු ඒ ගීතය ලියූ බවත් එම අරමුණ ඉෂ්ට වූ පසු ගීත ලිවීම නැවැත්වූ බවත් ය.

වසර 77ක ජීවිතයේ වැඩි කාලයක් ඔහු කැප කළේ සිනමාව හා සිනමා පුවත්පත් කලාව වෙනුවෙනි. තිර රචනය, සහය අධ්‍යක්ෂණය, කලා අධ්‍යක්ෂණය, මාධ්‍ය සම්බන්ධීකරණය, නාමාවලි නිර්මාණය, ප්‍රචාරණ දැන්වීම් නිර්මාණය යනාදී විවිධ අංශවලින් ඔහු සිනමාවට දායක විය. 'කොස්ගස්හන්දිය', 'අනුභූතිය හා නිර්මාණය', 'ගාමිණී: හෙළ සිනමාවේ සක්විති', 'රුක්මණී දේවී: යුගයක ස්වර්ණ ගීතය', 'සඳ ළඟ තරු' ඇතුළු ග්‍රන්ථ රාශියක් ලියා පළ කළේ ය.

අද ප්‍රවීණයන් බවට පත් ව සිටින බොහෝ කලාකරුවන් මුලින් ම රට දැන හඳුනා ගත්තේ ඔහු ලියූ ලිපිවලිනි. බොහෝ කලාකරුවන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ වෘත්තියමය ජීවිතයේ සාර්ථකත්වය පසුපස ඔහු අප්‍රසිද්ධියේ රැඳී සිටියේ ය. සම්මානනීය නිළි ස්වර්ණා මල්ලවආරච්චි 'සත්සමුදුර' චිත්‍රපටය (1967) සඳහා නිළි වරම් ලැබීමට සම්මුඛ පරීක්ෂණයට සහභාගී වී ඇත්තේ කොළඹ, කොස්ගස් හන්දිය ගමේ හිතවතකු වූ ඔහුගේ බලකිරීම මත ය. 'නිම්වළල්ල' චිත්‍රපටය (1970) සඳහා චිත්‍රපට ගී පද රචනයට සම්මානිත

මහාචාර්ය සුනිල් ආරියරත්න පාසල් සමයේදී ම හඳුන්වා දී ඇත්තේ ද ඔහු ය. කලණ මිතුරු ආනන්දීයයකු වූ ප්‍රවීණ ගී පද රචක කුලරත්න ආරියවංශ පිළිබඳ මුල් ම මාධ්‍ය ඇගයුම ලබා දීම, ප්‍රවීණ රංගන ශිල්පී රන්ජන් රාමනායකට ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස්ගේ 'අවරගිර' (1987) චිත්‍රපටයේ රඟපෑමට අවස්ථාව සලසා දීම, සුප්‍රකට නිෂ්පාදක විජය රාමනායක, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් වෙත කැඳවාගෙන යමින් 'කලියුගය' (1983) හා 'යුගාන්තය' (1985) බිහි කරන්නට මග පාදා හෙළයේ මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහගේ තුන් ඈඳුතු නවකතා සිනමා කෘති බවට පත්වීමට මග පාදා දීම සිදු කර ඇත්තේ ද ඒ. ඩී. ය. තම ගුරුවරයා වූ ප්‍රවීණ ලේඛක අජිත් තිලකසේන, සම්මානනීය නළු විජය කුමාරතුංගට හඳුන්වා දෙමින් ආචාර්ය ධර්මසේන පතිරාජයන් ලවා 'පාරදිගේ' චිත්‍රපටය නිර්මාණය කිරීමට ප්‍රබල ම සාධකය වී ඇත්තේ ද ඔහු ය.





ඒ. ඩී. බිරිඳ දමයන්ති, පුතු නුවන්, ලේලිය නදී, මුණුපුරු නිරාශ් සහ නිර්වාන් පවුල

ආර්ථික දුෂ්කරතාවලට මුහුණපෑ ප්‍රවීණ සංගීතවේදී සුනිල් සාන්තට නිවසක් ලැබී ඇත්තේ ද 'සුනිල් සාන්තයන්ට උන් හිටි තැන් අහිමිවේද?' යන හිසින් ඔහු පළ කළ ලිපිය නිසා ය. 70 දශකයේ අගභාග යේ මොහිදීන් බෙග් මාස්ටර් පිළිබඳ ඔහු ලියූ ලිපියෙහි ප්‍රතිඵලය වූයේ කලාකරුවන් උදෙසා මහල් නිවාස ඉදිවීමටත් ටවර් රඟහල පදනම පිහිටුවීමටත් මඟ විවර වීම ය. මේ, ඔහුගේ තිරය පිටුපස කලාවේ සුසමාදර්ශීය උදාහරණ දහස් ගණනක් අතරින් අතළොස්සකි.

ප්‍රතිරූප බිඳ දැමීමේ පුවත්පත් කලාව (Iconoclastic Journalism) තරයේ ප්‍රතික්ෂේප කළ ඔහු කලාකරුවන්ගේ ගෞරවය ආරක්ෂා කරමින් ප්‍රතිරූප වර්ධනය කළේ ය. මෙරට විශිෂ්ට කලාකරුවන් ඇතැම් අවස්ථාවාදීන් නිසා විරසක වූ අවස්ථාවලදී ඔවුන් සමගි කිරීමේ සාම නියෝජිතවරයා ද ඔහු විය. ඔහු නොවන්නට මහා රූපණවේදීන් වූ ගාමිණී ෆොන්සේකා හා ජෝ අබේවික්‍රම ද මහා ගායනවේදීන් වූ මහාචාර්ය සනත් නන්දසිරි හා ආචාර්ය වික්ටර් රත්නායක ද සදාතනික පසමිතුරන් වන්නට ඉඩ තිබිණි. ඔහු කලාකරුවන්ට ඇපඋපකාර කොට පෙරළා යමක් බලාපොරොත්තු නොවී ය. මුල අමතක නොකරන, කළගුණ දත් උසස් මිනිසුන් කලාකරුවන් අතර ද අතිශය විරල බව ඔහු මුලසිට ම අවබෝධ කොටගෙන සිටියේ ය.

සිය පුවත්පත් කලා ජීවිතයේ මුල් අඩ මුළුමනින් ම 'සරසවිය' පුවත්පතට සහ 'සරසවිය' සම්මාන උලෙළටත් ඉතිරි අඩ 'සුමති' ටෙලි සම්මාන උලෙළටත් කැප කළ ඔහු පුවත්පත් කලාවේදියකු ලෙස ලේක්හවුස් ආයතනයේ 'සරසවිය' පුවත්පතට එක් වූයේ 1969දී ය. එතැන් පටන් එහි උපකර්තෘ (1970-1979), නියෝජ්‍ය කර්තෘ (1979-1989), ප්‍රධාන කර්තෘ (1989-1994) ලෙස සේවය කළේ ය. ඔහු සිය දරු පවුලට තරමට ම සරසවියට ද ආදරය කළේ ය. රාජකාරියටත් රාජකාරි ආයතනය වූ ලේක්හවුසියටත් ඔහු අප්‍රමාණ ව ගරු කළේ ය. කලක් ඔහු 'දෙසතිය' පුවත් සඟරාවේ විශේෂාංග ලේඛකයකු ද විය. සිනමාකරුවන්, විවිධ කලා ශිල්පීන්, රසික සහෘදයන් මෙන් ම බොහෝ දේශපාලනඥයන් ද ඔහු සමීප ව ඇසුරු කළේ ය. පක්ෂ භේදයකින් තොර ව රාජ්‍ය නායකයෝ සහ දේශපාලනඥයෝ ද ඔහුට ගරු කළහ.

ඔහු රැකියා උසස් වීම් ලැබුවේ ද නිසි සේවා කාල සහ සුදුසුකම් සම්පූර්ණ කොට, පියවරෙන් පියවර ක්‍රමානුකූල ව ඉහළට පැමිණ පෙන්වූ දක්ෂතා, ජ්‍යෙෂ්ඨත්වය, හැකියාව හා පළපුරුද්ද මත ය. තමා ප්‍රධාන කර්තෘවරයා ලෙස තම දරුවකු මෙන් සුපෝෂණය කළ 'සරසවිය' පුවත්පතෙහි සිය පුත්‍රයා ද කර්තෘ ධුරයට පත් වීම ඔහු සිය ජීවිතයේ අවසන් කාලයේ බලවත් සේ සතුටට පත් වූ කරුණකි. පුවත්පත් කලාවේ මේ පිය පුතු ආගමනයේ විශේෂත්වය මෙරට මෙන් ම ලෝක පුවත්පත් ඉතිහාසයේ ද මෙතෙක් කිසිවකු විසින් පිහිටවූ බවට නිශ්චිත සාධක නැති වාර්තාවකි. ආචාර්ය නුවන් නයනජිත් සරසවිය කර්තෘ ධුරයට පත් ව පළමු සරසවිය සම්මාන උලෙළ පැවැත්වූයේ මේ වසරේ ය. එය ස්වාධීන රූපවාහිනියෙන් විකාශය වූ පසුගිය අප්‍රේල් 7 දින ඒ.ඩී. සුජීවත් ව සැමරූ අවසන් ජන්ම දිනය වීම ද එය නරඹා දැඩි සේ තුටුපහටු වීමට ඔහු පුණ්‍යවන්ත වීම ද දෛවෝපගත සිදුවීම් ය.

මුදලින් හෝ වෙනත් කිසිදු ආකාරයකින් කිසිවකුට ණය නොවූ ඔහු රටට ද ණය නැති මිනිසකු ලෙස සැහැල්ලුවෙන් දිවංගත වූයේ අල්පේච්ඡතාව සහ යථාලාභසන්තුෂ්ටිය පරම ධනය කොට ගෙවූ ජීවිතයක අවසන ය. එතැනින් ද ඔහුගේ සේවය නිම නොවී ය. අන්තිම කැමති පත්‍රයෙන් පවුලේ උදවිය ලවා සිය සිරුර කොතලාවල වෛද්‍ය පීඨයට බාර කරවා එය රටේ දරුවන්ට ඉගෙනුම් මෙවලමක් බවට පත් කළේ ය.

# ඒ සිංහබාහු, මේ සිංහබාහු හා සිංහබාහු

SINHABAHU



තුසිත ජයසුන්දර

'සිංහවල්ලි නාඩගම' පවා උත්කර්ෂයට නැංවූයේ 'මහාවංශය'හි සඳහනමයි.

සිරිලක නාට්‍ය වංශයේ අග්‍ර ඵලයක් වන මහැදුරු එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ 'සිංහබාහු' නාටකය 1961 වසරේදී පළමු වරට වේදිකාගත වන්නේ ද උක්ත පසුබිම පිළිබඳ කියැවීම් අවධාරණය කරමිනි. 1962 වසරේදී මුල්වරට ප්‍රකාශිත 'සිංහබාහු' නාටක පිටපතට 'සිංහයා, සුප්පා දේවි හා සිංහබාහු' මැයෙන් අගනා ප්‍රස්තාවනාවක් රචනා කරන සරච්චන්ද්‍රයෝ 'මහාවංශය', 'සියබස් මල්දම', 'සිංහවල්ලි නාඩගම' හා එහි කතු පිලිප්පු සිංඤ්ඤෝ ගැන ද සිංහබාහු පුවත පාදකකොට ගත් හා ඇසුරුකොට ගත් නාඩගම්, නූර්ති හා ගුවන්විදුලි නිර්මාණ ගැන ද විවරණ ඉදිරිපත් කරති.

සිය පියා වූ සිංහයාට දාව මව වන සුප්පා දේවි විසින් බිහිකරනු ලබන නැගණිය වන සිංහ සීවලී සරණපාවාගෙන නව නයුවකු බවට පත්වන සිංහබාහු ගැන හෝ ඔහු පුත් විජයගේ කියුම් කෙරුම් ගැන යම් නිරූපණයකට සරච්චන්ද්‍රයන් 'සිංහබාහු' නාටකයේදී උත්සුක වන බවක් නොපෙනේ. පුත් සිංහබාහුගේ හී සැරයෙන් පියා - සිංහයා මැරී වැටීමත් සමග නාටකය අහවර වෙයි. නැගණිය - සිංහ සීවලීට පෙම් කරන හා ඇගේ ගතේ වෙළෙන්නට අවිඥානක ව වුව පැමිණෙන සිංහබාහුවකු ගෙන හැර පෑමට සරච්චන්ද්‍රයන් පියවර නොගැනීම නිසා ඉන් උපදින අතිමහත් ව්‍යාකූලත්වය හා ව්‍යභිචාර චෝදනාව යටපත් වූ බව පෙනේ.

ව්‍යභිචාරය යනු මෙදවස නව මිනිස් සබඳතා විසින් බැහැර කරනු ලබන්නකි. එහි සදාචාරමය නොඑකඟතාවක් ද සෞඛ්‍යමය නොඑකඟතාවක් ද තිබේ. එසේ වුව ද සැඟවුණු මිනිස් සබඳතාවක් සේ ව්‍යභිචාරය වත්මන් ලොව විෂයෙහි නොපවතින බවක් එක හෙළා ම පැවසිය නොහැකි ය.

සරච්චන්ද්‍රයන්ගේ 'සිංහබාහු' නාටකය දශක සයක් ද ඉක්මවා සිරිලක ජනගත ව ඇත්තේ සිංහබාහු පුවත අනෙකකුගේ නමින් එලෙසින් ම හෝ අන් අයුරකින්



සිරිලක ඇරඹුම හා එහි මුල් සමය සවිස්තර ව දැක්වෙන ඉපැරණි ම ගතක් සේ පිළිගැනෙන්නේ මහාවංශයයි. අනතුරු ව දීපවංශයයි. මේවායේ එන සියලු දෑ සැබෑ ද? යන්න නම් පැනයකි. පසුකාලීන ව හා වත්මනේදී සිදු කළ තාර්කික හා විචක්ෂණශීලී ව්‍යවච්ඡේදන ඔස්සේ විද්‍යමාන වූයේ ද සනාථ වූයේ ද මහාවංශය හා දීපවංශය මත පමණක් ම පාදක වෙමින් සිරිලක ඉතිහාසය විනිවිද දැකීම සුදුසු නොවන බවයි.

මෙහිලා දත හැකි වඩාත් ම විවාදාත්මක සඳහන වනුයේ සිරිලක නිල පළමු රජ තෙමේ සේ හඳුන්වා දෙන විජයගේ පෙළපත ය. ඉන් කියැවෙන්නේ ඔහුගේ පියරජ තෙමේ සිය නැගණිය ආවාහ කර ගත්තකු ය යන්නයි. එසේ ම ඔවුන්ගේ පියා මිනිසකු නොව සිංහයකු වන බවයි.

මහාවංශයට පසු රචිත ලේඛන හා ජනප්‍රවාද මෙකරුණ නොවිමසා



පිළිගන්නට සූදානම් වන සෙයක් ද පෙනේ. මෙහි සංස්කරණයක් හෝ නව පිවිසුමක් සපයා ගන්නට දැරූ නිල වෑයම් නොමැති තරම් ය. 19 වැනි සියවසේ දෙවැනි දශකයේදී පමණ කිරම ධම්මානන්ද හිමියන් විසින් රචිත 'සියබස් මල්දම' හා අනතුරු ව හඳුනා ගැනෙන



වේදිකාවේ නිරූපණයට ප්‍රමාණවත් ඉඩක් ලබා නොදෙමිනි. මෙහෙයින් ම සිරිලක කලාවේ ප්‍රමුඛතම 'සිංහබාහු' නාටකය සේ සරච්චන්ද්‍රයන්ගේ 'සිංහබාහු' තවත් කලක් යන තුරු වේදිකාගත වනු ඇත. පේරාදෙණි සරසවි පසුබිමත් උසස් විභාග ආදිය සඳහා නිර්දේශ කෙරෙන්නක් වීමත් මෙයට ප්‍රබලාකාරයෙන් තුඩුදෙනු ඇත. සරච්චන්ද්‍රයන්ගේ අභාවයෙන් අනතුරු ව ගෙවී යන මෙසමයේදී ද 'සිංහබාහු' නොයෙක් වේදිකාවල රඟ දැක්වෙන වග නොරහසකි.

සිනමාකරුවකු, සිනමා රූපණවේදියකු හා වේදිකා නාට්‍යකරුවකු වූ පතිරාජ එල්. එස්. දයානන්දයන් 1980 වසරේදී 'සිංහබාහු' මැයෙන් සිනමාපටයක් එළි දක්වන්නේ වත්මන් යුගය මත රුඳෙමිනි. ඉපැරණි 'සිංහබාහු' පුවතට නව අරුතක් ගෙන ඒම ඔහුගේ අභිලාෂය වූයේ ද යන්න නම් සැක සහිත ය. මෙහි ද සිංහයා, සුප්පා දේවි, සිංහබාහු හා සිංහ සීවලී දත හැකි වේ. සරච්චන්ද්‍රයන් සේ ම පතිරාජ එල් එස්. දයානන්දයන් ද සිංහබාහු-සිංහ සීවලී ව්‍යභිචාරය විනිවිද දැකීමේ පුළුල් මෙහෙයුමකට අවතීර්ණ නොවූ සැටියකි.

මං පහරන්නකු සහචරයන්ගේ උපකාරයෙන් ධනහිමි පවුලක යුවතියක පැහැරගෙන ගොස් මහවනයේ රඳවා තබන්නේ සිය බිරිය බවට නම්කොට ය. ඉපැරණි පුවතේ අනුව ම මෙහිදී ද ඔවුන්ගේ යොවුන් දරු දෙදෙනා මහා වනයෙන් නික්මී ජන ඇසුරට පැමිණෙති.

මෙසමයේ ප්‍රකට සිනමාකරු සෝමරත්න දිසානායක 'සිංහබාහු' මැයෙන් ගෙන එන්නේ උක්ත නිර්මාණ ද්විත්වයට ම වඩා වෙනස් වූ එසේ ම සමානතා ද සහිත සිනමාපටයකි. සුලබ හා දුලබ ප්‍රචාරක යාන්ත්‍රණ ද හේතුවෙන් මේ 'සිංහබාහු' වෙත ලැබෙන වෙළෙඳ වටිනාකම සැලකිය යුතු තරම් බැව් පෙනී යයි. සිරිලක සිනමාපට සඳහා සැහීමකට පත්විය නොහැකි රසික ප්‍රතිචාර ලැබෙන පසුබිමක 'සිංහබාහු' ලබන මේ ප්‍රතිචාර කැපී පෙනේ. විමසිය යුත්තේ මේවා සාධනීය ප්‍රතිචාර ම වන්නේ ද යන්නයි.

සරච්චන්ද්‍රයන් හා දයානන්දයන් මෙන් නොව සෝමරත්න දිසානායකයන් 'සිංහබාහු' පුවතේ ව්‍යභිචාර නිරූපණය පළමු වටයේදී ම හසුකර ගන්නේ විවෘත අවකාශයක ය. ඔහු මෙකරුණ උද්ධරණයට කිසිදු පැකිළීමක් නොදැක්වීම සිනමාපටයේ ආකර්ෂණීය බව ඔප් නැංවීමට හේතුවක් වී තිබේ. ප්‍රචාරක යාන්ත්‍රණ වෙතින් පවා අවධාරණය කෙරෙන්නේ මෙකරුණ ය. ගැහැනු පිරිමි කායික සබඳතා දෙස තුලනාත්මක ව හා පුළුල් ව බලන්නට ඒ හැටි සූදානමක් නැති සිරිලක වැසියන්ට 'සිංහබාහු' මෙකරුණ අරභයා දක්වන සඳහන එක එල්ලේ ම බලපාන බව පැහැදිලි ය.

සිනමාකරුවා මෙතැනදී පවසන්නේ සිංහබාහු යනු සුප්පා දේවියගේ දරුවකු නොවන බවයි. ඒ සිංහයාගේ අන් බිරියකගේ කුසින් වැදූ දරුවකු ය යන්න ය. සිංහ සීවලී යනු සුප්පා දේවිය යාබද රටක රජකු වෙතින් ලද දියණියයි. මේ අනුව සිංහබාහු හා සිංහ සීවලී එකිනෙකාට පෙම් කිරීම, කායික පහස ලැබීම හා සරණ බන්ධනයට ඇතුළත් වීම සිරිලකවාසීන්ගේ සදාචාරාත්මක දැක්මට බාධකයක් නොවේ.

තමන් එක ම මව්පිය යුවළකගේ දරුවන් නොවන වග සිංහබාහු හා සිංහ සීවලී නිසැක ලෙස ම දන්නා වගක් පැවසීමට සිනමාකරු උනන්දුවක් නොදක්වයි. ඔහු දිගු රූප පෙළකින් පවසන්නේ සිංහබාහු හා සිංහ සීවලී මහවනයේ අතරමංව එක් රැයක් යම් අඳුරු තැනක ගත කළ බවයි. එහිදී ඔවුන්'තර සපුරා ම කායික සබඳතාවක් සිදුවූ බවක් නොපෙනේ. නොසිදුවූ බවට ද සාක්ෂි නොමැත. මෙය ඇසූ සුප්පා දේවි කලබල වන්නේ මන්දැයි යන්න ද රසිකයා දවන ගැටලුවකි.

පරම්පරා ගණනාවක්, වසර දහස් ගණනක් තිස්සේ ඇසූ පුවතක් මෙසේ අන් අයුරකින් සනිටුහන් කිරීම අභියෝගයක් බව දත යුතු ය. අතීත පුවත් නව හා වෙනත් දැක්මකින් විමසූ අවස්ථාහිදී දක්නට ලැබෙන කතිකා මේ මොහොතේ නොපැවතී ම පසුපස ඇත්තේ ම ව්‍යභිචාරය පසෙකලා සිරිලක නිල ඇරඹුම පිරිසිදු කරලීමට සිනමාකරු ක්‍රියා කළ බව අගයන අරමුණු ය.

සරච්චන්ද්‍රයෝ වේදිකාව මත මහා වනයක් ප්‍රතිනිර්මාණය කරති. පාත්‍ර වර්ගයා ද සරසන්නේ ඊට ම උචිත පරිද්දෙනි. සෝමරත්න දිසානායකයන් ද ඊට නොදෙවැනි ය. 'සිංහබාහු' පුවතට අදාළ සැබෑ සමයේ අංගෝපාංග සොයා නොයන හෙතෙම විචිත්‍ර රූපාවලියකින් රසිකයා සන්තර්පණය කරන්නේ කාව්‍යමය ලකුණු සහිත බස් වහරක් ද උපයෝගීකොට ගනිමිනි. මෙය ද සිනමාපටය ජනගත වීමට තුඩු දෙන වග පෙනේ. මෙහිලා සටහන් කෙරෙන රාගී වදන් හා උච්චාරණ විලාස වෙසෙසින් ම යොවුන් රසික පාර්ශ්ව ආලෝලනයට සමත් ය.

සරච්චන්ද්‍රයන්ගේ 'සිංහබාහු' හා සෝමරත්න දිසානායකයන්ගේ 'සිංහබාහු' අතර ඇත්තේ මාධ්‍යයීය වෙනසක් ම නොවේ. දැක්ම විෂයෙහි ද වෙනසක් ඇත. ඒ, මාධ්‍යයීය ප්‍රබලතා හා අනන්‍යතා හඳුනා ගනිමින් සිදු කළ නිර්මාණාත්මක එළැඹුම ද නිසාවෙනි. ජන දිවිය වෙත කළ හා කරන බලපෑමේ ස්වභාවය ද නිසා ය. සිනමාපටයේ බලපෑම පිළිබඳ පුරෝකථනයක් කිරීමේ නොහැකියාවක් නොපවතින හෙයින් මේ නිර්වචනය නිරවද්‍ය වීමට ඇති හැකියාව සුළුපටු නැත.

# GFU
# රූපමය පෙළහර 2

**RHYTHMS OF THE PEOPLES**
**(ජන ලීලා)**

**චානුක දුල්ශාන් ද මැල්**



**ගෙවුණු වසරේ (2023) සමරන්නට යෙදුණු රජයේ චිත්‍රපට අංශයේ 75 වැනි සංවත්සරයට සමගාමී ව ජාතික වැදගත්කමක් දරන චිත්‍රපට නව පරපුර වෙත සමීප කරවීම කාලීන අවශ්‍යතාවක් බව හඳුනා ගත් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව දෙසතිය පුවත් සඟරාවේ ඉදිරි කලාපවලින් එම චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් කෙටි විමසුමක් ගෙන ඒමට සූදනම් බව පෙර දැනුවත් කළෙමු. රජයේ චිත්‍රපට අංශයේ යූටියුබ් නාලිකාවට පිවිසීමෙන් එම චිත්‍රපට නරඹා ඔබගේ රසඥතාව වර්ධනය කර ගැනීමටත් ඉතිහාසය යළි කියවා ගැනීමටත් අපි එහිදී ඔබට ආරාධනා කළෙමු.**


**මේ, චිත්‍රපට පිළිබඳ පසුබිම් කතා ඇතුළත් දෙවැනි කෙටි විමසුමයි**

කාර්තු දෙකක ලාංකේය මානව සබඳතා ගලායාම රිද්මයානුකූල ව ඉදිරිපත් කිරිමට ගත් සාර්ථක වෑයමක් වන්නේ Rhythms of the Peoples වාර්තා සිනමාපටයයි. මෙහි තේමාත්මක අරමුණ වී ඇත්තේ දකුණුලක ජන ගී, නර්තනය හා බැඳි මානව හැසිරීම් රටා රූප රාමුවට හසුකර ගැනීම ය. නව වෙළහෙළඳාම ආරම්භ වන්නේ අවුරුද්දේ මුල් මාසයේයි. එම වෙළෙඳාමේ ගමන් මාර්ගය ගොඩනැගී ඇත්තේ ගං දියෙනුත් ගොඩබිමිනුත් ය. ඒ සඳහා පාරු මෙන් ම කරත්ත කවිය ද ඒ ඒ වෘත්තින්හි අනන්‍යතාව විදහාපායි. ඒ ආකාරයට ගොයම් කවියෙත්, රබන් කවියෙත්, රූකඩ කාව්‍යයෙත් රිද්මයානුකූල අනන්‍යතාව ජන ජීවිතයේ ම කොටසක් බව සනාථ වෙයි. නර්තනයේ රිද්මය හදවතේ ගැස්මයි. එය වෙසක් මාසය පුරා ගැමි ජනතාව සමරති. මෙසේ ලියවෙන්නේ එලෙස සිනමා රූප රාමුවලට හසුකරගත් මානව චර්යාවේ නූතන කියවීමයි.

ඒ අනුව පාරු ජීවිතයේ කාව්‍ය ලාලිත්‍යය, ගමනේ පවස නිවන කරත්ත කවි ලාලිත්‍යය, බත සපයන කමතේ ලාලිත්‍යය, කඩපොළහි රිද්මය, විශ්වාස හා ඇදහිලිවලින් ගම්‍ය වන සංස්කෘතික රිද්මය මේ සිනමාපටය ඔස්සේ කියවා බැලීමට පාඨක ඔබට අවස්ථාව හිමි වේ.

වර්ණ මි.මි 35 කාණ්ඩයේ වාර්තා සිනමාපටයක් වූ මෙය 1961 වර්ෂයේදී රූගත කෙරුණු අතර මිනිත්තු 23ක් ඇතුළත මෙරට සංස්කෘතියේ අල්පමාත්‍රයක සිදුවීම් අඛ්‍යානයක් රූපමය භාෂාවෙන් පෙළගස්වන්නේ ප්‍රඥාසෝම හෙට්ටිආරච්චි ය. ඊට ඉංග්‍රිසි භාෂාවෙන් පසුබිම් කථනය ගළ පන්නේ රෙජී සිරිවර්ධනගේ අදහසකින් ය. ඒ, චලනය වන රූප බණ්ඩවලට ජීවමය ගුණයක් ලබාදෙමිනි. ජන සංගීතය මනා ලෙස හැඩ කර ඇත්තේ කේ. ඒ දයාරත්න ය. සනත් ලියනගේ තෙවැනි ඇසට හසුකරගත් රූප එකට ගළපා ඇත්තේ ආර්. බි අරියවංස ය. ශබ්ද පරිපාලනය එෆ් සේරාගෙනි. එලෙස නිර්මාණ වූ වාර්තා සිනමාපටය 1962 වසරේ Vancouver International Film Festival හා Karlovy Vary International Film Festival හිදී කුසලතා හා ගෞරව සම්මාන හිමි කරගෙන ඇත.








Rhythms of the Peoples වාර්තා සිනමාපටය ලාංකේය ජන ජීවිතයේ ශබ්දය හා රිද්මය පදනම් කරගෙන ජීවන ලාලිත්‍යය කැමරාවට සියුම් ව හසුකර ගන්නේ ඉතාමත් සංයමයකිනි. එය අනාගතයේ මෙරට මානව වංශ කතාව යළි කියවන මානවයාට විශ්වවිද්‍යාලයකි. Rhythms of the Peoples වාර්තා සිනමාපටය රජයේ චිත්‍රපට අංශයේ Youtube නාලිකාවෙන් නැරඹීමට හැකියාව ඇත.







# සිනේ, ටෙලි, වේදිකාවේ පරාක්‍රමය




**ටී එම් ජී චන්ද්‍රසේකර**

පරාක්‍රම නිරිඇල්ල යනු මෙරට සිනේ ටෙලි වේදිකාවේ අවියෝජනීය පෞරුෂයකි. ඔහුගේ කලා, සමාජ, සංස්කෘතික දායකත්වය පිළිබඳ අක්මුල් සොයායාම දුෂ්කර වන්නේ ඔහු නිසඟයෙන් ම උරුම කරගත් මුනිවර චර්යාව නිසයි. ඔහු නිහඬ ය, නිර්මාණාවේශයෙන් යුක්ත ය. පසු නොබසියි. බොහෝ දෑවලදී පූර්වගාමියා වේ. උසස් මානව අපේක්ෂාවලින් යුක්ත ය. කලාවේ බොහෝ නව ඇරඹුම්වල මෙන් ම බෝහෝ චරිතාංග නළුවන් පසුපස සිටි අදෘෂ්‍ය චරිතය ඔහු ය. අමිත්ත ම ප්‍රකාශ කරන පරිදි පරාක්‍රම ඔහුගේ ජීවිතේ ද ගාමක බලවේගයකි. එහෙත් ඔහු කිසිවිටෙකත් කිසිදාක තමා පසසා හෝ කිසිවිටෙක දොස් පවරා නැත. මේ උත්තුංග දේහදාරී මුනිවර චරිතය ගැන සොයාබැලීම මෙරට මෑතකාලීන සිනමා කලා ඉතිහාස කතාවක් ද වනු ඇත.

ඒ භාරදූර කර්තව්‍යයට අත ගසන්නේ අමිත්ත වීරසිංහ නම් රංගනවේදියායි. චරිතාංග නළුවකු ලෙස ඔහු ගොඩනගාගත් ප්‍රතිභාවට අමතර ව නිර්මාණශීලී ලේඛකයකු ලෙස ද ග්‍රන්ථ ගණනාවක් රචනා කර ඇත. පාසල් අවදියේ සිට ම පරාක්‍රමගේ නිර්මාණ කාර්යයට දායකවීමට වරම් ලබමින් ඔහු සිය රංගන ජීවිතය ප්‍රභාමත් කර ගත්තෙකි. අමිත්ත මෙහි චරිත කතාකරුවා වූ පරාක්‍රම නිරිඇල්ල සමග ඇසුරේ ලැබූ අත්දැකීම් හා ජීවිතානුසාරයෙන් ලබාගත් සවිඥාන බවින් ආසක්ත නොවී ඒ දෙස වඩාත් විවෘත ව බැලීමට උත්සාහ දරා ඇත. අමිත්ත සහජයෙන් ම සූර කතාකාරයෙකි. ඔහුගේ කතා රසවත් ය. තාර්කික ය. ඒ සෑම කතාවකට ම ඔහුගේ ම අර්ථකථනයක් ඇත. 'පරාක්‍රමය' ජීවන කතාව හුදු ජීවන අන්දරයකට වඩා මෙරට සිනමාව, රූපවාහිය, වේදිකාව, තිරය පිටුපස වැළලී යා යුතු නොවන කතාන්දරයක් වන්නේ මේ නිසයි. විටෙක එය ශෝකාන්තයකි. තවත් විටෙක එය වීර කාව්‍යයකි. පරාක්‍රමගේ පරමාදර්ශී චර්යා හා ඔහු මුහුණදෙන අභියෝග මෙරට සුන්දර කලාවක් පිටුපස ඇති අඳුරු පැතිකඩ පිළිබඳ ඉඟි ද සපයයි.

ඒ කතාන්දරයෙහි මෙරට වීදිනාට්‍ය කලාවේ ආරම්භය හා විකාශ කතාව තිබේ. ඒ අතර සිදුවන පෙරළිකාර වෙනස්කම් හඳුනාගත හැකියි. වීදිවල, අගුපිල්වල වැරහැලි අඳිමින් ගිය දුෂ්කර රංගන චාරිකාවේ සන්තුෂ්ටිය තිබේ. කෙසේ හෝ නාට්‍යකරුවකු වීමේ තිර අදිටනින් අනේකවිධ දුක්ඛදෝමනස්ස සමග යන ගමනේ ගාමිණී හත්තොටුව ප්‍රමුඛ වීදිනාට්‍ය කණ්ඩායම මුණගැසෙයි. ජී. ඩී. එල් පෙරේරාගේ 'කලා පෙළ', ධම්ම ජාගොඩගේ රංග ශිල්ප ශාලිකාව, ජාතික රූපවාහිනියේ ආරම්භය, ඒකාංක හා ශ්‍රී ලාංකික අනන්‍යතා ඇති ටෙලිනාට්‍ය කලාවක් වැනි බොහෝ ආරම්භක පුරෝගාමී මෙහෙවර හමුවෙයි. දකුණේ වීදි නාට්‍යයේ කෙසග නළුවා එච්. ඒ. පෙරේරා ගැලිලියෝ ලෙස මහා වේදිකාවට නංවයි. උතුරේ කුලන්දෙයි සන්මුගලිංගම්, ස්වාමි විපුලානන්ද වැනි මානව හිතවාදී කලාකරුවන් සමග අත්වැල් බැඳ ගනියි. ජාතික හා අන්තර්ජාතික ඇගයුම් සමග

පරාක්‍රමගේ දේශීය විදේශීය නාට්‍ය පර්යේෂණ, නො-කබුකි වැනි විදේශීය අත්දැකීම් අත්හදාබැලීම් ගෙනහැරපෑමට අමිත්ත ගන්නා උත්සාහය නිසා මේ ජීවනාන්දරය මහගු පර්යේෂණ මූලාශ්‍රයක් වී ඇත.

සිනමාවේ, වේදිකාවේ, රූපවාහිනියේ පරාක්‍රම තැබූ අමරණීය සටහන්හි තිරය පිටුපස ඇති බොහෝ කතා ප්‍රේක්ෂකයකුට වැදගත් නොවන්නක් විය හැකියි. එහෙත් පරාක්‍රම සම්බන්ධයෙන් අමිත්ත ඉදිරිපත් කරන සැබෑ කතාවල ඇති දේ ලෙහෙසියෙන් අමතක කළ හැකි නොවනු ඇත.

මහා වේදිකාවේ පුළුල් තිරයේ ඔහුගේ නිර්මාණ, සම්මාන පිට සම්මාන ලබයි. විටෙක එක ම සෙනසුරාදාවක ඔහුගේ 'සිරිමැදුර' සිනමාපටය සිනමාශාලාවලත් 'යශෝරාවය' රූපවාහිනී තිරයේත් 'උත්තමාවී' නාට්‍ය වේදිකාවේත් ප්‍රදර්ශනය වෙමින් ලෝක වාර්තාවක් තබයි. එසේ වුවත් පරාක්‍රමගේ හිත වඩාත් සන්තුෂ්ටියට පත් කළේ 'ජනකරළිය' බව අමිත්ත හේතු ඇති ව පවසයි.

"පරාක්‍රම මුල් වකවානුවේ සිට ම ජීවිතයේ යම් අරමුණක් කරා සෙමින් නමුදු තිර ව පියමන් කරමින් සිටියේ ය. සමාජයේ දැවෙන ප්‍රශ්න නිසා සසල වූ සිතින් ඔහු නිරතුරු ව ම පසුවන්නට වූයේ ය. ඔහුගේ නාට්‍ය නිර්මාණවල ද චිත්‍රපටවල ද ටෙලිනාට්‍යවල මෙන් ම වෙළෙඳ දැන්වීම්වල පවා මේ පිළිබඳ කතිකාවක නිරත ව සිටියේ ය." (පිට 197)

'ජනකරළිය' ඔහුගේ සැබෑ වූ සිහිනයයි. එය ගොඩ නැගීමට ඔහු ගත් අනේකමය වෙහෙස අමිත්ත වෙසෙසින් ගෙනහැර පායි. එහිදී ඔහුට සීමා මායිම් නැත. වැටකඩොලු නැත. දකුණේ නගරයෙන් නගරයට යන ඔහු උතුරේත් නැගෙනහිරත් යුද ගිනිදැල් අතරත් විසල් නළු නිළි නඩයක් සමග බියෙන් සැකෙන් තොර ව ගමන් කරයි.

"එතැන් සිට ඉච්චලම් පත්තු. සාම්පූර් ආදී ප්‍රදේශවලත් වෙරුගල් ඔය අවට පාසල් ආදියේත් වැඩමුළු කිරීමට, ගුරු පුහුණු වැඩසටහන් කිරීමට ඔවුන්ට හැකියාව ලැබුණි. ඒ සෑම ස්ථානයක ම එල්ටීටීඊ කොඩි දමා සරසා තිබුණි. තෙවැනි දිනයේදී එල්ටීටීඊ නැගෙනහිර පළාත් දේශපාලන නායකයා එළිලන් ඔවුන් හමුවට පැමිණියේ ය. ඔහු ජනකරළිය කණ්ඩායමට මහත් පිළිගැනීමක් ලබා දුන්නේ ය. රාත්‍රී ආහාරය සඳහා ඔහුගේ නවාතැන වෙත කැඳවනු ලැබ නාට්‍ය කණ්ඩායම හමුවේ ඔහු කතාවක් කළේ ය. ඔහු කිවේ තමන් අපේක්ෂා කරන සමාජය මෙවැනි සමාජයක් බවයි. ඔවුන්ගේ සිහිනය වන්නේත් සිංහල, දෙමළ ජාතීන් මේ නාට්‍ය කණ්ඩායමේ එක් ව සිටින ආකාරයට එකමුතු ව වැඩ කිරීම බවයි. (පිට 273)

තැනින් තැන ගෙන යා හැකි ජංගම කුඩාරම, කමත, පිටිය රඟහලක් බවට පත්කර ගනිමින් සෑම තරාතිරමක කෙනකුට ම ළඟා විය හැකි සිංහල, දෙමළ නළු නිළියන්ගෙන් සැදුණු පරාක්‍රමගේ මේ ජනකරළිය විවිධ රටවල පවා ඇගයුමට ලක් විය. වරක් ඉන්දියාවේ කර්ණාටක ප්‍රාන්තයේ බහුරූපි වාර්ෂික නාට්‍ය උත්සවයේ ප්‍රධාන ආරාධිතයා ලෙස පිදුම් ලැබූ අවස්ථාවේ හේතු පාඨයේ මෙසේ සඳහන් ව තිබුණි.

"පරාක්‍රම නිරිඇල්ල වනාහි චතුර්දශකයක් පුරා සාධාරණ හා සංස්කෘතික සමාජයක් නිර්මාණය කිරීමේ දැක්ම සහ පරමාර්ථය ඇති ව කටයුතු කළ මහා පුරුෂයෙකි."

"ජනවාර්ගික ගැටුමේ සන්දර්භය තුළ මෙම ප්‍රවීන කලාකරුවා ක්‍රියා කළ ආකාරය ශ්‍රී ලංකාවේ අනාගත කලාකරුවන්ට පූර්වාදර්ශයක් මෙන් ම අප රටේ සියලු ජනතාවට ද විශිෂ්ට ප්‍රතිරූපයක් ලබා දී තිබේ"

මෙවැනි හේතු මෙන් ම ඔහුගේ නිර්ව්‍යාජ ගමන අන්තර්ජාතික ව ඇගයුමට ලක් විය. යුනෙස්කෝවේ අන්තර්ජාතික නාට්‍ය ආයතනයේ සමාජ වෙනසක් සඳහා වූ රංග භාවිතාව


අමිත්ත වීරසිංහ

නමැති ව්‍යාපෘතියේ ලේකම් ධුරය හිමිවූයේ පරාක්‍රමටයි. යුනෙස්කෝව ජනකරළියේ පහසුකම් සපයන්නකු බවට ද පත්විය. 2013 වසරේ ලෝකයේ සංස්කෘතික ක්‍රියාදාමයන් පිළිබඳ ඇගයුම් තරගයේදී අසියා පැසිපික් කලාපයේ හොඳම රංග කණ්ඩායම් 10 අතරට ජනකරළිය එක් ව තිබුණි. 2016 වසරේ කොළඹ ජාත්‍යන්තර නාට්‍ය උළෙලේදී ජීවිතයට එක්වරක් පමණක් හිමිවන ජනාධිපති සම්මානය ඔහුට හිමි විය. ශ්‍රී ලංකාවේ ජාතික සමගිය සහ එකාබද්ධතාව වෙනුවෙන් ඔහු කළ කැපවීම මේ ඇගයුමට හේතුපාදක වී තිබුණි.

රත්නපුර පළාතේ නිරිඇල්ල ප්‍රභූ පවුලක ඉපිද ඒවා පසෙකලා, වීදියෙන් සිය කලා ජීවිතය අරඹා සිනමාව, වේදිකාව, රූපවාහිනිය ජයගත් පරාක්‍රම නිරිඇල්ල නම් කලාකරුවාගේ මේ ජීවන අන්දරය නව පරපුරට බොහෝ දේ කියා දෙයි. එය අනාගත විද්‍යාර්ථීන්ට උත්ප්‍රේරකයක් මෙන් ම පර්යේෂකයන්ට කෝෂ්ඨ ග්‍රන්ථයක් කරගැනීමට අවශ්‍ය බොහෝ දේ එක්රැස් කර රසවත් ලෙස ඉදිරිපත් කිරීමට අමිත්ත වීරසිංහ ගෙන ඇති ප්‍රයත්නය පැසසිය යුතු ය. ඒබ්‍රහම් ලින්කන් ජනාධිපතිවරයා සිය දයාබර පුත්‍රයාගේ මුල් ගුරුවරයාට යවන ලද ලෝකප්‍රකට ලිපියේ සඳහන් කියමන පරාක්‍රම සිය ඔහුගේ ජීවිතයෙන් ක්‍රියාවට නගා ඇති බැවින්, අමිත්ත වීරසිංහ විසින් රචිත සිනේ ටෙලි වේදිකාවේ-පරාක්‍රම නිරිඇල්ල තීර්ථාවලෝකනය -'පරාක්‍රමය' නම් චරිතාපදානයට පසුවදනක් ලෙස මෙසේ සටහන් කර තබමි.

පරාජය විඳ දරා ගැනීමටත් ජයග්‍රහණය නිහතමානී ව සතුටින් භුක්ති විඳීමටත් මගේ පුතාට උගන්වන්න. ඇතැම් උදවිය ඊර්ෂ්‍යාකාරී ව ඔහු යටපත් කරන්නට ක්‍රියා කරනවිට, ඒවා ගැන කලකිරීමෙන් තොර ව සිටිමින්, යටි සිතින් සිනාසෙන්නට හැකි ශක්තිය, රහස ගැන ඔහුට උගන්වන්න. තමන්ගේ හයිහත්තිය පෙන්වා මිනිසුන් බිය ගන්වන්නට එන අය මේ ලොව පරාජය කිරීමට පහසු ම අය බව ඔහුට අවබෝධ කර දෙන්න. (නොහඳුනන ලින්කන්-ගාමිණී කුමාර විතාන)


චමරි අතපත්තු

# වනිතා විස්කම්

ර. මු. නිශ්ශංක

කාන්තා එක්දින ක්‍රිකට් තරග ඉතිහාසයේ ඉහළ ම සාර්ථක ලකුණු හඹා යාමේ ලෝක වාර්තාව බිහි කිරීමට ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම නොබෝද සමත් විය. 2024 මාර්තු 27 සිට අප්‍රේල් 17 දක්වා පැවැත්වූ තරග තුනකින් සමන්විත ශ්‍රී ලංකා සහ දකුණු අප්‍රිකානු කාන්තා ක්‍රිකට් එක්දින තරගාවලිය තරග 1-1ක් ලෙස ජය පරාජයෙන් තොර ව අවසන් වූ අතර ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම මේ දක්ෂතාව දැක්වූයේ අප්‍රේල් 17 දින දකුණු අප්‍රිකානු කාන්තා ක්‍රිකට් කණ්ඩායමට එරෙහි ව පැවති අවසන් එක්දින තරගයේදීයි.

ලකුණු 302ක ඉලක්කයක් හඹා යාමට පිටියට පිවිසුණු ශ්‍රී ලංකා කාන්තා කණ්ඩායම එක්දින කාන්තා ක්‍රිකට් ඉතිහාසයේ කණ්ඩායමක් වාර්තා කළ ඉහළ ම සාර්ථක ලකුණු හඹා යෑමේ නව ලෝක වාර්තාවකට හිමිකම් කියමින් පන්දු වාර 44.3 කදී කඩුලු 04ක් පමණක් දැවී ලකුණු 305ක් රැස් කර ගනිමින් දකුණු අප්‍රිකාවට එරෙහි ව තරගය ජය ගැනීමට සමත් විය.

චමරි අතපත්තු මෙහිදී පන්දු 139කදී නොදැවී ලකුණු 195ක් වාර්තා කිරීමට සමත් වූවා ය. එම ඉනිම කාන්තා එක්දින තරග ඉතිහාසයේ වාර්තා කළ තෙවැනි ඉහළ ම ලකුණු සංඛ්‍යාව වූ අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් එක්දින තරගයකදී පිතිකාරිනියක් රැස් කළ ඉහළ ම ලකුණු සංඛ්‍යාව ලෙස වාර්තා පොත් අතරට එක් විය.

ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම ලද මේ ජයග්‍රහණයත් සමග ප්‍රසාද ලකුණු දෙකත් හිමි වීමෙන් ICC කාන්තා ශ්‍රේණිගත කිරීම්හි 07 වැනි ස්ථානය දක්වා ඉදිරියට ඒමට ශ්‍රී ලංකා කාන්තා ක්‍රිකට් කණ්ඩායම සමත් විය. 2025 වසරේදී ඉන්දියාවේ පැවැත්වෙන කාන්තා ලෝක කුසලාන එක්දින තරගාවලියට සෘජු ව ඇතුළත් වීමට හැකි වන්නේ කාන්තා එක්දින ශ්‍රේණිගත කිරීම්හි පළමු ස්ථාන 05 අතර සිටින කණ්ඩායම්වලට සහ සත්කාරකත්වය දක්වන රටේ කණ්ඩායමට පමණි. තවත් එක්දින තරග 06කට ඉදිරියේදී ක්‍රීඩා කිරීමට නියමිත ශ්‍රී ලංකා කාන්තා කණ්ඩායමට සෘජු ව 2025 කාන්තා ලෝක කුසලාන එක්දින තරගාවලියට ඇතුළත් වීමට අවස්ථාවක් තිබේ.

මෙවැනි පසුබිමක මෙරට කාන්තා ක්‍රිකට් පසුබිම පිළිබඳ විමසුමට ලක් කිරීම කාලෝචිත වූවකි. ක්‍රිකට් යම්කිසි පංතියකට සීමා වූ ක්‍රීඩාවක් ලෙස හඳුනා ගන්නට හැකි ඉතිහාසයක් අපට ඇත. පසුව එය නගර කිහිපයක, පාසල් කිහිපයක උරුමයක් බවට පත් ව තිබුණු අතර එය ද යම් තරමකට වෙනස් වී තිබේ. සැබවින් ම ක්‍රිකට් ලාංකේය වන්නට නම් එහි ව්‍යාප්ත වීමේ සීමා අතික්‍රමණය කළ යුතු ය. දීපව්‍යාප්ත ව දක්ෂයන් තෝරා ගන්නට මෙන් ම ඊට සමාන පහසුකම් සහිත පරිසරයක් තිබීම ඊට අත්‍යවශ්‍ය වන්නේ ය.

මෙරට කාන්තා ක්‍රිකට් ඒ අවශ්‍යතාව යම් ආකාරයකින් සපුරමින් තිබෙන බව එහි ස්වරූපය සාක්ෂි සපයයි. මේ තත්ත්වය වඩාත් මතු ව පෙණුනේ මොණරාගල චමෝදි ප්‍රබෝධාගේ අවුරුදු 19න් පහළ දස්කම් මතුවීමත් සමග ය. ඇය ක්‍රිකට් ක්‍රීඩාවේ ව්‍යාප්තිය ගැන නොදැන සිටි පුවතක් සමාජය වෙත මුදා හැරියා ය. මීට ප්‍රථම 'සමාන පහසුකම් සහිත පරිසරයක් තිබීම' යන කාරණයේදී ඇය සිටින්නේ සතුටු විය හැකි මට්ටමක නොවේ.

චමෝදිගේ කණ්ඩායමේ සිටි 15 හැවිරිදි ශෂිනි ගිම්හානි ජාතික කණ්ඩායමට ද ක්‍රීඩා කරන මට්ටමට පැමිණ ඇත. ඇය දේවපතිරාජයේ සිසුවියක වන අතර ධීවර පවුලක දියණියක් ය. කුඹුක්කන පාසලේ චමෝදි මෙන් ම දේවපතිරාජයේ ශෂිනි ද ඇතුළු ව මේ වන විට මාතර, වාද්දුව, පොළොන්නරුව, මාතලේ සහ කාන්තා විද්‍යාලවලින් ද ක්‍රීඩිකාවක් රැසක් දක්ෂතා දක්වමින් මතු වන්නේ ලෙදර් බෝල ක්‍රිකට් ක්‍රීඩාව රටේ සෑම අතට ම ව්‍යාප්ත වී තිබෙන නිසා ය.

බොහෝ ජාතික මට්ටමේ ක්‍රීඩිකාවන් ශ්‍රී ලංකාව නියෝජනයට එන්නේ ලෙදර් බෝල් සංස්කෘතිය නොමැති අවදියක ය. චමරි අතපත්තු වැනි ක්‍රීඩිකාවක් ගොකරැල්ල, ඉබ්බාගමුව පාසල්වලින් ශ්‍රී ලංකාවට පමණක් නොව ජාත්‍යන්තරයට ම ලැබුණු දායාදයකි. එහෙත් ඇය මතු වන ඉතිහාසය ගත් විට එම ප්‍රදේශවලට පිරිමි සඳහා හෝ ලෙදර් බෝල් ක්‍රිකට් ක්‍රීඩා සමීප වී තිබුණේ නැත.

චමරි මුල් අවදියේ ඇයට පැවති චිත්ත ධෛර්යය සමග පිරිමි ක්‍රීඩා සමාජවල සාමාජිකයන් සමග පවා පුහුණුවෙමින් සිය කුසලතා වැඩිදියුණු කර ගන්නට ක්‍රියා කර තිබෙන බව දැකි ය හැකි ය. එවැනි ම අවස්ථාවක් චමෝදිට සහ ශෂිනිට ද ලැබෙනු ඇත. කුඹුක්කන මෙන් ම දේවපතිරාජයේ ද පිරිමි සහ කාන්තා කණ්ඩායම් එක් ව ක්‍රීඩා කිරීම අතිරේක බලයක් ඔවුන්ට හමුවන අවස්ථාවකි.

එහෙත් ඒ අනුව කාන්තා විද්‍යාලවල ක්‍රිකට් පහළ මට්ටමක තැබිය යුතු නොවේ. හර්ෂිතා මාධවී මේ වන විට ශ්‍රී ලංකාව සතු විශ්වසනීය ම පිතිකාරිනියක වී ඇත. අනාගතයට විශාල වටිනාකමක් එකතු කරන ගම්පහ රත්නාවලී බාලිකාවේ විශ්මි ගුණරත්න ද එවැන්නියකි. රත්නපුර සුමනා බාලිකාවේ හංසිමා කරුණාරත්න මෙන් ම ශ්‍රී ලංකා 19න් පහළ බාලිකා කණ්ඩායමේ නායිකා මනුදි නානායක්කාර ගත්තත් ඔවුන්ගේ ක්‍රිකට් පෝෂණය සිදු වී ඇත්තේ සහ සිදු වන්නේ ද බාලිකා පාසල් ඇසුරේ ය.

ඔවුන්ට දක්ෂතාවලින් ඉදිරියට පැමිණෙන්නට පරිපාලනය ලබා දුන්






වෘත්තීය ගෞරවය සහ වාණිජමය වටිනාකම ද නිසා එහි රැඳී සිටීම ස්ථිර ව කළ හැකි මට්ටමට මනස හැඩ ගැසිණි. විවිධ වයස් කාණ්ඩ ඔස්සේ තරග පැවැත්වීමත් ජාත්‍යන්තර වශයෙන් ජාතික කණ්ඩායමට මෙන් ම කනිටු කණ්ඩායම්වලට ක්‍රීඩා කරන්නට ඇති අවස්ථා පුළුල් කිරීමත් මත මේ වන විට ශ්‍රී ලංකාව සතු වන්නේ දක්ෂතා පිරි කාන්තා ක්‍රිකට් කණ්ඩායමකි.

කිසිවකු නැතත් චමරිගේ පිත්ත කතා කළහොත් ඕනෑ ම කණ්ඩායමකට චමරිගේ ශ්‍රී ලංකා කණ්ඩායම ඉක්මවා යන්නට පහසු නැත. චමරි නිහඬ මොහොතක තරගය ශ්‍රී ලංකාවෙන් ගිළිහෙන තත්ත්වය බොහෝ සෙයින් අඩු කර ගැනීමට හර්ෂිතා මාධවී, විශ්මි ගුණරත්න, නිලක්ෂි ද සිල්වා, කවීශා දිල්හාරි, හසිනි පෙරේරා, හංසිමා කරුණාරත්න වැනි ක්‍රීඩිකාවෝ හොඳින් පිත්ත හැසිරවූහ.

පන්දු යැවීමේදී සුගන්ධිකා කුමාරි, ඉනෝකා රණවීර, කවීශා දිල්හාරි, ඉනෝෂි ප්‍රියදර්ශනී මෙන් ම උදේශිකා ප්‍රබෝධනී ද චමරි අතපත්තු ද පිතිකරුවන්ට බලවත් තර්ජනය වන අවස්ථා හුරුපුරුදු අත්දැකීමකි. මේ සියල්ලට හේතුව ඔවුන්ගේ ක්‍රිකට් ජීවිතය ගැන ඔවුන්ට තිබෙන ස්ථාවර විශ්වාසයයි. එයට වෘත්තීමය විශ්වාසය සහ ආරක්ෂාව වැදගත් ය.

දෙවැනි පෙළ ඔස්සේ සම්බන්ධ වෙමින් සිටින විශ්මි, ශෂිනි වැනි ක්‍රීඩිකාවන් අතරට මනුදි නානායක්කාර, නෙත්මි සේනාරත්න මෙන් ම චමරි අත්පත්තු හැඩයේ තුන් ඉරියව් ක්‍රීඩිකාවක් විය හැකි දෙව්මි විහංගා වැනි ක්‍රීඩිකාවන් ද ජාතික තලයට පිවිසෙන්නට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇත. ඔව්හු සිය ජ්‍යෙෂ්ඨ ක්‍රීඩිකාවන් ඉකුත් සමයේදී නවසීලන්තය, එංගලන්තය මෙන් ම දකුණු අප්‍රිකාව වැනි රටවලට එරෙහි ව ලබා ගත් ජයග්‍රහණ ආකාරයට ම ඔස්ට්‍රේලියාව, එංගලන්තය වැනි රටවලට එරෙහි ව ජයග්‍රහණ වාර්තා කළහ. ඒ නිසා වඩාත් විධිමත් සැලසුමකට අනුව කාන්තා ක්‍රිකට් ක්‍රියාත්මක වෙමින් පවතින මොහොතක, කාලයක් ඇති කර ගත් අත්දැකීම් හා පහසුකම්වල තත්ත්වය උසස් වීම්, අධීක්ෂණයේ තිබෙන වගකීම මෙන් ම පුහුණු කාර්ය මණ්ඩලයේ උනන්දුව සහ ක්‍රීඩිකාවන්ගේ කැපවීම ද නිසා ශ්‍රී ලංකාවේ කාන්තා ක්‍රිකට් ලෝක මට්ටමෙන් යම් ස්ථාවර මට්ටමකට පැමිණ ඇත. චමරි අතපත්තු වැනි අත්දැකීම් සහ හැකියාව පිරුණු ක්‍රීඩිකාවක සමග ඊට වසර ගණනක් වයසින් පහළ විශ්මි සහ ශෂිනි වැන්නන් ද සිටින කාන්තා ක්‍රිකට් යනු අහම්බයක් නොවන සැලසුමක ප්‍රගතිය පෙන්වන ක්‍රියාවලියක් ය.

ක්‍රිකට් ක්‍රීඩාවේ විකාශය ධනාත්මක දෙසට යොමු කෙරුණු වගකීම් සහගත බවින් මොහොතින් මොහොත පොහොසත් වූවක් බව ක්‍රිකට් ක්‍රීඩාවට ගම සම්බන්ධ වන හැඩයෙන් ම හඳුනාගත හැකි ය.

එසේ ම විවිධ තරගාවලි ඔස්සේ ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් සමග පැහෙන දෙවන පෙළක් ද නිර්මාණය වෙමින් ඇත. ජාතික කණ්ඩායමේ සිටින ජ්‍යෙෂ්ඨ ක්‍රීඩිකාවන්ට නොලැබෙන අන්දමේ ලෙදර් බෝල් ක්‍රිකට් ගැන ගම් මට්ටමේ සිට ලැබෙන අත්දැකීම අතිශයින් වැදගත් ය. සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ආවරණය වන පරිදි ක්‍රිකට් ගම් මට්ටමට විහිදෙමින් පවතින මොහොතක සහ ඒවා ඉහළ මට්ටමේ අධීක්ෂණයකින් නියාමනය වන තත්ත්වයක ක්‍රිකට් වැදගත් පියවරක් තබමින් ඇත. එය ස්ථාවර ස්වභාවයක් පෙන්නුම් කරන්නේ ය. විශේෂයෙන් ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ ආරක්ෂාව තරමට ම මේ වැඩසටහන්වලට දේශීය වශයෙන් අත පෙවීම් සිදු කිරීම ද අවම වන තරමට පවතින තත්ත්වය ආරක්ෂා සහිත ව ඉදිරියට ගමන් කරනු ඇත. විශේෂයෙන් සිහි තබා ගත යුතු වැදගත් ම කාරණය වන්නේ පුද්ගල මාරුවීම් සමග වෙනස් නොවන සංස්කෘතියක් බවට ක්‍රිකට් වෙනුවෙන් විහිදෙමින් තිබෙන මේ වැඩපිළිවෙළ පත්වීම ය.



# සයුරේ නිහඬ ගීතය

කාංචනා සිරිවර්ධන

'Awaken New Depths' යන්න තේමා කර ගත් 2024 ලෝක සාගර දිනය ජුනි 08 දිනට යෙදී තිබේ. ඒ වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය ලෝක නායකයන්, විද්‍යාඥයන්, පෞද්ගලික අංශයේ විධායකයන්, සිවිල් සමාජය, ප්‍රසිද්ධ පුද්ගලයන් සහ තරුණ ක්‍රියාකාරකයන් සමග එක් ව අපගේ සාගර සබඳතාවට අවශ්‍ය වන්නේ කුමක්ද ? එය පවත්වාගෙන යා යුත්තේ කෙසේ ද යන්න ලෝකයට පෙන්වා දීමට ක්‍රියා කරයි.

මේ දිනය සැමරීමේ අරමුණ වන්නේ මිනිස් ක්‍රියාකාරකම්වලින් සාගරයට සිදු වන බලපෑම පිළිබඳ ලෝකය දැනුවත් කිරීම, සාගරය සඳහා ලෝක ව්‍යාප්ත ව්‍යාපාරයක් වර්ධනය කිරීම, සාගරයේ තිරසර කළමනාකරණය සඳහා වන ව්‍යාපෘතියක් සඳහා ලෝක ජනගහනය බලගැන්වීම සහ එක්සත් කිරීම ය.

2030 වසර වන විට මිලියන 40ක ජනතාවක් සාගර ආශ්‍රිත කර්මාන්ත සිය ජීවිකාව කරගන්නා බවට ඇස්තමේන්තු කර තිබීමෙන් ම සාගරය ලෝකවාසීන්ගේ ආර්ථිකයට ලබාදෙන ප්‍රබල පිටිවහල පිළිඹිබු වේ. සාගරයේ මත්ස්‍ය ගහනයෙන් 90%ක් ක්ෂය වී ඇති අතර කොරල්පරවලින් 50%ක් විනාශ වී තිබීමෙන් පෙනී යන්නේ අප නැවත පිරවිය හැකි ප්‍රමාණයට වඩා වැඩි ප්‍රමාණයක ස්වාභාවික සම්පත් පරිභෝජනයකට දැනටමත් සාගරය යොදාගෙන ඇති බව ය. එබැවින් සාගරය සමග නව සමතුලිතතාවක් ඇති කරගැනීමට ලෝකය එක් ව ක්‍රියා කළ යුතු ය.


දෙසතිය පුවත් සඟරාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයක්

www.dgi.gov.lk www.news.lk

පුවත් සඟරාවක් ලෙස ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත

Department of Government Information
news.lk
GFU Sri Lanka

Rs. 100/-